# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report

# 2015



අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2015

අධ්‍යාපන අමාත්‍යාංශය

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදි.

2016 මැයි


නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

අධ්‍යාපන ලේකම්ගේ පණිවිඩය ...

ශ්‍රී ලංකාවේ සෑම දරුවෙකුට ම ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම යන මුඛ්‍ය අභිමතාර්ථය සාක්ෂාත් කරලීම උදෙසා රජයේ ප්‍රතිපත්තීන්ට අනුව ක්‍රමෝපායික සංවර්ධන සැලසුම් ඔස්සේ 2015 වර්ෂය තුළ ඉටුකරන ලද කාර්යභාරය ඇතුළත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2015 සතුටින් ඉදිරිපත් කරමි.

2015 දී පැවති ගෝලීය තිරසර සංවරධන සමුළුවේ දී ශ්‍රී ලංකාව ඇතුළු රටවල් එකඟ ව ඇති "සැමට ගුණාත්මක සම අධ්‍යාපන අවස්ථා අන්තර්කරණ ප්‍රවේශයක් තුළ සහතික කිරීම මෙන් ම යාවජීව ඉගෙනුම ප්‍රවර්ධනය සඳහා අවස්ථා සැපයීම" යන ඉලක්කය 2030 වර්ෂය වන විට සපුරා ගැනීම සඳහා විශාල කාර්යභාරයක් ඉටුකිරීමේ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.මෙම ගෝලීය ඉලක්ක හා සමගාමී ව ජාතික මට්ටමේ හඳුනා ගනු ලැබ ඇති ඉලක්ක සපුරා ගනිමින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ඉහළ නැංවීමෙහිලා 2015 වර්ෂය තුළ සාධනීය පියවර රැසක් ගනු ලැබූ අතර ඒ පිළිබඳ විස්තර මෙම ප්‍රකාශනයේ ඇතුළත් වේ.

නව රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද දින 100 වැඩසටහනෙහි ඉලක්ක සාර්ථක ව සපුරා ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයට හැකි වූ අතර විශේෂයෙන් ම අධ්‍යාපනය සඳහා ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% දක්වා ක්‍රමයෙන් වැඩිකිරීමට රජය ගනු ලැබූ ප්‍රතිපත්තියට අනුව 2016 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට විශේෂ ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට හැකිවීම අප ලද ජයග්‍රහණයකි.

වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලාව සංශෝධනය කර ක්‍රියාත්මක කිරීමටත් නවීන පහසුකම් සහිත පාසල් තුළින් නවීකරණය වූ අධ්‍යාපන ප්‍රවේශයක් තහවුරු කරමින් පවතින සියලු විෂමතා අවම කර සෑම ප්‍රදේශයක ම දරුවන්ට හොඳ පාසල් ලබා දීම අරමුණු කරගත් "ළඟ ම පාසල හොඳ ම පාසල" වැඩසටහන ආරම්භ කිරීමටත් මෙම වසර තුළ හැකිවිය. සියලු දරුවන් පාසල් ගත කොට වසර 13ක අනිවාර්ය අධ්‍යාපනයක් ලබා දීම තහවුරු කිරීමට මෙන්ම පාසලින් පිටවන සියලු ම දරුවන් රැකියාභිමුඛ, ඵලදායී වැඩිදුර අධ්‍යාපනයකට යොමු කරලීම සහතික කිරීම උදෙසා අදාළ අනෙකුත් අමාත්‍යාංශ සමගින් ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමෙහිලා සියලු පාර්ශ්ව හා එක් ව මූලික සාකච්ඡා පවත්වා ඵලදායී ක්‍රියාදාමයක් ආරම්භ කිරීමට පසුගිය වසරේ කටයුතු කරන ලදි.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අමතර ව සංස්කෘතික අංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන කිහිපයක් ම අධ්‍යාපන අමාත්‍යාංශයට 2015 වර්ෂයේ පැවරුණු අතර එම ආයතනවල කාර්යයන් විධිමත් කිරීමට හා නියාමනය කිරීමට විශේෂ වැඩසටහන් දියත් කරන ලදි.

ඩබ්.එම්.බන්දුසේන

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2015.12.31 දිනට)

**අධ්‍යාපන අමාත්‍ය**

ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා

**රාජ්‍ය අමාත්‍ය**

ගරු වී. රාධක්‍රිෂ්ණන් මැතිතුමා

**අධ්‍යාපන ලේකම්**

ඩබ්.එම්. බන්දුසේන මහතා

**සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය**

අතිරේක ලේකම් - එස්.යූ. විජේරත්න මයා

**අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය**

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මයා

**අධ්‍යාපන සේවා ආයතන අංශය**

අතිරේක ලේකම් - අයි.එම්.කේ.බී. ඉලංගසිංහ මයා

**ප්‍රසම්පාදන ඉදිකිරීම් හා පාසල් සැපයීම් අංශය**

අතිරේක ලේකම් - එස්.පී. ජයතුංග මිය

අතිරේක ලේකම් - එල්.ඒ. අසෝක සිරිවර්ධන මයා

**පාසල් කටයුතු අංශය**

අතිරේක ලේකම් - ඒ.එස්. හේවගේ මයා

**පාලන අංශය**

අතිරේක ලේකම් - ජී.එල්.එස්. සේනාධීර මයා

**මූල්‍ය අංශය**

ප්‍රධාන මූල්‍ය නිලධාරී - එච්. සී. ප්‍රනාන්දු මිය

# පටුන


## 01. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

| | | |
|---|---|---|
| දැක්ම | | 01 |
| මෙහෙවර | | 01 |
| 1.1 | අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම | 01 |
| 1.2 | අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය | 02 |
| 1.3 | අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන | 03 |

## 02. ජාතික අධ්‍යාපන සංවර්ධන අභිමතාර්ථ, උපාය මාර්ග හා ඉලක්ක

| | | |
|---|---|---|
| 2.1 | මධ්‍ය කාලීන සංවර්ධන අභිමතාර්ථ, උපායමාර්ග හා ඉලක්ක | 07 |
| 2.2 | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2013 - 2017 | 09 |

## 03. මූල්‍යකරණය

| | | |
|---|---|---|
| 3.1 | 2015 වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් සඳහා මූල්‍යකරණය | 11 |
| 3.2 | ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍යකරණය | 12 |
| 3.3 | දේශීය හා විදේශ ආධාර ආයෝජන | 13 |
| 3.4 | දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකු ආධාර | 13 |
| 3.5 | දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම | 15 |
| 3.6 | අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - ආසියානු සංවර්ධන බැංකු ආධාර | 17 |
| 3.7 | UNICEF ආධාර ලද වැඩසටහන් | 18 |
| 3.8 | JICA ආධාර ලද වැඩසටහන් | 19 |
| 3.9 | GIZ ආධාර ලද වැඩසටහන් | 19 |

## 04. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගීත්වය සහතික කිරීම

| | | |
|---|---|---|
| 4.1 | පාසල් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන | 21 |
| 4.2 | පිරිවෙන් අධ්‍යාපනය | 23 |
| 4.3 | නොවිධිමත් අධ්‍යාපනය | 24 |
| 4.4 | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය | 25 |
| 4.5 | ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් | 26 |
| 4.6 | පාසල් පෝෂණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන | 27 |

## 05. ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලි සඳහා දායකත්වය

| | | |
|---|---|---|
| 5.1 | ප්‍රාථමික අධ්‍යාපනය | 29 |
| 5.2 | ගණිත අධ්‍යාපනය | 29 |
| 5.3 | විද්‍යා අධ්‍යාපනය | 30 |
| 5.4 | අ.පො.ස. ( උ.පෙළ) තාක්ෂණවේදය | 33 |
| 5.5 | ගෘහ ආර්ථික විද්‍යා අධ්‍යාපනය | 34 |
| 5.6 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය | 35 |
| 5.7 | ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය | 37 |
| 5.8 | ද්විභාෂා හා ත්‍රෛභාෂා අධ්‍යාපනය | 37 |
| 5.9 | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය | 38 |
| 5.10 | වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය | 38 |
| 5.11 | කෘෂිකර්මය හා පරිසර අධ්‍යාපනය | 39 |
| 5.12 | ආගමික හා සාරධර්ම අධ්‍යාපනය | 40 |

5.13 විෂය සමගාමී ක්‍රියාකාරකම්,ශිෂ්‍ය උපදේශනය හා සාම අධ්‍යාපනය 40
5.14 සෞන්දර්ය අධ්‍යාපනය 41
5.15 පාසල් පුස්තකාල සංවර්ධනය 42
5.16 ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩාව 43

06. අධ්‍යාපන වෘත්තීය සේවාවන් බලගැන්වීම

6.1 ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම 45
6.2 ගුරු අධ්‍යාපනය සහ ගුරු සංවර්ධනය 45
6.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවය 46
6.4 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය 47
6.5 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය 47
6.6 අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් 47
6.7 මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 48

07. සැලසුම්කරණය හා කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සවිබල ගැන්වීම

7.1 ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය 49
7.2 විදේශාධාර වැඩසටහන් සම්බන්ධීකරණය හා ප්‍රතිඵල ඇගයීම 49
7.3 ප්‍රමිතිපාදක පාසල් ඇගයීම් ක්‍රියාවලිය 50
7.4 පෞද්ගලික පාසල් කටයුතු විධිමත් කිරීම 51
7.5 සැමට අධ්‍යාපන ඉලක්ක සපුරාගැනීම කරා යොමු වූ ප්‍රවේශ 51
7.6 අධ්‍යාපන පර්යේෂණ ප්‍රවර්ධනය 51
7.7 අධ්‍යාපන නියාමනය ශක්තිමත් කිරීම 52

08. මූල්‍ය ආයෝජනය සහ වියදම්

8.1 පුනරාවර්තන වියදම් 53
8.2 ප්‍රාග්ධන වියදම් 54
8.3 සමස්ත අධ්‍යාපන වියදම 55
8.4 ඉදිකිරීම් සඳහා ආයෝජනය 56
8.5 ලී බඩු උපකරණ සඳහා ආයෝජනය 57

09. ශිෂ්‍ය සාධනය

9.1 පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය 59
9.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය 59
9.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය 60
9.4 ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග 60

10. සංස්කෘතික අංශයට අයත් ආයතන

10.1 ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය 61
10.2 ජනකලා කේන්ද්‍රය 62
10.3 කලා මණ්ඩලය 62

ඇමුණුම්

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2006 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| **පාසල් (a)** | | | | | | | |
| රජයේ පාසල් සංඛ්‍යාව | 9,714[t] | 9,685 | 9,731 | 9,905 | 10,012 | 10,121 | 10,144 |
| පාසල් වර්ගය අනුව (b) | | | | | | | |
| 1ඒබී පාසල් | 659 | 716 | 716 | 753 | 868 | 959 | 1,004 |
| 1සී පාසල් | 1,854 | 2,005 | 2,027 | 2,013 | 1,910 | 1,852 | 1,801 |
| 2 වර්ගයේ පාසල් | 4,225 | 4,094 | 4,045 | 3,869 | 3,730 | 3,603 | 3,462 |
| 3 වර්ගයේ පාසල් | 2,976 | 2,870 | 2,943 | 3,270 | 3,504 | 3,707 | 3,877 |
| පන්ති පරාසය අනුව | | | | | | | |
| ප්‍රාථමික පන්ති පමණක් | 2,486 | 2,508 | 2,611 | 2,991 | 3,299 | 3,558 | 3,704 |
| 1 ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා | 490 | 362 | 332 | 271 | 205 | 150 | 173 |
| 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 4,199 | 4,069 | 4,024 | 3,853 | 3,706 | 3,587 | 3,442 |
| 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 2,213 | 2,375 | 2,397 | 2,330 | 2,240 | 2,187 | 2,165 |
| 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා | 27 | 22 | 21 | 24 | 24 | 21 | 20 |
| 6 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා | 299 | 349 | 346 | 436 | 538 | 618 | 640 |
| පරිපාලන අධිකාරිය අනුව | | | | | | | |
| ජාතික පාසල් | 324 | 340 | 342 | 342 | 350 | 351 | 352 |
| පළාත් පාසල් | 9,390 | 9,345 | 9,389 | 9,563 | 9,662 | 9,770 | 9,792 |
| ඉගැන්වීමේ මාධ්‍ය අනුව | | | | | | | |
| සිංහල පමණක් | 6,435 | 6,390 | 6,312 | 6,368 | 6,355 | 6,388 | 6,389 |
| දෙමළ පමණක් | 2,804 | 2,783 | 2,808 | 2,914 | 2,949 | 2,982 | 3,018 |
| සිංහල හා දෙමළ | 38 | 45 | 60 | 39 | 60 | 53 | 39 |
| සිංහල හා ඉංග්‍රීසි | 298 | 327 | 371 | 403 | 446 | 495 | 504 |
| දෙමළ හා ඉංග්‍රීසි | 110 | 106 | 138 | 152 | 164 | 166 | 160 |
| සිංහල,දෙමළ හා ඉංග්‍රීසි | 29 | 34 | 42 | 29 | 38 | 37 | 34 |
| පිහිටීම අනුව (c) | | | | | | | |
| නාගරික | N/A | 951 | 1,043 | 1,071 | 1,078 | 1,116 | 1,140 |
| ග්‍රාමීය | N/A | 8,734 | 8,688 | 8,834 | 8,934 | 9,005 | 9,004 |
| ශිෂ්‍ය සංඛ්‍යාව අනුව | | | | | | | |
| 1 - 50 | 1,549 | 1,590 | 1,609 | 1,652 | 1,614 | 1,572 | 1,515 |
| 51 - 500 | 5,872 | 5,867 | 5,892 | 5,990 | 6,104 | 6,247 | 6,291 |
| 501 - 2500 | 2,157 | 2,041 | 2,033 | 2,069 | 2,094 | 2,103 | 2,140 |
| 2501 - 5000 | 132 | 178 | 186 | 183 | 187 | 185 | 184 |
| 5000ට වැඩි | 4 | 9 | 11 | 11 | 13 | 14 | 14 |
| පෞද්ගලික පාසල් සංඛ්‍යාව (d) | 69 | 72 | 73 | 73 | 78 | 78 | 78 |
| විශේෂ පාසල් සංඛ්‍යාව (e) | 24 | 26 | 25 | 25 | 25 | 25 | 25 |
| පිරිවෙන් සංඛ්‍යාව | 653 | 719 | 720 | 734 | 734 | 747 | 749 |
| **ගුරුවරුන් (a)** | | | | | | | |
| රජයේ පාසල්වල ගුරුවරුන් සංඛ්‍යාව | 204,908[t] | 214,562 | 219,886 | 223,333 | 226,983 | 232,993 | 236,988 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | | |
| ස්ත්‍රී | 145,485 | 152,717 | 157,279 | 160,544 | 163,860 | 168,642 | 172,536 |
| පුරුෂ | 59,423 | 61,845 | 62,607 | 62,789 | 63,123 | 64,351 | 64,462 |
| සුදුසුකම් අනුව | | | | | | | |
| උපාධිධාරී | 68,578 | 78,336 | 80,943 | 86,751 | 90,515 | 96,200 | 99,004 |
| වෘත්තීයමය සුදුසුකම් සහිත (f) | 52,742 | 48,692 | 50,110 | 51,814 | 56,593 | 70,123 | 71,448 |
| වෘත්තීයමය සුදුසුකම් රහිත | 15,836 | 29,644 | 30,833 | 34,937 | 33,922 | 26,077 | 27,556 |
| පුහුණු ගුරුවරු (g) | 128,867 | 126,652 | 128,700 | 128,152 | 129,686 | 131,622 | 132,952 |
| නුපුහුණු / අභ්‍යාසලාභී / වෙනත් | 7,453 | 9,574 | 10,243 | 8,430 | 6,782 | 5,171 | 5,042 |

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශකය | 2006 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| වෘත්තීයමය සුදුසුකම් සහිත ගුරුවරු ප්‍රතිශතය (h) | 90 | 82 | 81 | 81 | 82 | 86 | 86 |
| ගුරු ශිෂ්‍ය අනුපාතය | 19 | 18 | 18 | 18 | 18 | 18 | 17 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව | 17 | 18 | 18 | 18 | 18 | 18 | 19 |
| ගුරු විද්‍යාල සංඛ්‍යාව | 10 | 9 | 9 | 9 | 9 | 9 | 9 |
| **ගුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව** | 100 | 102 | 104 | 104 | 105 | 105 | 105 |
| **ශිෂ්‍යයින් (a)** | | | | | | | |
| රජයේ පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 3,836,550[t] | 3,940,072 | 3,973,847 | 4,004,086 | 4,037,157 | 4,078,037 | 4,129,534 |
| ස්ත්‍රී පුරුෂ භාවය අනුව | | | | | | | |
| ස්ත්‍රී | 1,921,951 | 1,988,917 | 2,005,015 | 2,018,803 | 2,035,317 | 2,057,471 | 2,084,165 |
| පුරුෂ | 1,914,599 | 1,951,155 | 1,968,832 | 1,985,283 | 2,001,840 | 2,020,566 | 2,045,369 |
| ප්‍රධාන ඉගෙනුම් මාධ්‍ය අනුව | | | | | | | |
| සිංහල | 2,794,959 | 2,875,283 | 2,895,475 | 2,920,720 | 3,006,262 | 2,982,715 | 3,022,072 |
| දෙමළ | 999,615 | 1,007,449 | 1,016,602 | 1,020,008 | 1,030,895 | 1,025,068 | 1,031,295 |
| ද්විභාෂා (w) | 41,976 | 57,340 | 61,770 | 63,358 | 67,061 | 71,015 | 76,167 |
| ඉගෙනුම් චක්‍රය අනුව | | | | | | | |
| ප්‍රාථමික ( 1-5 ශ්‍රේණි) | 1,607,581 | 1,672,809 | 1,683,829 | 1,698,510 | 1,718,675 | 1,732,446 | 1,725,657 |
| කනිෂ්ඨ ද්විතීයික ( 6-9 ශ්‍රේණි) | 1,316,996 | 1,220,123 | 1,226,969 | 1,245,609 | 1,272,645 | 1,294,756 | 13,08,485 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 10-11ශ්‍රේණි) | 622,023 | 610,492 | 602,049 | 591,087 | 567,396 | 570,383 | 594,494 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික ( 12-13ශ්‍රේණි) | 290,050 | 436,648 | 461,000 | 468,880 | 478,441 | 480,452 | 494,597 |
| පිරිවෙන්වල ශිෂ්‍ය සංඛ්‍යාව | 54,899 | 62,021 | 62,861 | 64,608 | 66,116 | 62,870 | 64,606 |
| පැවිදි | 31,099 | 33,700 | 33,964 | 35,019 | 35,595 | 34,003 | 34,652 |
| ගිහි | 23,890 | 28,321 | 28,897 | 29,589 | 30,521 | 28,867 | 29,954 |
| පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව (i) | 107,874 | 117,362 | 121,764 | 125,669 | 127,986 | 131,427 | 133,749 |
| **ප්‍රවේශය සහ සහභාගිත්වය (j)** | | | | | | | |
| රජයේ පාසල්වල 1 ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාව | 327,601 | 331,992 | 331,344 | 339,142 | 350,294 | 349,182 | 334,877 |
| ප්‍රාථමික අධ්‍යාපනයට (1ශ්‍රේණියට) ශුද්ධ ප්‍රවේශ අනුපාතය (k) | 95 | N/A | N/A | 98.3 | 99.4 | 99.5 | 99.4 |
| ස්ත්‍රී | 94 | N/A | N/A | 98.2 | 99.4 | 99.6 | 99.3 |
| පුරුෂ | 95 | N/A | N/A | 98.4 | 99.4 | 99.4 | 99.4 |
| ප්‍රාථමික චක්‍රය තුළ (1-5ශ්‍රේණි) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (l) | 97 | 95 | 95 | 99.9 | 98.4 | 98.5 | 97.5 |
| ස්ත්‍රී | 96 | 94 | 95 | 99.6 | 98.4 | 98.5 | 97.5 |
| පුරුෂ | 97 | 95 | 95 | 100.0 | 98.4 | 98.6 | 97.5 |
| කනිෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-9 ශ්‍රේණි ) තුළ ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (m) | N/A | N/A | N/A | 98.4 | 98.7 | 99.0 | 98.3 |
| ස්ත්‍රී | N/A | N/A | N/A | 99.6 | 98.3 | 98.7 | 98.4 |
| පුරුෂ | N/A | N/A | N/A | 98.2 | 99.1 | 99.8 | 98.3 |
| ජ්‍යෙෂ්ඨ ද්විතීයික චක්‍රය තුළ (1-11 ශ්‍රේණි ) ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය (n) | N/A | N/A | N/A | 98.6 | 96.2 | 96.3 | 96.2 |
| ස්ත්‍රී | N/A | N/A | N/A | 98.2 | 96.0 | 96.5 | 96.3 |
| පුරුෂ | N/A | N/A | N/A | 99.0 | 96.3 | 96.8 | 96.2 |

# ප්‍රධාන අධ්‍යාපන දත්ත සහ දර්ශක

| දර්ශක | 2006 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| **ප්‍රවේශය සහ සහභාගිත්වය** | | | | | | | |
| 9 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | 91.8 | 87.3 | 88.0 | 92.1 | 91.9 | 92.5 | 93.3 |
| ස්ත්‍රී | 93.8 | 89.9 | 90.4 | 94.1 | 93.9 | 94.7 | 95.06 |
| පුරුෂ | 89.8 | 84.7 | 85.6 | 90.1 | 90.0 | 90.3 | 91.48 |
| 11 ශ්‍රේණිය දක්වා රැඳී සිටීමේ අනුපාතය(o) | N/A | N/A | N/A | N/A | N/A | 85.1 | 85.42 |
| ස්ත්‍රී | N/A | N/A | N/A | N/A | N/A | 88.3 | 88.52 |
| පුරුෂ | N/A | N/A | N/A | N/A | N/A | 82.0 | 82.42 |
| **ශිෂ්‍ය සාධනය** ( p) | | | | | | | |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ශිෂ්‍ය සාධනය | | | | | | | |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 291,029 | 302,640 | 310,604 | 310,329 | 322,455 | 327,648 | 333,672 |
| ලකුණු 200න් 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය | - | 56.2 | 65.1 | 64.3 | 78.96 | 78.96 | 76.33 |
| **අ.පො.ස. ( සා.පෙළ ) විභාගයේ ශිෂ්‍ය සාධනය** | | | | | | | |
| අ.පො.ස. (සා.පෙළ ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව (පළමු වරට පෙනී සිටින) | 343,008 | 271,644 | 270,032 | 268,995 | 264,772 | 257,322 | 273,410 |
| අ.පො.ස. (උ.පෙළ ) සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | 48.7 | 60.6 | 60.8 | 64.7 | 66.67 | 69.02 | 69.33 |
| සමත් ප්‍රතිශතය | | | | | | | |
| ගණිතය | 42.4 | 60.3 | 55.3 | 55.3 | 57.23 | 56.70 | 55.18 |
| විද්‍යාව | 45.6 | 61.7 | 62.4 | 68.2 | 67.53 | 60.58 | 68.02 |
| ඉංග්‍රීසි | 35.6 | 42.3 | 44.5 | 47.7 | 47.86 | 45.08 | 45.40 |
| අ.පො.ස. (උ.පෙළ ) විභාගයේ ශිෂ්‍ය සාධනය | | | | | | | |
| අ.පො.ස. (උ.පෙළ ) විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව (පාසල් අයදුම්කරුවන්) | 172,242 | 141,510 | 239,851 | 194,448 | 209,906 | 207,304 | 210,340 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | | | |
| ජීව විද්‍යා ධාරාව | 33.0 | 38.8 (u) | 50.6 (v) | 53.8 (v) | 49.8 (v) | 50.30 | 53.3 |
| භෞතික විද්‍යා ධාරාව | 32.9 | 36.2 | 46.2 | 44.7 | 47.1 | 46.60 | 48.6 |
| වාණිජ ධාරාව | 62.1 | 58.4 | 53.9 | 72.3 | 57.6 | 64.03 | 67.9 |
| කලා ධාරාව | 63.0 | 64.3 | 67.8 | 67.7 | 66.0 | 68.90 | 65.9 |
| තාක්ෂණ ධාරාව | X | X | X | X | X | X | 53.9 |
| විකල්ප විෂය ධාරාවන් | X | X | X | 55.33 | 48.9 | 47.42 | 39.0 |
| **මූල්‍ය** (s) | | | | | | | |
| අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 20,169 | 28,237 | 30,986 | 33,618 | 38,336 | 52,381 | 54,432 |
| පුනරාවර්තන (රු. මි. ) | 15,355 | 23,970 | 26,697 | 28,977 | 30,693 | 36,592 | 38,896 |
| ප්‍රාග්ධන (රු. මි. ) | 4,814 | 4,267 | 4,289 | 4,641 | 7,643 | 15,789 | 15,536 |
| අධ්‍යාපන අමාත්‍යාංශය සහ පළාත් සභා විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද මුළු වියදම (රු. මි. ) | 62,615 | 86,231 | 90,202 | 90,422 | 110,737 | 117,000 | 151,130 |
| පුනරාවර්තන (රු. මි. ) | 55,026 | 79,414 | 82,181 | 82,872 | 99,297 | 97,000 | 127,000 |
| ප්‍රාග්ධන (රු. මි. ) | 7,589 | 6,817 | 8,021 | 7,550 | 11,440 | 20,000 | 24,130 |
| පාසල් පෙළපොත් ලබා දීම සඳහා වියදම (රු. මි.) | 1,123 | 1,941 | 2,294 | 2,055 | 2,700 | 2,703 | 3,000 |
| පාසල් නිල ඇඳුම් ලබා දීම සඳහා වියදම (රු. මි.) | 962 | 949 | 1,364 | 2,218 | 1,826 | 3,574 | 2,600 |
| පාසල් පෝෂණ වැඩසටහන (රු. මි.) | 721 | 2,275 | 2,631 | 2,790 | 3,000 | 3,725 | 4,082 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර හා ශිෂ්‍යත්ව (රු. මි.) | 275 | 225 | 157 | 230 | 280 | 300 | 325 |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් සිසුන් සඳහා සපත්තු ලබා දීම | X | X | X | X | X | 298 | 600 |
| කිරි වීදුරුවක් ලබා දීම | X | 178 | 249 | 205 | 230 | 197 | 127 |

| යටිතල පහසුකම් (q) | 2006 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|
| අ.පො.ස. (උ.පෙළ ) විද්‍යාගාර සහිත පාසල් සංඛ්‍යාව | 659 | 716 | 716 | 748 | 868 | 959 | 1004 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 1ඒබී සහ 1සී පාසල් ප්‍රතිශතය | N/A | 92.7 | N/A | 95.9 | 95.9 | 73 | 73 |
| තොරතුරු තාක්ෂණ විද්‍යාගාර සහිත 2 වර්ගයේ සහ 3 වර්ගයේ පාසල් ප්‍රතිශතය | N/A | 36.1 | N/A | 43.0 | 43.0 | 20 | 21 |
| පානීය ජල පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය | N/A | 83 | N/A | 85 | 86.2 | 85 | 87 |
| ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහිත පාසල් ප්‍රතිශතය (r) | N/A | 51 | N/A | 79 | 75 | 98 | 99 |

(a) වාර්ෂික පාසල් සංගණන දත්ත ඇසුරිනි.

(b) 1AB : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) විද්‍යා, වාණිජ, කලා ධාරා තුන ම සහිත පාසල්

1C : 1 සිට 13 හෝ 6 සිට 13 ශ්‍රේණි සහිත අ.පො.ස. (උ.පෙ) වාණිජ හෝ කලා ධාරා දෙක ම හෝ එකක් හෝ සහිත පාසල්

2 වර්ගය : 1 සිට 11 හෝ 6 සිට 11 ශ්‍රේණි සහිත අ.පො.ස. (සා.පෙ) දක්වා වූ පාසල්

3 වර්ගය : 1 සිට 5 හෝ 8 ශ්‍රේණිය දක්වා ඇති ප්‍රාථමික හෝ කනිෂ්ඨ පාසල්

(c) නාගරික - මහ නගර සභා හෝ නගර සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

ග්‍රාමීය - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක පිහිටි පාසල්

(d) මුදල් අය කරනු ලබන හෝ අය කරනු නොලබන ජාතික විෂය මාලාව උගන්වන පෞද්ගලික අංශයෙන් පාලනය වන පාසල් ( මෙහි දී ජාත්‍යන්තර පාසල් ඇතුළත් නොවේ)

(e) විශේෂ අවශ්‍යතා සහිත දරුවන් ( අන්ධ, ගොළු, බිහිරි, ඔටිසම් ) සඳහා වූ විශේෂ පාසල්

(f) පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත උපාධිධාරීන්

(g) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ තුළින් හෝ ගුරු විද්‍යාල තුළින් පුහුණුව ලබා ඇති ගුරුවරුන්

(h) වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ පුහුණු ගුරුවරුන් සංඛ්‍යාව, සමස්ත ගුරුවරුන් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

(i) විශේෂ පාසල් ද ඇතුළු ව

(j) වාර්ෂික පාසල් සංගණන දත්ත, සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජනගහන දත්ත හා ලෝක බැංකු දත්ත පාදකය ඇසුරිනි.

(k) අවුරුදු 5 සම්පූර්ණ වූ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල පළමු ශ්‍රේණියට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(l) අවුරුදු 5-10 වයස් සීමාවේ සිටින ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික අධ්‍යාපන චක්‍රයට ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(m) අවුරුදු 5-14 වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට කනිෂ්ඨ ද්විතීයික අවධිය දක්වා (1-9 ශ්‍රේණිවලට ) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(n) අවුරුදු 5-16 අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ ජනගහනයෙන් රජයේ පාසල්, පෞද්ගලික පාසල් හා පිරිවෙන්වල ප්‍රාථමික සිට ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය දක්වා (1-11ශ්‍රේණිවලට ) ඇතුළත් ව ඇති ශිෂ්‍ය ප්‍රතිශතය

(o) රජයේ පාසල්වලට පළමු ශ්‍රේණියට ඇතුළත් වන ශිෂ්‍යයින්ගෙන් 9 ශ්‍රේණිය දක්වා රැඳී සිටින ප්‍රතිශතය

(p) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ප්‍රතිඵල දත්ත ඇසුරිනි.

(q) පාසල්වල පවතින යටිතල පහසුකම් අතරින් ප්‍රධාන කිහිපයක් පමණක් මෙහි සලකා ඇත.

(r) පාසල් සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ ව සකස්කර ඇති ජාතික ප්‍රතිමානයන්ට අනුව අවශ්‍ය ප්‍රමාණයෙන් 50% ක් හෝ ඇති පාසල්

(s) අධ්‍යාපන අමාත්‍යාංශයේ දත්ත සහ මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ දත්ත ඇසුරිනි.

(t) කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවල සියලු ම රජයේ පාසල් ද මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල ඇතැම් රජයේ පාසල් ද 2009 ජූනි 01 පාසල් සංගණන දිනය වන විට වසා තිබිණි.

(u) පළමු වර අ.පො.ස. (උ.පෙළ) විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(v) පළමු වර හා දෙවන වර විභාගයට පෙනී සිටි අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල අනුව

(w) සිංහල හෝ දෙමළ මාධ්‍ය සහිත ව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ද විෂයයන් කිහිපයක් හදාරන සිසුන්

(x) ගණිතාගාරයකින්, භාෂාගාරයකින්, පරිගණක විද්‍යාගාරයකින්, දුරස්ථ අධ්‍යාපන ඒකකයකින් හා විද්‍යාගාර නොමැති පාසල්වල විද්‍යාගාරයකින් සමන්විත දෙමහල් විද්‍යාගාර

(y) ඉංජිනේරු තාක්ෂණවේදය හැදෑරීමට පහසුකම් සහිත තෙමහල් තාක්ෂණ විද්‍යාපීඨ

N/A—දත්ත නොමැත
X—අදාළ නොවේ

# පරිච්ඡේද 01 - 09

# 01. අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

## දැක්ම

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මඟින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම

## මෙහෙවර

නැණ - ගුණ - බල - සුව සපිරි ගුරු දෙගුරුනට සහ මවුබිමට ආදරය කරන විශ්වයට සම්පතක් වන යහපත් දක්ෂ නිර්මාණාත්මක පුරවැසියන් පිරිසක් බිහි කිරීම මඟින් ශ්‍රී ලාංකේය මානව සම්පත සංවර්ධනය කිරීම

## 1.1 අධ්‍යාපන අමාත්‍යාංශයේ වගකීම

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ව ජාතික පොදු අරමුණු ඉටුකර ගැනීම උදෙසා වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ පනත්වලින් පැනවෙන විධිවිධාන හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව වගකීම මධ්‍යම අමාත්‍යාංශයට පැවරී ඇති බැවින් පළාත් අධ්‍යාපන අධිකාරීත්වයන් සමඟ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම අමාත්‍යාංශයේ ප්‍රධාන භූමිකාවකි. අධ්‍යාපන ප්‍රමිති සහතික කිරීමට අත්‍යවශ්‍යයෙන් ම තිබිය යුතු මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත් ව සැපයීම හා විධිමත් සුපරීක්ෂණ ක්‍රියාවලියක් දියත් කිරීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන වගකීම් අතර වේ.

පාසල් විෂයමාලාව, පෙළපොත්, ඇගයීම හා තක්සේරු කිරීම වැනි අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පැවරී ඇති වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරුව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම් භාරයට අයත් වේ.

2015 සැප්තැම්බර් මස 04 වන දින සිදු කරන ලද අමාත්‍ය මණ්ඩල සංශෝධනයෙන් පසු ව සංස්කෘතික හා ජාතික උරුම යටතේ වන ආයතන 8ක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පත්කෙරිණි. ඒ අනුව එම ආයතනවල අධීක්ෂණ කටයුතු මෙන් ම ඓතිහාසික සහ සංස්කෘතික උරුමයන් රැක ගැනීමේ හා කලා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අදාළ ව එම ආයතනවල කාර්යභාරය විමසා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම ද අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරිණි.

## 1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය

1. අධ්‍යාපන විෂයයට සහ 1.3 හි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
2. පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇතිවන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීම හා සම්පාදනය කිරීම
3. ලෝක තරගකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතු ව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම
4. ජාතික පාසල් සඳහා අවශ්‍ය මානව සම්පත් සැපයීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
5. ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර පාසල් අධීක්ෂණය
6. පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
7. නොමිලේ පාසල් පෙළපොත් හා නිල ඇඳුම් ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
8. පාසල් පුස්තකාල ප්‍රවර්ධනය හා සංවර්ධනය
9. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය, සිසු විනය හා සදාචාරය මනා අයුරින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම
10. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
11. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පරිපාලන සහ පිරිස් කළමනාකරණ කටයුතු
12. ඵලදායී ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම
13. ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
14. පාසල් සංවර්ධන මණ්ඩල පරිපාලනය
15. අධ්‍යාපන ආයතන නීතිගත කිරීම
16. බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නගා සිටුවීම
17. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
18. නවීන හා සාම්ප්‍රදායික කලා නිර්මාණ ප්‍රවර්ධනයට සහ කලා ශිල්පීන් දිරිමත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම
19. නාට්‍ය, සංගීත හා නර්තන ක්ෂේත්‍රවල අභිවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග හඳුනාගෙන ක්‍රියාවට නැංවීම
20. රාජ්‍ය ලේඛන විධිමත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීම
21. 1.3 හි දැක්වෙන ආයතනවල පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
22. 1.3 හි දැක්වෙන ආයතන අධීක්ෂණය කිරීම.

## 1.3 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන

- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- ජාතික අධ්‍යාපන ආයතනය
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
- ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල
- අධ්‍යාපන විද්‍යාපීඨ
- ගුරු විද්‍යාල
- පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ටවර්හෝල් රඟහල පදනම
- ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය
- ජාතික කලා මණ්ඩලය
- ග්‍රාමෝදය ජනකලා කේන්ද්‍රය
- අපේ ගම
- ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව
- මධ්‍යම සංස්කෘතික අරමුදල

# අධ්‍යාපනයේ සැබෑ ගුණාත්මක වෙනසක් ඇති කිරීම සඳහා නව රජයේ ප්‍රතිපත්ති හා ප්‍රමුඛ වැඩසටහන්

"සැමට ගුණාත්මක සමාන අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයක් සහතික කිරීම මෙන් ම යාවජීව ඉගෙනුම ප්‍රවර්ධනය කරන අවස්ථා සැපයීම" යන ගෝලීය තිරසර සංවර්ධන අරමුණ මත පදනම් ව 2030 දී අධ්‍යාපනය සඳහා වන ගෝලීය ඉලක්ක හඳුනාගෙන ඇත. අධ්‍යාපන විෂයයෙහි ප්‍රමුඛ අවධානයක් යොමු කරන රටක් ලෙස ශ්‍රී ලංකාව දැනටමත් ප්‍රවේශය හා සම්බන්ධ බොහෝ ඉලක්ක සාක්ෂාත් කරගනු ලැබ ඇති අතර තවදුරටත් වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි අධ්‍යාපනය නවීකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

අධ්‍යාපනය පූර්ව ළමා වියේ සිට ප්‍රාථමික, ද්විතීයික, තෘතීයික හා තාක්ෂණික හා වෘත්තීය යන සැම අධ්‍යාපන අවධියක් ම ආවරණය වන සේ පුළුල් ලෙස අර්ථ දැක්වීම, අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම කෙරෙහි වඩ වඩාත් අවධානය යොමු කිරීම, ස්ත්‍රී පුරුෂ භාවය, වයස, ජාතිය, ආබාධිත බව වැනි කිසිදු භේදයකින් තොර ව අධ්‍යාපනය ලැබීමේ අයිතිය තහවුරු කිරීම, අධ්‍යාපනයේ පවතින ප්‍රාදේශීය විෂමතා ඇතුළු සියලු විෂමතා තුරන් කිරීම මෙන් ම අධ්‍යාපනය සඳහා ආයෝජනය ඉහළ නැංවීම ද ජාතික අරමුණු අතර ප්‍රධාන වේ.

රජයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ලෙස ඉදිරිපත් ව ඇති පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මේ වන විටත් අවශ්‍ය පියවර ගනිමින් පවතී.

- අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල කුමක් වුවත් උසස් පෙළට වෘත්තීය විෂයයන් හඳුන්වා දීම තුළින් සියලු සිසුන්ට වසර 13ක අනිවාර්ය අධ්‍යාපනයක් කරා ගෙන යාම; භේදයකින් තොර ව සියලු පාසල් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා දිරිගැන්වීම් ලබා දීම
- පාසල් අධීක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම
- මූලික සනීපාරක්ෂක පහසුකම් සියලු පාසල් වෙත ලබා දීම
- පංති කාමරයක සිටිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව 35 කට සීමා කිරීම
- නව අධ්‍යාපන පනතක් (ආඥා පනත වෙනුවට) බලගැන්වීම
- ජාතික පුස්තකාලය ඉ - පුස්තකාලයක් බවට පත් කිරීම
- අධ්‍යාපනය වෙනුවෙන් රජයේ වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% ක් බවට පියවරෙන් පියවර ළඟා කරලීම
- විභාග කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනුවට සෞන්දර්ය, ක්‍රීඩා ඇතුළු ක්ෂේත්‍ර ආවරණය වන සමබර අධ්‍යාපනයක් ලබා දීම
- ප්‍රාථමික පාසල් ජාලය ශක්තිමත් කිරීම
- පොදු අධ්‍යාපන ප්‍රතිපත්තිය සඳහා ජාත්‍යන්තර පාසල් ද ඇතුළත් කිරීම

මෙහි දී වර්තමාන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි අධ්‍යාපනය සකස් කිරීමටත් පාසල් පද්ධතියේ පවතින අසමානතා දුරලමින් සියලු දරුවන්ට සමාන අධ්‍යාපනයක් ලැබෙන සේ "ළඟ ම පාසල හොඳ ම පාසල" යන සංකල්පය මත පාසල් පද්ධතිය භෞතික හා ගුණාත්මක වශයෙන් සංවර්ධනය කිරීමටත් ඒ සඳහා අවශ්‍ය ආයෝජන ක්‍රමයෙන් ඉහළ නැංවීමටත් අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රමුඛත්වය ලබා දී ඇත.

# දින සියයේ වැඩසටහනෙහි ඉලක්ක සපුරා ගැනීම

- **අධ්‍යාපනය සඳහා වෙන් කරන මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 6% දක්වා ක්‍රමික ව වැඩි කිරීම**

පරිගණක තාක්ෂණය දියුණු කිරීම, අනාගත රැකියා වෙළෙඳ පොළට ගැළපෙන පරිදි අධ්‍යාපන පද්ධතිය සකස් කිරීම, විශේෂයෙන් ම නව තාක්ෂණය පදනම් කරගනිමින් පාසල් විෂය නිර්දේශය අලුතින් සකස් කිරීම, පාසල්වලට දරුවන් ඇතුළත් කිරීමේ දී මතු වී තිබෙන ගැටලු නිරාකරණය කිරීම සඳහා "ළඟ ම පාසල හොඳ ම පාසල" බවට පත් කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම, විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් සඳහා දේශීය, විදේශීය පුහුණු අවස්ථා ලබාදීම ඇතුළු අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය ඉහළ නැංවීම වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා මුදල් වැඩි ප්‍රමාණයක් ආයෝජනය කිරීම රජයේ අරමුණ වේ. අධ්‍යාපන පද්ධතියේ අත්‍යවශ්‍යයෙන් මෙන් ම කඩිනමින් සම්පූර්ණ කළ යුතු භෞතික පහසුකම් හා සංවර්ධන ප්‍රමුඛතා හඳුනාගෙන මධ්‍යකාලීන ක්‍රමෝපායික සැලැස්මක් පිළියෙල කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පියවරින් පියවර ලබාගැනීමේ ක්‍රමවේදයක් කරා යොමු ව ඇත.

අධ්‍යාපනය සඳහා වූ රාජ්‍ය ආයෝජනය ඉහළ නැංවීමට ඉදිරිපත් කළ ව්‍යාපෘති සඳහා 2015 අයවැය ලේඛනය තුළින් මුදල් ලබාදීමට එකඟතාව ය ලැබිණි.

- **පළමුවැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේ දී සාධාරණ හා විනිවිද භාවයකින් යුත් ක්‍රමවේදයක් සකස් කිරීම සහ සෑම දරුවෙකුට ම වර්ෂය මුල දී ම පාසලක් ලැබීම සහතික කිරීම**

මේ පිළිබඳ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුව විසින් සකස් කරන ලද ක්‍රමවේදය ඇතුළත් 2016 වර්ෂය සඳහා ළමුන් ඇතුළත් කිරීමට අදාළ සංශෝධිත චක්‍රලේඛය 2015.03.31 දින නිකුත් කරන ලදි

- **පළමුවැනි ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ දී සිදු ව ඇති අසාධාරණ සම්බන්ධ අභියාචනා සලකා බලා කඩිනමින් සහන සැලසීම**

අභියාචනා භාරගැනීමට විධිමත් වැඩපිළිවෙළක් යොදා, භාර ගන්නා කාල පරිච්ඡේදය පිළිබඳ ව මහජනතාව දැනුම්වත් කරන ලදි. අභියාචනා මණ්ඩල 5ක් මගින් සියලු අභියාචනා සලකා බලා සුදුසු පරිදි විසඳුම් ලබා දෙන ලදි. පළමු ශ්‍රේණිය සඳහා ලද අභියාචනා 2,402ක් ද අනෙකුත් ශ්‍රේණි සඳහා ලද අභියාචනා 5,000 ක් ද පමණ මෙලෙස සමාලෝචනය කොට තීරණ දෙමාපියන් වෙත කඩිනමින් දැනුම් දෙන ලදි.

- **ආගම ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරුන් ලබා දීම**

මෙම කාර්යය සඳහා පත් කරන ලද සියලු ආගම් නියෝජනය කරන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා නිර්දේශ ගුරු කාර්ය මණ්ඩල නිර්ණය කිරීමේ නව චක්‍රලේඛය සකස් කිරීමේ දී සැලකිල්ලට ගෙන ආගම ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරු සංඛ්‍යාව වෙන වෙන ම ගණනය කිරීමට ඉඩ ලබා දී ඇත.

- **පිරිවෙන් අධ්‍යාපන සංවර්ධනය හා පිරිවෙන් ගුරු පුහුණුව සඳහා වැඩසටහනක් ආරම්භ කිරීම**

"ඵල සපිරි පිරිවෙන" වැඩසටහන තෝරාගත් දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කරන ලදි. ඊට සමගාමීව අත්පොතක් සෑම පිරිවෙනකට ම බෙදා දුන් අතර පිරිවෙන්වල ඵලදායිතාව නැංවීම පිළිබඳ ව පරිවේණාධිපති හිමිවරුන් සහ කාර්ය මණ්ඩලය දැනුම්වත් කරන ලදි. "ත්‍රිපිටක දිනය" වැඩසටහනට සමගාමී ව පිරිවෙන්වල ධර්මදේශනා, සම්මන්ත්‍රණ තරග පවත්වන ලදි. පිරිවෙන් සඳහා නව වාර්ෂික පරීක්ෂක වාර්තාවක් හඳුන්වා දෙනු ලැබිණි. පිරිවෙන් ගුරු පුහුණු වැඩසටහන්, ශිෂ්‍ය නායකත්ව සංවර්ධන වැඩසටහන්, භාෂා දින තරග පැවැත්වීම ඇතුළු සංවර්ධන වැඩ සටහන් රැසක් ක්‍රියාවට නංවන ලදි.

නව ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි වැටුප් හා උසස් වීම් පරිවේණාචාර්යවරුන් සඳහා ද අදාළ වන පරිදි ක්‍රියාත්මක කිරීමත් පිරිවෙන් සියල්ලට ම වාර්ෂික ආධාර මුදල් වාර්ෂික වාර්තා අනුව නිර්ණායයක මත ලබා දීමත් විශේෂ වේ.

- **ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම**

මේ සඳහා බලය ලත් අධිකාරියක් පිහිටුවීම පිළිබඳ ව ජාත්‍යන්තර පාසල් ප්‍රධානීන් සමග සාකච්ඡා පවත්වා අදහස් ලබා ගන්නා ලදි. ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා මැදිහත් වීමේ දී පවත්නා නීතිමය බාධක හඳුනාගෙන පවත්නා රෙගුලාසි සංශෝධනය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගන්නා ලදි. 1961 අංක 8 දරන අධ්‍යාපන පනතේ 25 වන වගන්තිය යටතේ දැක්වෙන උපකෘත පාසල් හා ගුරු විද්‍යාල (පරිපූරක ප්‍රතිපාදන) පිළිබඳ වගන්තිය සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සැලසුම් කර ඇත. ජාත්‍යන්තර පාසල් පිළිබඳ තොරතුරු එකතු කිරීම සඳහා පුවත්පත් නිවේදනයක් මඟින් කළ දැනුම්දීමට අනුව පාසල් 176 ක් තොරතුරු සපයා ඇත.

- **රජයේ පාසල්වල අවිධිමත් ලෙස මුදල් එකතු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කිරීම**

රජයේ පාසල්වල විවිධ කටයුතු සඳහා සිසුන්ගෙන් හා දෙමාපියන්ගෙන් විවිධ අයුරින් මුදල් එකතු කිරීම හා මුදල් වැය කිරීම තුළ විනිවිද භාවය ප්‍රදර්ශනය නොවීම තුළ දිගුකලක් තිස්සේ මතු ව තිබූ ගැටලු සහගත තත්වයන් මගහැරවීම සඳහා පාසල්වල අවිධිමත් ලෙස මුදල් එකතු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමින් 05/2015 චක්‍රලේඛය නිකුත් කරන ලදි.

ඒ අනුව ජාතික පාසල්වලට හා පළාත් පාසල්වලට අදාළ ව වාර්ෂික අය වැය - ඇස්තමේන්තු පරීක්ෂා කර බලා අනුමැතිය ලබා දීම, චක්‍රලේඛය මඟින් බලය දෙන ලද අනුකමිටු විසින් සිදු කරනු ලබන අතර එම අනුමැතියෙන් බැහැර ව මුදල් එකතු කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කර ඇත.

- **ජාතික පාසල් සංවර්ධනය සඳහා පාසල් පාදක ප්‍රදාන ලබාදීම**

සියලුම ජාතික පාසල්වල එනම් ජාතික පාසල් 352 හි ගුණාත්මක සංවර්ධනය උදෙසා පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන සිදු කරන ලදි. මෙම ප්‍රදාන පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන කරනු ලැබූ අතර සිසුන් 3000ට වැඩි පාසල් සඳහා ලක්ෂ 15ක ප්‍රදානයක් ද සිසුන් 399ට අඩු පාසල් සඳහා රුපියල් ලක්ෂයක් ද අතරමැදි පාසල් සඳහා එක් ශිෂ්‍යයකුට රුපියල් 500 ක වියදමක් වන පරිදි ශිෂ්‍ය සංඛ්‍යාව මත ද ගණනය කර මෙම ප්‍රදානය සිදු කරන ලදි.

මෙම ප්‍රදාන ශිෂ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ඉහළ නැංවීමට අදාළ විශේෂ ව්‍යාපෘති, පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන්, විෂයානුබද්ධ, විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම්, සිසුන් තුළ උසස් මට්ටමේ කුසලතා වැඩි දියුණු කිරීමට අදාළ වැඩසටහන්, ශිෂ්‍ය නිර්මාණශීලී හා නවෝත්පාදක වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර දෙන ලදි.

- **පාසල් අධ්‍යයන කාර්ය මණ්ඩල නිර්ණය කිරීම සඳහා නව චක්‍රලේඛයක් නිකුත් කිරීම**

පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම සඳහා මෙතෙක් පැවති 2003/38 චක්‍රලේඛයේ පැවති අඩුපාඩු මගහරවමින් 12/2015 දරණ නව චක්‍රලේඛය නිකුත් කරන ලදි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව පළාත් සමඟ සාකච්ඡා කර ගුරුවරුන් සැපයීම පිළිබඳ ව සකස් කර ඇති නිර්ණායක හා ගළපමින් මෙම චක්‍රලේඛය සංශෝධනය කොට පළාත් සමඟ අනුමත ගුරු සංඛ්‍යා පිළිබඳ එකඟතාවකට පැමිණීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

මෙලෙස අනුමත කරගැනීමෙන් අනතුරුව ජාතික පාසල්වල සහ පළාත් පාසල්වල ගුරු ඌනතා හා අතිරික්ත හඳුනාගනිමින් ඒකාබද්ධ සැලස්මක් මත ගුරු උපයෝගීතාව උපරිම වන අයුරින් ගුරු තුළනය සිදු කිරීමට සැලසුම් කර ඇත.

මෙම නව චක්‍රලේඛය හා එහි යෝජිත සංශෝධනවලට අනුව ශිෂ්‍යයන් කුඩා ප්‍රමාණයන් සිටින පාසල්වලට ද විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය ගුරුවරුන් ලැබෙන අතර මෙතෙක් පොදු විෂය යටතේ ගණනය කළ මව්බස හා ආගම ඉගැන්වීම සඳහා ගුරු සංඛ්‍යාව වෙන් වශයෙන් ගණනය කර ලබා ගැනීමට හැකිවීම මඟින් එම විෂයයන් ඉගැන්වීම සඳහා ගුරුවරුන් සැපයීම විධිමත් කිරීමට ඉඩ සලසා ඇත.

# 02. ජාතික අධ්‍යාපන සංවර්ධන අභිමතාර්ථ, උපාය මාර්ග හා ඉලක්ක

## 2.1 මධ්‍ය කාලීන සංවර්ධන අභිමතාර්ථ, උපායමාර්ග හා ඉලක්ක

<u>අධ්‍යාපන සංවර්ධන අභිමතාර්ථ හා ඉලක්ක</u>

1. පූර්ව ළමා විය අධ්‍යාපනයේ ගුණාත්මක බව ඉහළ නැංවීම
2. අනිවාර්ය අධ්‍යාපන වයසේ සියලු ම දරුවන් අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීම සහතික කිරීම
3. ප්‍රාථමික අධ්‍යාපනයට ඇතුළත් වන දරුවන් අ.පො.ස (සා.පෙළ) දක්වා රැඳී සිටීම 2017 වන විට 90% දක්වා ඉහළ නැංවීම (2015 ඉලක්කය 86%)
4. අ.පො.ස (සා.පෙළ) සමත් ප්‍රතිශතය 2017 වන විට 81% දක්වා ඉහළ නැංවීම (2015 ඉලක්කය 80%)
5. අ.පො.ස (උ.පෙළ) සහභාගිත්වය විද්‍යා හා තාක්ෂණ ධාරාව සඳහා 40% දක්වාත් වාණිජ විෂය ධාරාව සඳහා 35% දක්වාත් 2017 වන විට ඉහළ දැමීම හා කලා විෂය ධාරාවේ ව්‍යුහගත වෙනසක් ඇතිකිරීම (2015 ඉලක්ක පිළිවෙළින් 36% ක් හා 34%)
6. 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගන්නා ශිෂ්‍ය ප්‍රතිශතය ඉහළ නැංවීම (2015 ඉලක්කය 66% )
7. අ.පො.ස. උසස් පෙළ සමත් වන ප්‍රතිශතය ඉහළ නැංවීම ( 2015 ඉලක්කය 66% )
8. 2016 වන විට වෘත්තීය සුදුසුකම් සපිරි ගුරු ප්‍රතිශතය 90% දක්වා වැඩි කිරීම (2015 ඉලක්කය 85%)
9. ශිෂ්‍ය තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව 70% දක්වා ඉහළ නැංවීම
10. තොරතුරු තාක්ෂණ කුසලතා සහිත ගුරු ප්‍රතිශතය 70% දක්වා ඉහළ නැංවීම
11. අ.පො.ස. (සා.පෙ.) හා අ.පො.ස. (උ.පෙ.) හදාරා පාසලින් පිටවන සෑම ශිෂ්‍යයකු ම උසස් අධ්‍යාපන හෝ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් ලබා ගැනීමට යොමු වීම සහතික කිරීම
12. ත්‍රිභාෂා කුසලතා පිරි දරු පරපුරක් පාසල් පද්ධතිය තුළින් බිහි කිරීම
13. උසස් පෞරුෂයක් හා ශාරීරික යෝග්‍යතාවක් සහිත යොවුන් පරපුරක් සමාජයට දායාද කිරීම
14. නිර්මාණශීලී කුසලතාවලින් හෙබි දේශීයත්වය අගයන සාරධර්ම සුරකින පුරවැසියන් පාසල තුළින් බිහි කිරීම
15. භෞතික හා මානව සම්පත් සපුරාලීම මඟින් සෑම අධ්‍යාපන ආයතනයක් ම කාර්යක්ෂම හා ඵලදායී සේවා සපයන ආයතනයක් බවට පත් කිරීම
16. අධ්‍යාපනය සඳහා වන රාජ්‍ය වියදම දළ ජාතික නිෂ්පාදනයෙන් 6% ක් දක්වා ක්‍රමික ව ඉහළ නැංවීම

<u>උපාය මාර්ගික සංවර්ධන අරමුණු හා ඉලක්ක</u>

1. නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කිරීම
2. "ළඟ ම පාසල හොඳ ම පාසල" වැඩසටහන යටතේ සෑම ප්‍රා.ලේ. කොට්ඨාසයකට ම පාසල් දෙකක්වත් වන සේ පාසල් 600ක් අංග සම්පූර්ණ ව සංවර්ධනය කිරීම
3. ප්‍රාථමික පාසල් සඳහා සියලු පහසුකම් සැපයීම හා ද්විතීයික පාසල් පද්ධතිය හා විචාරවත් පරිදි ඒකාබද්ධ කිරීම
4. සිසුන්ගේ ඇදහැලීම අඩුකර සහභාගිත්වය වැඩිකිරීම සඳහා සුහසාධක සේවාවන් ක්‍රියාත්මක කිරීම
5. සියලු ම පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම
6. පන්ති කාමරවල ශිෂ්‍ය සංඛ්‍යාව උපරිම සීමාවකට යටත් ව පවත්වා ගැනීම
7. වසර 13ක් අධ්‍යාපනය ලබාදීම තහවුරු කෙරෙන අයුරින් අදාළ අනෙකුත් අමාත්‍යාංශ සමඟ ඒකාබද්ධ වැඩසටහන් දියත් කිරීම
8. ගෝලීය මට්ටමට ගැළපෙන උසස් තත්ත්වයේ සමබර විෂය මාලාවක් නිර්මාණය කිරීම
9. අ.පො.ස.(සා.පෙළ) සඳහා විද්‍යාගාර පහසුකම් හා අ.පො.ස.(උ.පෙළ) සඳහා තෝරා ගත් පාසල්වලට විද්‍යාගාර පහසුකම් ලබා දීම හා උසස් පෙළ විද්‍යා ධාරාව ඇරඹීම
10. සෑම පාසලකට ම විෂයය අනුව සාධාරණ ලෙස ගුරුවරු ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති සැකසීම හා ක්‍රියාත්මක කිරීම
11. අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම
12. පිරිවෙන් අධ්‍යාපනය වැඩිදියුණු කිරීම
13. විශේෂ අධ්‍යාපන ප්‍රවේශ පහසුකම් හා සම්පත් වැඩිදියුණු කිරීම
14. පූර්ව සේවා සහ සේවාස්ථ ගුරු පුහුණුවෙහි ගුණාත්මක බව වැඩිකිරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු අධ්‍යාපනය සංවර්ධනය හා ආයතන හා විෂය මාලාව සංවර්ධනය
15. ශිෂ්‍ය ඇගයීම් ක්‍රියාවලිය නව ක්‍රමවේදය අනුව දියුණු කිරීම
16. අධ්‍යාපන වෘත්තිකයන් උසස් වෘත්තීය හා නායකත්ව සංවර්ධන වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය වශයෙන් යොමු කරවීම
17. පාසල් හා අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මක ප්‍රමිති නිර්ණය කිරීම හා ඇගයීම
18. තීරණ ගැනීමේ ක්‍රියාවලියට සාක්ෂි සැපයෙන දත්ත හා තොරතුරු පද්ධති වැඩිදියුණු කිරීම
19. ශිෂ්‍ය පෞරුෂ වර්ධනය හා ශාරීරික සෞඛ්‍ය වර්ධනය වෙනුවෙන් වැඩසටහන් දියත් කිරීම

## 2.2 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව සහ වැඩසටහන 2013 - 2017

2013 - 2017 කාල පරිච්ඡේදය සඳහා වන 'පළමු ව අධ්‍යාපනය ජාතික ක්‍රමෝපායික සැලැස්ම' ප්‍රතිපත්තිමය තේමා 3ක් හා පදනම් තේමාවක් ඔස්සේ පෙළ ගස්වා ඇත.

**තේමාව 1 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම සාධාරණ අධ්‍යාපන ප්‍රවේශ හා සහභාගිත්ව අවස්ථා ඉහළ නැංවීම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

- 11 ශ්‍රේණිය (වයස අවුරුදු 16 දක්වා) තෙක් සිසුන්ගේ සහභාගිත්ව අනුපාතය ඉහළ යාම
- 9 ශ්‍රේණියෙන් 10 ශ්‍රේණියට සමත් වන ශිෂ්‍ය අනුපාතය ඉහළ යාම
- දළ ඇතුළත්වීම් අනුපාත හා ශුද්ධ ඇතුළත්වීම් අනුපාත ඉහළ යාම
- පළාත් විසින් තීරණය කරන ලද ඉලක්කවල අනුව පාසල් නොයන ශිෂ්‍ය සංඛ්‍යා ප්‍රමාණ අවම වීම
- ප්‍රාථමික පාසල් ජාල සඳහා ද්වීතියික පාසල් සංවර්ධන වැඩසටහන යටතේ ද්වීතියික පාසල් 1,000 ක් හා ප්‍රාථමික පාසල් 6,500 ක් සංවර්ධනය වීම
- ජාතික ප්‍රතිමානවලට අනුව මූලික හා උසස් මට්ටමේ ඉගෙනුම් පහසුකම් සියලු පාසල්වලට සැපයීම
- නොවිධිමත් අධ්‍යාපන හා විශේෂ අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීම
- විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති දරුවන්ට ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා සම අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම
- පිරිවෙන් සඳහා මූලික පහසුකම් සැපයීම
- සියලු පාසල් දරුවන්ට තම පාසල් ආරක්ෂාව හා රැකවරණය සහිත පාසල් ලෙස සහතික කළ හැකි වීම
- පාසල්වලින් ශාරීරික දඬුවම් දීමේ ක්‍රමය තුරන් වී තිබීම
- ආපදා හා අවදානම් කළමනාකරණය ශක්තිමත් වීම
- පාසල් පෙළපොත්, පාසල් නිල ඇඳුම්, අවශ්‍ය සිසුන් සඳහා දිවා ආහාර හා ශිෂ්‍යත්ව හා ශිෂ්‍යාධාර සැපයීම වැනි ඉල්ලුම මත පදනම් වූ අධ්‍යාපන සුභසාධනමය කාර්යයන් පවත්වා ගෙන යාම හා නිසි වේලාවට අදාළ ප්‍රතිලාභීන්ට එම සේවාවන් සැපයී තිබීම
- සියලු පාසල් ආවරණය වන පරිදි පාසල් සෞඛ්‍යය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වීම

**තේමාව 2 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

- වැඩ ලෝකයෙහි ඉල්ලුමට සරිලන පරිදි හා නිපුනතා අත්පත් කරගැනීම් තහවුරු වන පරිදි ජාතික විෂයමාලාව ප්‍රතිසංස්කරණය වීම හා යාවත්කාලීන වීම
- පළමු බසින් අධ්‍යාපනය ලැබීම සහතික වීම
- ශිෂ්‍යයන්ගේ විභව්‍යතාව අනුව ගණිතය හා විද්‍යාව විෂයමාලාව විවිධාංගිකරණය වීම
- ද්විභාෂා අධ්‍යාපනය සඳහා විෂය අන්තර්ගතය හා භාෂා සමෝධානික රාමුවක් ස්ථාපිත කිරීම
- සෑම ද්වීතියික පාසලකම අවම වශයෙන් ක්‍රීඩා තුනක්වත් සිසුන් සඳහා හඳුන්වා දීම
- ආයතනික ගුරු සංවර්ධන රාමුවක් අධ්‍යාපන පද්ධතිය තුළ ස්ථාපිත වීම
- අ.පො.ස. (සා.පෙළ) යටතේ ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි හා මවු බස ( සිංහල සහ දෙමළ ) විෂයයන් සඳහාත් අ.පො.ස. (උ.පෙළ) යටතේ රසායන විද්‍යාව,භෞතික විද්‍යාව,ගණිතය හා ජීව විද්‍යාව සඳහාත් කලා හා වාණිජ විෂය ධාරාවන්ගෙන් තෝරා ගත් විෂයයන් සඳහාත් අයිතම ප්‍රතිචාරාත්මක විශ්ලේෂණ 2016 වන විට ප්‍රකාශයට පත් කිරීම
- 2010 වන විට 22.5% වූ විද්‍යා විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වන විට 40% ක් දක්වා ඉහළ ගොස් තිබීම

♦ 2010 වන විට 25.2% වූ වාණිජ විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වන විට 35% ක් දක්වා ඉහළ ගොස් තිබීම

♦ 2010 වන විට 52.3% වූ කලා විෂය ධාරාවෙන් පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වන විට 25% ක මට්ටමක පැවතීම

♦ ප්‍රාථමික හා ද්විතීයික ශ්‍රේණිවල සිසුන්ගේ ප්‍රාප්ති මට්ටම් මැනෙන පරිදි ජාතික ඇගයීම් ක්‍රමවේදය මූලික ව ක්‍රියාත්මක වීම

♦ අඩු සාධන මට්ටම් සහිත සිසුන්ගේ ඉගෙනුම් අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විශේෂ ඉගැන්වීම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක වීම හා ඊට අදාළ පහසුකම් සැපයීම

♦ පාසල් පෙළපොත්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා නිරීක්ෂණ කණ්ඩායම් කටයුතු කිරීම හා අදාළ පෙළපොත් 100% ක් ඒ අනුව සුදුසු වීම

♦ පාසල්වල ජාතික සමාජ ඒකාග්‍රතා වැඩසටහන ප්‍රවර්ධනය වීම

♦ ප්‍රමිති හා තත්ත්ව වැඩසටහන් විමර්ශනය කිරීම හා යාවත්කාලීන කොට සියලු ම පළාත්වල මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**තේමාව 3 : අධ්‍යාපනයේ යහපාලනය හා සේවා සැපයීම් ශක්තිමත් කිරීම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

♦ පාසල් නගා සිටුවීමේ වැඩසටහනේ අදාළ පියවර සම්පූර්ණ වීම හා පාසල් සංවර්ධනය සඳහා සැලසුම්කරණය, සැලසුම් යාවත්කාලීන කිරීම ආදී ක්‍රියාවලි අඛණ්ඩ ව ක්‍රියාත්මක වීම

♦ පාසල් සංවර්ධනය සඳහා පාසල් සංවර්ධන සමිති, පාසල් සංවර්ධන කමිටු හා පාසල් කළමනාකරණ කමිටු සංවර්ධනය කිරීම, ස්ථාපිත කිරීම හා ඊට අදාළ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වීම

♦ පාසල් වෙත තීරණ ගැනීමේ බලතල හා අධිකාරීත්වය මුදා හැරීම

♦ සියලු ම ප්‍රාථමික පාසල්වල ළමා මිතුරු ප්‍රවේශය ශක්තිමත් ව තිබීම

♦ වෘත්තීය පලපුරුද්ද සහිත ගුරු අධ්‍යාපනඥයින්ගේ සේවාව පද්ධතියට ලැබීම

♦ වෘත්තීයමය පලපුරුද්ද හා කුසලතාවන්ගෙන් හෙබි විදුහල්පතිවරුන් සේවයේ නියුක්ත වීම

♦ වෘත්තීමය සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගි වන විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම

♦ කලාප අධ්‍යාපන කාර්යාල, කළමනාකරණ / පරිපාලන ඒකක ලෙසත්, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල, අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ඒකක ලෙසත් ශක්තිමත් ව ක්‍රියාත්මක වීම

**පදනම් තේමාව : අධ්‍යාපන ආංශික සංවර්ධන පෙරළුම් සැලැස්ම**

**අපේක්ෂිත ප්‍රතිඵල**

♦ තොරතුරු හා දත්ත මත පදනම් වූ අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම්කරණ සංස්කෘතියක් ස්ථාපිත වී තිබීම

♦ අධ්‍යාපන ආංශික ක්‍රමෝපායික පෙරළුම් සැලැස්ම හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම හා යාවත්කාලීන කිරීම

♦ ශිෂ්‍යයින්ගේ ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම් මැනෙන ජාතික ඇගයීම් ක්‍රමවේදයක්, ප්‍රාථමික අවධිය (4 ශ්‍රේණිය : මවු භාෂාව, ගණිතය හා ඉංග්‍රීසි විෂයයන් සඳහා) හා ද්විතීයික අවධිය (8 ශ්‍රේණිය : ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන් සඳහා) අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම හා ඉන් අනාවරණය වන තොරතුරු අධ්‍යාපන සංවර්ධනය සඳහා යෙදවීම

♦ අධ්‍යාපන පුනරාවර්තන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ක්‍රියාවලි සඳහා 2011 දී වෙන් වූ 3.2% ක් වූ ප්‍රතිපාදනය 2016 වන විට 4.2% ක් දක්වා ක්‍රමික ව වැඩි වී තිබීම

♦ අධ්‍යාපන ප්‍රාග්ධන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ හා ප්‍රාග්ධන යෙදවුම් සඳහා 2011 දී වෙන් වූ 42% ක් වූ ප්‍රතිපාදනය 2016 වන විට 42.8% ක් දක්වා වැඩි වී තිබීම

♦ අධ්‍යාපන ප්‍රාග්ධන අයවැයෙන් උසස් මට්ටමේ ඉගෙනුම් ඉඩකඩ හා ප්‍රාග්ධන යෙදවුම් නඩත්තු හා නවීකරණය සඳහා 2011 දී වෙන් වූ 15% ක් වූ ප්‍රතිපාදනය 2016 වන විට 17% ක් දක්වා වැඩි වී තිබීම

♦ පාසල් අධ්‍යාපනය හා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ක්ෂේත්‍ර අතර මනා අන්තර් ආංශීය සම්බන්ධතාවක් ස්ථාපනය වී තිබීම

මෙම වැඩසටහනට අදාළ ප්‍රතිඵල පාදක නියාමනය සඳහා ඇගයීම් රාමුවක් සකස් කර ශක්තිමත් ව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.

# 03. මූල්‍යකරණය

## 3.1 2015 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා මූල්‍ය වෙන්කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වෙනුවෙන් 2015 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව පුනරාවර්තන වියදම් සඳහා රු. මිලියන 44,238 ක් වෙන් ව තිබිණි. 2015 වර්ෂය අවසන් වන විට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට පැවරී තිබුණ රාජ්‍ය අමාත්‍යාංශය හා සියලු ම දෙපාර්තමේන්තු හා ආයතනවල මූල්‍ය වෙන්කිරීම් ද මීට ඇතුළත් ය.

**3.1.1. වගුව : පුනරාවර්තන වියදම් - 2015**

| විස්තරය | 2015 ඇස්තමේන්තුව රු.මි. |
|---|---|
| වැටුප් සහ වේතන | 11,256.00 |
| වෙනත් දීමනා සහ ගමන් වියදම් | 10,941.90 |
| සැපයීම් නඩත්තු හා පොදු සේවා | 648.25 |
| පාසල් පෝෂණ වැඩසටහන | **3,500.00** |
| කිරි වීදුරුවක් ලබාදීම | **335.00** |
| පාසල් පෙළපොත් | **3,000.00** |
| පාසල් හා පිරිවෙන් නිල ඇඳුම් | **2,684.00** |
| පොදු පහසුකම් | **277.00** |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර | **325.00** |
| දුෂ්කර හා අතිදුෂ්කර පාසල් සිසුන්ට සපත්තු ලබා දීම | **600.00** |
| පිරිවෙන් අධ්‍යාපනය | **3,355.30** |
| පාසල් ක්‍රීඩා උළෙල | **17.00** |
| ආබාධිත සිසුන් සඳහා අධ්‍යාපනය | **211.50** |
| උපකෘත පාසල් සඳහා ආධාර | 1,245.00 |
| ජාතික අධ්‍යාපන ආයතනය | **338.00** |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 960.40 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | **3,030.40** |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 55.40 |
| ජාතික පුස්තකාල සේවා මණ්ඩලය | 110.00 |
| ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 252.20 |
| ජාතික උරුම රැක ගැනීම | 66.93 |
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | **850.50** |
| ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | **99.30** |
| **එකතුව** | **44,238.39** |

## 3.2 ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය වෙන්කිරීම්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියලු ආයතනවල ප්‍රාග්ධන වියදම් සඳහා 2015 වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුව අනුව රු. මිලියන 17,895 ක් වෙන් ව තිබුණි. සියලු විදේශාධාර වැඩසටහන් ද මේ යටතට ඇතුළත් වේ. 2015 වර්ෂය අවසන් වන විට අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගැනුණු සියලු ම දෙපාර්තමේන්තු හා ආයතන ද මීට ඇතුළත් ය.

**3.2.1. වගුව : මූලධන වියදම් - 2015**

| | විස්තරය | 2015 ඇස්තමේන්තුව රු.මි. |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය හා පරිපාලන කාර්යයන් | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා නඩත්තුව | 51.00 |
| | ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් | 199.50 |
| | කාර්ය මණ්ඩල පුහුණුව | 1.60 |
| | පාසල් පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 55.00 |
| | දුෂ්කර පාසල් සඳහා ලිබඩු | 100.00 |
| | ජාතික අධ්‍යාපන ආයතනය | 333.00 |
| ප්‍රාථමික අධ්‍යාපනය | ප්‍රාථමික පාසල් සංවර්ධනය | 111.80 |
| | ආරක්ෂක සේවා විද්‍යාල | 40.00 |
| | ආදර්ශ ප්‍රාථමික පාසල් | 79.90 |
| ද්විතීයික අධ්‍යාපනය | ද්විතීයික පාසල් සංවර්ධනය | 1572.00 |
| | ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි | 19.50 |
| | ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය | 5978.09 |
| | දුෂ්කර පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් | 78.00 |
| | තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන | 150.47 |
| | ක්‍රීඩා පාසල් | 25.00 |
| | අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන | 5180.00 |
| | පාසල් පුස්තකාල සංවර්ධනය | 5.00 |
| විශේෂ අධ්‍යාපනය | විශේෂ අධ්‍යාපනය | 32.00 |
| | පිරිවෙන් අධ්‍යාපනය | 296.00 |
| | ආබාධිත සිසුන්ගේ අධ්‍යාපනය | 3.00 |
| | විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන | 20.00 |
| | චිත්‍රා ලේන් පාසල් | 10.00 |
| ගුරු සංවර්ධනය | ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 95.42 |
| | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 852.00 |
| | දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය | 385.00 |
| | පළාත්බද ගුරු පුහුණු වැඩසටහන | 25.00 |
| සාමාන්‍ය අධ්‍යාපනය හා සංවර්ධන ව්‍යාපෘති | යුනෙස්කෝ ක්‍රියාකාරකම් | 4.69 |
| | දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය (ආ.සං.බැ.ආධාර) | 15.80 |
| | දැනුම් ආර්ථිකය උදෙසා මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ලෝක බැ.) | 1100.00 |
| | යුනිසෙෆ් ආධාර ලද පුහුණු වැඩසටහන් | 7.15 |
| | සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපනය (ජී.අයි.ඉසෙඩ් ආධාර) | 160.00 |
| | දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය (යුනෙස්කෝ) | 69.93 |
| | ගුරු පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම (ජී.ඕ.එස්.එල්.) | 230.00 |
| | ත්‍රිභාෂා ගුරු සංවර්ධන වැඩසටහන් (ජයිකා ආධාර) | 40.00 |
| ජාතික උරුමයන් | වවර්හෝල් පදනම | 12.00 |
| | ජන කලා කේන්ද්‍රය | 10.00 |
| | ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය | 7.00 |
| | "දැයේ උරුමය දරුවන්ටයි" වැඩසටහන | 3.00 |
| | වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම | 25.00 |
| | ආදිවාසීන් සුරැකීම | 9.10 |
| | Broton බංගලාව අලුත්වැඩියා කිරීම | 4.50 |
| | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 165.75 |
| | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 55.90 |
| | ජාතික උරුම රැකගැනීම | 176.40 |
| | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | 150.50 |
| එකතුව | | 17,895.00 |

## 3.3 දේශීය හා විදේශීය ආධාර ආයෝජන

අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන සඳහා දේශීය හා විදේශීය මූල්‍ය ආයෝජනය 2015 දී පහත පරිදි විය.

**3.3.1. වගුව : දේශිය හා විදේශීය මූල්‍ය—2015**

| මූල්‍ය ප්‍රභවය | රු.මි. |
|---|---|
| දේශීය අරමුදල් | 60,375 |
| ලෝක බැංකුව | 1,230 |
| යුනෙස්කෝ | 5 |
| ආසියානු සංවර්ධන බැංකුව | 16 |
| කොරියානු රජය - KOICA | 230 |
| ජර්මානු රජය - GIZ | 160 |
| යුනිසෙෆ් | 77 |
| ජපාන රජය - JICA | 40 |
| එකතුව | 62,233 |

## 3.4 දැනුමැති සමාජයක් සඳහා වූ අධ්‍යාපන ව්‍යාපෘතිය - ආසියානු සංවර්ධන බැංකු ආධාර
## Education for Knowledge Society Project (EKSP) - ADB Funded

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ 2007 දී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේ දී අවසන් විය. මෙම ව්‍යාපෘතියේ මැදිහත්වීම හරහා අධ්‍යාපන පද්ධතියට ඇති වූ බලපෑම සොයා බැලීම සඳහා 2015 වර්ෂයේ අධ්‍යයනයක් සිදු කර එහි වාර්තාව එළි දක්වා ඇත. එහි සඳහන් ප්‍රධාන තොරතුරු කිහිපයක් මෙහි දැක්වේ.

**3.4.1.** වගුව : ව්‍යාපෘති දායකත්වය හරහා එම පාසල්වල එක් එක් ක්ෂේත්‍රයට වූ බලපෑම පිළිබඳ ව ගුරුවරුන්ගේ අදහස ප්‍රතිශතයක් ලෙස

| අංශය | ඉතා හොඳයි | හොඳයි | දුර්වලයි |
|---|---|---|---|
| පාසල් කළමනාකරණය | 55.4 | 44.6 | 0 |
| ගුරු වෘත්තීය කුසලතා | 30.4 | 67.4 | 2.2 |
| ගුරුවරුන්ගේ පෙළඹීම | 45.0 | 49.6 | 5.4 |
| යටිතල පහසුකම් | 40.0 | 48.1 | 11.9 |
| පාසල් ප්‍රජා සබඳතා | 52.7 | 40.8 | 6.5 |
| ශිෂ්‍ය තොරතුරු තාක්ෂණ කුසලතා | 30.7 | 63.1 | 6.7 |
| ශිෂ්‍ය ඉංග්‍රීසි කුසලතා | 8.6 | 72.6 | 18.8 |
| HIV/ඒඩ්ස් පිළිබඳ දැනුම්වත් බව | 11.15 | 52.0 | 36.5 |
| ශිෂ්‍යයන්ගේ පෙළඹීම | 12.8 | 80.2 | 7.0 |
| ශිෂ්‍ය පැමිණීම | 38.1 | 57.6 | 4.3 |
| ශිෂ්‍ය යහපැවැත්ම | 37.0 | 61.5 | 1.5 |

මූලාශ්‍රය : Project Impact Evaluation Report, 2015

**3.4.2. වගුව : ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කළ පාසල්වල පන්ති කාමර ක්‍රියාවලිය සංවර්ධනය සම්බන්ධයෙන් ශිෂ්‍ය අදහස්**

| ක්ෂේත්‍රය | අදහස් දැක්වූ ශිෂ්‍ය ප්‍රතිශතය | | |
|---|---|---|---|
| | විශිෂ්ටයි | හොඳයි | දුර්වලයි |
| ගුරු කැපවීම | 46.6 | 48.7 | 4.7 |
| පන්ති කාමර පහසුකම් | 12.2 | 54.6 | 33.2 |
| තොරතුරු තාක්ෂණ භාවිතය | 25.2 | 52.8 | 22.0 |


මූලාශ්‍රය : Project Impact Evaluation Report, 2015

ව්‍යාපෘතිය විසින් ලබා දුන් පහසුකම් හා පුහුණුවීම් හරහා ගුරුවරුන්ගේ කැපවීම ඉතා ඉහළ මට්ටමකට පැමිණ ඇති බව ශිෂ්‍යයින්ගේ අදහස්වලින් පැහැදිලි වේ. ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ව ගුරු පුහුණුව සම්බන්ධයෙන් ගුරුවරුන් දැක්වූ අදහස් ද පහත වගුවේ දක්වා ඇත.


**3.4.3. වගුව : පන්ති කාමර ඉගැන්වීම් සඳහා පුහුණු වැඩසටහන්වල ප්‍රායෝගික බව පිළිබඳ ගුරුවරුන්ගේ අදහස්**

| විෂයය | ඉතා ඉහළයි | ඉහළයි | දුර්වලයි |
|---|---|---|---|
| ඉංග්‍රීසි | 28.6 | 66.1 | 5.4 |
| තොරතුරු තාක්ෂණය | 16.7 | 72.2 | 11.1 |

**3.4.1. ප්‍රස්ථාරය: ව්‍යාපෘති දායකත්වය ලබා දුන් පාසල් 100හි ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය**




**3.4.2. ප්‍රස්ථාරය: 12 - 13 ශ්‍රේණිවල ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය**





මූලාශ්‍රය : Project Impact Evaluation Report, 2015

ඉහත ක්‍රියාකාරකම්වලට අනුව 6-11 ශිෂ්‍ය සංඛ්‍යාව 28% කින් ද, 12-13 ශිෂ්‍ය සංඛ්‍යාව 74% කින් ද වර්ධනය වී ඇති බව පෙනී යයි.

ව්‍යාපෘතියට අයත් පාසල්වල අ.පො.ස.(උ.පෙළ) සමත් ප්‍රතිශතය ද 2010න් පසු වර්ධනය වී ඇති බව පෙනේ

**3.4.3. ප්‍රස්ථාරය: පාසල් 100හි අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල**



## 3.5 දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීම (TSEP) - ලෝක බැංකු ආධාර ලද වැඩසටහන්

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනේ තේමාවන් යටතේ දැනුම් ආර්ථිකය උදෙසා මානව ප්‍රාග්ධන පදනම ලෙස පාසල් පද්ධතිය පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය ලෝක බැංකු හා ඔස්ඒඩ් ආධාර මත ක්‍රියාත්මක වේ.
මුදල් ප්‍රතිපාදන නිදහස් කිරීම ඒ සඳහා හඳුනාගෙන ඇති කාර්යසාධන දර්ශක (DLI) වල ප්‍රගතිය මත සිදුකෙරේ.

**තේමාව 1 : ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා ප්‍රවේශය සහ සහභාගිත්වය ඉහළ නැංවීම**

- ප්‍රාථමික හා ද්විතීයික පාසල්වල ඉගෙනුම් පරිසර වැඩිදියුණු කිරීමේ කඩිනම් වැඩසටහන යටතේ ප්‍රාථමික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය, විදුහල්පති පුහුණුව හා ඉගෙනුම් ද්‍රව්‍ය සැකසීම
- ද්විතීයික පාසල්වල මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම තුළින් ඉංග්‍රීසි, ගණිතය, විද්‍යාව, තොරතුරු තාක්ෂණ ඉගෙනුම් අවස්ථා සම්පාදනය
- ප්‍රාථමික හා ද්විතීයික ඉගෙනුම් අවධිවල ශිෂ්‍යයින් රඳවා තබා ගැනීම සඳහා පාසල් කළමනාකරණ කමිටු පිහිටුවීම
- නොවිධිමත් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම
- විශේෂ අධ්‍යාපන අවස්ථා සහිත දරුවන් උදෙසා පහසුකම් වැඩි කිරීම
- පාසල් තුළ දරුවන් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන හා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ක්‍රමවත් වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා පිහිටුවීම

**තේමාව 2 : අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනය**

- 4 වන ශ්‍රේණියේ සිසුන්ගේ පළමු බස, ඉංග්‍රීසි හා ගණිතය සාධන මට්ටම පිළිබඳ ජාතික ඇගයීම
- 8 වන ශ්‍රේණියේ සිසුන්ගේ ඉංග්‍රීසි, ගණිතය හා විද්‍යාව සාධන මට්ටම පිළිබඳ ජාතික ඇගයීම
- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන
- ද්විභාෂා අධ්‍යාපනය සඳහා විෂය අන්තර්ගතය හා භාෂා සමෝධානික ඉගෙනීම් රාමුවක් පිළියෙල කිරීම
- විෂය මාලාව විවිධාංගීකරණය හා වැඩි දියුණු කිරීම
- පාසල් පෙළපොත්වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම
- සමාජ සංහිදියාව ප්‍රවර්ධනය
- ප්‍රධාන විභාගවලට අදාළ ප්‍රතිඵල විශ්ලේෂණ, අධ්‍යාපන සංවර්ධනය සඳහා යොදා ගැනීම
- ප්‍රමිති හා තත්ත්ව තහවුරු කිරීමේ වැඩසටහන නවීකරණය හා ව්‍යාප්තිය

**තේමාව 3: යහපාලනය හා අධ්‍යාපන සේවා සැපයුම**

- පාසල් නගා සිටුවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- විදුහල්පති නායකත්ව හා කළමනාකරණ පුහුණුව
- පාසල් සංවර්ධන කමිටු සහ පාසල් කළමනාකරණ කමිටුවල ධාරිතා වර්ධනය
- පළාත්, කලාප හා කොට්ඨාස මට්ටමේ අධ්‍යාපන කළමනාකරණය ශක්තිමත් කිරීම

**3.5.1.** වගුව : 2015 වර්ෂයේ මුදල් වෙන්කිරීම—TSEP

| වැඩසටහන | රු.මි. |
|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදිකිරීම් | 432 |
| ලී බඩු උපකරණ | 10 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 78 |
| එකතුව | 520 |

**3.5.2. වගුව :** TSEP ව්‍යාපෘතිය මඟින් එක් එක් විෂය ක්ෂේත්‍ර සඳහා ලබා දුන් දායකත්වය

| වැඩසටහන | රු.මි. |
|---|---|
| ද්විතීයික පාසල් 1000 වැඩසටහන -ගොඩනැගිලි ඉදිකිරීම්<br>-උපකරණ | 17.8<br>2.0 |
| ගුරු අධ්‍යාපනය-විද්‍යාපීඨ ඉදිකිරීම් | 3.1 |
| ජාතික පාසල්-සනීපාරක්ෂක පහසුකම්<br>- ගොඩනැගිලි අලුත්වැඩියා<br>-විද්‍යාගාර පහසුකම් | 199.2<br>102.0<br>280.0 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව- විභාග විශ්ලේෂණ වාර්තා සැකසීම | 8.9 |
| ගුරු අධ්‍යාපනය-පාසල් පාදක ගුරු සංවර්ධනය | 5.0 |
| ද්විභාෂා අධ්‍යාපනය-විෂය භාෂා සමෝධානික වැඩසටහන | 2.0 |
| පාසල් කටයුතු-පාසල් නඟාසිටුවීමේ වැඩසටහන | 1.0 |
| මානව සම්පත් සංවර්ධනය-කලාප හා කොට්ඨාස සවිබල ගැන්වීම | 1.0 |
| විද්‍යා අධ්‍යාපනය | 1.5 |
| ගණිත අධ්‍යාපනය | 3.2 |
| මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 7.1 |
| නිලධාරීන් හා විදුහල්පතිවරුන් සඳහා විදේශ පුහුණුව | 41.7 |
| ඉංග්‍රීසි අධ්‍යාපනය | 1.2 |
| සැලසුම් සම්බන්ධීකරණ උපදෙස් සංග්‍රහය මුද්‍රණය | 1.0 |
| සාම අධ්‍යාපනය | 0.5 |
| ජාතික තක්සේරුකරණ වැඩසටහන<br>- 8 වන ශ්‍රේණියේ ශිෂ්‍ය සාධනය පිළිබඳ ජාතික ඇගයීම<br>- 4 වන ශ්‍රේණියේ ශිෂ්‍ය සාධනය පිළිබඳ ජාතික ඇගයීම | <br>3.5<br>6.5 |
| තොරතුරු හා තාක්ෂණ සංනිවේදන අධ්‍යාපනය | 3.5 |
| දත්ත කළමනාකරණය | 1.3 |
| ජාතික අධ්‍යාපන ආයතනය - විෂයමාලා සංවර්ධනය | 65.0 |
| අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව-ගුණාත්මක පෙළපොත් සම්පාදනය | 20.0 |

**3.5.3. වගුව :** DFAT (මීට පෙර Aus AID ) ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන වැය කළ විෂය ක්ෂේත්‍ර

| වැඩසටහන | රු.මි. |
|---|---|
| විශේෂ අධ්‍යාපනය | 0.8 |
| නොවිධිමත් අධ්‍යාපනය | 0.8 |
| පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන | 2.0 |
| ප්‍රාථමික අධ්‍යාපනය | 2.0 |
| ඉංග්‍රීසි අධ්‍යාපනය | 0.8 |
| විද්‍යා අධ්‍යාපනය-විදේශ අධ්‍යාපන චාරිකා | 3.7 |
| සාම අධ්‍යාපනය හා සමාජ සංහිඳියාව | 2.0 |
| වෘත්තීය මාර්ගෝපදේශන සහ උපදේශනය | 2.7 |
| වතු පාසල් සංවර්ධනය | 1.0 |
| ගුණාත්මක ප්‍රමිති තහවුරුව | 2.0 |
| ජාතික පාසල් විභාග සම්මන්ත්‍රණ | 2.0 |
| අධ්‍යාපන පර්යේෂණ | 1.0 |
| සැමට අධ්‍යාපනය | 1.0 |
| භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය | 1.4 |
| ප්‍රතිපත්ති සැලසුම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් | 5.6 |
| ජාතික පාසල් සඳහා ප්‍රදාන | 350.1 |
| දෙනුවර මිතුරෝ සහ සෙනෙහසක තක්සලාව වැඩසටහන් | 1.2 |
| ජාතික අධ්‍යපන ආයතනය - විෂයමාලා සංවර්ධනය | 45.0 |

මෙම මූල්‍ය දායකත්වය යටතේ සිදු කළ වැඩසටහන් පිළිබඳ විස්තර අදාළ විෂයය යටතේ දක්වා ඇත.

## 3.6 අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන - ආසියානු සංවර්ධන බැංකු ආධාර (ESDP/ ADB)

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනට මූල්‍ය ශක්තියක් ලබාදෙමින් ආසියානු සංවර්ධන බැංකු ආධාර ලබන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) ක්‍රියාත්මක කිරීම 2014 වර්ෂයේ ආරම්භ කරන ලදි.

වැඩසටහනේ කාල සීමාව - 2013 - 2017
සමස්ත ආයෝජනය - ඇ.ඩො.මි. 200

ව්‍යාපෘති ප්‍රවේශයෙන් බැහැර ව ප්‍රතිඵල පාදක මූල්‍යකරණ ක්‍රමවේදය ඔස්සේ ආසියානු සංවර්ධන බැංකු ආධාර මුදල් ආයෝජනය මෙම වැඩසටහනේ විශේෂත්වයයි.

මේ සඳහා රජය හා ආසියානු සංවර්ධන බැංකුව එකඟතාවකින් යුතු ව මුදල් ආයෝජනය හා බැඳි ප්‍රතිඵල 9 ක් හඳුනාගෙන ඇත. (Disbursement Linked Results)

1. අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ඉහළ යාම
2. අ.පො.ස. (උ.පෙළ) ප්‍රතිඵල ඉහළ යාම
3. අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණ විෂයධාරාව ක්‍රියාත්මක වීම
4. කලා, වාණිජ හා විද්‍යා විෂයධාරා තුන ම ඇතුළත් වන සේ ද්විතීයික පාසල් උසස් කිරීම
5. අ.පො.ස. (උ.පෙළ) විද්‍යා ශිෂ්‍ය ඇතුළත්වීම ඉහළ යාම
6. අ.පො.ස. (උ.පෙළ) වාණිජ ශිෂ්‍ය ඇතුළත්වීම ඉහළ යාම
7. විදුහල්පතිවරුන්ගේ හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතාව ඉහළ යාම
8. මධ්‍යම හා පළාත් මට්ටමේ ආයතනික ධාරිතා මෙන් ම ESDFP මූල්‍යකරණය ශක්තිමත් වීම
9. ඉහළ විනිවිද භාවයෙන් යුත් කාර්යක්ෂම ප්‍රසම්පාදන ක්‍රියාවලියක්

මෙම ප්‍රතිඵල මැන බැලීම සඳහා ප්‍රතිඵල පාදක දර්ශක (Disbursement Linked Indicators) 33ක් හඳුනාගෙන ඇත.

2015 වර්ෂය සඳහා රු.මි. 5,180 ක් මේ යටතේ වෙන් ව තිබූ අතර අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

**3.6.1. වගුව :** මුදල් වෙන් ව තිබූ ආකාරය - ESDP

| වැඩසටහන | වෙන් කළ මුදල රු.මි. |
|---|---|
| ගොඩනැගිලි අලුත්වැඩියා | 50 |
| ලී බඩු හා උපකරණ | 710 |
| නව ගොඩනැගිලි | 4,020 |
| ධාරිතා සංවර්ධනය | 400 |
| එකතුව | 5,180 |

**3.6.2.** වගුව : එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා ව්‍යාපෘතියේ දායකත්වය

| වැඩසටහන | රු.මි. |
|---|---|
| මානව සම්පත් සංවර්ධනය | 27.1 |
| විද්‍යා අධ්‍යාපනය | 8.0 |
| ගණිත අධ්‍යාපනය | 8.4 |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය | 19.6 |
| තාක්ෂණ අධ්‍යාපනය | 37.1 |
| වාණිජ හා ව්‍යාපාර අධ්‍යාපනය | 11.3 |
| ද්විතීයික පාසල් 1000 වැඩසටහන | 32.0 |
| කළමනාකරණ හා ප්‍රමිති තහවුරුව | 2.0 |
| නියාමන කාර්යයන් | 1.6 |
| විෂය සමගාමී කටයුතු හා සාම අධ්‍යාපනය | 1.1 |
| ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 16.6 |
| ගුරු සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම | 9.0 |
| ආගමික හා සාරධර්ම අධ්‍යාපනය | 2.8 |
| ජාතික අධ්‍යාපන ආයතනය | 50.0 |
| විවිධ අවශ්‍යතා | 1.5 |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හරහා ක්‍රියාත්මක වැඩසටහන් | 172.0 |
| තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීම් | 4020.0 |
| 1AB බවට උසස් කරන ලද පාසල්වල වැඩිදියුණු කිරීම් | 0.50 |
| ලී බඩු උපකරණ මිල දී ගැනීම් | 710.0 |

මෙම මූල්‍ය දායකත්වය යටතේ සිදු කළ වැඩසටහන් පිළිබඳ විස්තර අදාළ විෂයය යටතේ දක්වා ඇත.

## 3.7 UNICEF ආධාර ලද වැඩසටහන්

### 2015 ලද ප්‍රතිපාදන රු.මි. 7.15

සැමට අධ්‍යාපනය : අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ උපකරණ කට්ටලය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පළාත්වල ගුරු පුහුණුව

: සැමට අධ්‍යාපනය ඇගයීම් වාර්තාව සකස් කිරීම

ප්‍රාථමික අධ්‍යාපනය : ප්‍රාථමික ගුරුවරුන්ගේ හා නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

ගුරු සංවර්ධනය : ළමා මිතුරු ප්‍රවේශය හා පාසල් පාදක ගුරු සංවර්ධනය ගුරු අධ්‍යාපන ආයතනය වෙත හඳුන්වා දීම

ගුණාත්මක තත්ත්ව තහවුරුව : විදුහල්පතිවරුන් හා ගුරුවරුන් සඳහා නිපුනතා සකස් කිරීම

## 3.8 ජයිකා ( JICA) ආධාර ලද ත්‍රෛභාෂීය ශ්‍රී ලංකාවක් සඳහා භාෂා ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වූ වැඩසටහන

**2015 ලද ප්‍රතිපාදන රු.මි. 40.0**

**ක්‍රියාකාරකම්**

ප්‍රාථමික අධ්‍යාපනය : ගුරු උපදේශකවරුන්ගේ ධාරිතා සංවර්ධනය

ජාතික භාෂා : 6-9 ශ්‍රේණි සඳහා දෙවන භාෂාව ලෙස දෙමළ හා සිංහල ඉගෙනුම් ක්‍රමවේද වැඩිදියුණු කිරීම

තොරතුරු තාක්ෂණය : ඉ.තක්සලාව ඉගෙනුම් අන්තර්ගතය සංවර්ධනය

: නැණසැස අධ්‍යාපන සේවය සඳහා මොඩියුල සකස් කිරීම

ද්විභාෂා අධ්‍යාපනය : විෂය ගුරුවරුන් ද්විභාෂා ඉගැන්වීම සඳහා සංවර්ධනයඉ.තක්සලාව ඉගෙනුම් අන්තර්ගතය සංවර්ධනය

: ගුරු උපදේශකවරුන්ගේ හා නිලධාරීන්ගේ භාෂා සංවර්ධනය

## 3.9 GIZ ආධාර ලබන සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය

දෙවන ජාතික භාෂා අධ්‍යාපනය

- ගුරු පුහුණු මොඩියුල සකස් කිරීම
- විශිෂ්ට ව්‍යවහාර පිළිබඳ දැනුම්වත් කිරීම
- පුහුණුකරුවන් හා ගුරුවරුන් පුහුණු කිරීම

සාම හා සාරධර්ම අධ්‍යාපනය

- අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු පුහුණුව සඳහා මොඩියුල සකස් කිරීම
- පුහුණුකරුවන්, ගුරු අධ්‍යාපනඥයින්, විදුහල්පතිවරුන් හා ගුරුවරුන් සඳහා සැසි පැවැත්වීම
- ශිෂ්‍ය පාර්ලිමේන්තු අත්පොත නැවත සකස් කිරීම
- දෙනුවර මිතුරෝ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන

ආපදා ආරක්ෂණ කළමනාකරණය

- දේශගුණ විපර්යාස පිළිබඳ ගුරු උපදේශක අත්පොත
- ගුරු හා විදුහල්පති පුහුණුව
- ප්‍රථමාධාර, දේශගුණ විපර්යාස පිළිබඳ ගුරු පුහුණුව
- පාසල් ආරක්ෂාව පිළිබඳ අත්පොත සංශෝධනය
- පාසල් අතර තරගාවලියක් උතුර හා නැගෙනහිර කොට්ඨාස මට්ටමින් පැවැත්වීම

මනෝ සමාජීය අධ්‍යාපනය

- මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම
- විදුහල්පතිවරුන් හා ගුරුවරුන් දැනුම්වත් කිරීම
- අත්දැකීම් බෙදාගැනීමේ සැසි පැවැත්වීම









BWB-07









# 04. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයේ සම සාධාරණ ප්‍රවේශය සහ සහභාගිත්වය සහතික කිරීම

## 4.1 පාසල් සංවර්ධනය

### 4.1.1 “ළඟ ම පාසල හොඳ ම පාසල” ජාතික වැඩසටහන

“ ගුණ නැණ බලයෙන් පොහොසත් නිර්මාණාත්මක හා සෞන්දර්යාත්මක චින්තයෙන් යුත් මානව හිතවාදී දරුවෙකු ගොඩනැඟීම උදෙසා සැමට අධ්‍යාපනයේ සම අවස්ථා ලබා දීම” යන තේමාවෙන් යුත් රජයේ පංචවිධ අධ්‍යාපන ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස “ළඟ ම පාසල හොඳ ම පාසල” ජාතික වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයේ 2016-2020 මධ්‍යකාලීන වැඩසටහනෙහි ප්‍රමුඛ වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පෙර සැලසුම් සකස් කිරීම, පාසල් හඳුනා ගැනීම, පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම, ප්‍රතිපත්තිමය එකඟතාතාවක් එළැඹීම යන මූලික කාර්යයන් 2015 වර්ෂයේ දී ඉටු කරන ලදි. ආරම්භක අවස්ථාව සඳහා පාසල් 580ක් පහත සඳහන් පරිදි තෝරා ගැනෙන අතර පසුව එය වැඩි කිරීමට කටයුතු කෙරේ.

| පළාත | ජාතික පාසල් | පළාත් පාසල් | එකතුව |
|---|---|---|---|
| බස්නාහිර | 1 | 79 | 80 |
| මධ්‍යම | 6 | 60 | 66 |
| දකුණු | 6 | 86 | 92 |
| උතුර | 7 | 36 | 43 |
| නැගෙනහිර | 2 | 72 | 74 |
| වයඹ | 2 | 60 | 62 |
| උතුරු මැද | 1 | 47 | 48 |
| ඌව | 8 | 46 | 54 |
| සබරගමුව | 1 | 60 | 61 |
| එකතුව | 34 | 546 | 580 |

**වැඩසටහනේ අරමුණු**

1. සියලු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස තුළ හඳුනා ගනු ලැබූ පාසල් කේන්ද්‍රීය සපිරි පාසල් ලෙස ප්‍රතිනිර්මාණය කිරීම
2. නාගරික ජනප්‍රිය පාසල් වෙත සිදුවන ශිෂ්‍ය ගලනය අවම කිරීම හා සැමට සම අධ්‍යාපන ප්‍රවේශයකට ඉඩ ප්‍රස්තා සැපයීම
3. ගුණවත්,නැණවත් හා රටේ සංවර්ධන ඉලක්කවලට දායක විය හැකි මනා පෞරුෂත්වයකින් හෙබි සිසු පරපුරක් බිහි කිරීම
4. නව තාක්ෂණ කුසලතාවෙන් සපිරි එකම විශ්ව ගම්මානයක් වූ ලෝකය ජය ගත හැකි පූර්ණ මිනිසෙකු ගොඩනැඟීම
5. පාසල් පාදක කළමනාකරණය සවිබල ගැන්වීම

**අපේක්ෂිත ප්‍රතිඵල**

- මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමෙන් පසු ව දැනට 974 ක් වන 1AB පාසල් සංඛ්‍යාව 1392 ක් දක්වා ඉහළ නැංවනු ඇත
- ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශිය ලේකම් කොට්ඨාසයක් ම ආවර්ණය වන ලෙස තෝරා ගත් පාසල් 650ක් අදියර කිහිපයක් යටතේ සපිරි පාසල් ලෙස ප්‍රතිනිර්මාණය කිරීම
- නාගරික පාසල් කෙරෙහි වන අධික ඉල්ලුම සමනය වීම
- ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් හා කාර්යක්ෂම කළමනාකරණ පද්ධතියක් සහිත අන් පාසල්වලට ආදර්ශ ගත හැකි පාසල් පද්ධතියක් බිහි කිරීම

**ප්‍රධාන සංරචක**

1. භෞතික සම්පත් සංවර්ධනය -
   නවීන පහසුකම්වලින් යුතු පරිසර හිතකාමී ලෙස පන්ති කාමර, පුස්තකාල, පරිපාලන ඒකක, විද්‍යාගාර, ශ්‍රවණාගාර, නිල නිවාස ඇතුළු සියලු පහසුකම් අංග සම්පූර්ණ ලෙස සංවර්ධනය.

2. ගුණාත්මක සංවර්ධනය -
   පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා ඇගයීම් ක්‍රියාවලිය දියුණු කිරීම, මෘදු කුසලතා සංවර්ධනය, විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කිරීම, ක්‍රියාකාරකම් පාදක ව ඉගෙනුමට යොමු කිරීම

3. මානව සම්පත් සංවර්ධනය
   ව්‍යාපෘතියට අයත් පාසල්වල ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා සියලු ම කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පුහුණුවක් ලබා දීම, තෝරා ගනු ලබන විදුහල්පතිවරුන් සඳහා විදේශ පුහුණුවක් ලබා දී පසුවිපරම් ක්‍රියාවලිය මඟින් අධීක්ෂණය කිරීම

4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත සේවාවන් ගොඩනැංවීම
   පාසල්වල සියලු ම තොරතුරු යාවත්කාලීන කර විශ්ලේෂණ හා සන්නිවේදනය කළ හැකි වන පරිදි තොරතුරු පද්ධතියක් ගොඩ නැංවීම

### 4.1.2 ද්විතීයික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය

2012 වර්ෂය තුළ ආරම්භ කරන ලද ද්විතියික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම් හා තාක්ෂණික පීඨ ඉදිකිරීම් සම්බන්ධ 2015.12.31 ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

- තාක්ෂණික විද්‍යාගාර 1005ක් ඉදිකිරීම
  තාක්ෂණික විද්‍යාගාර 982ක් ඉදිකර අවසන් අතර විද්‍යාගාර 940ක් සඳහා ගෘහ භාණ්ඩ හා පරිගණක සපයා ඇත. ඒවා සිසුන් විසින් භාවිත කරනු ලැබේ.
- තාක්ෂණික පීඨ 251ක් ඉදිකිරීම
  ඉදිකිරීම් ආරම්භ කරන ලද තාක්ෂණික පීඨ 248කි. පීඨ 172ක ඉදිකිරීම් අවසන් කර උපකරණ ලබා දී ඇත.
- පුහුණු වැඩමුළු පැවැත්වීම
  - "නායකත්වය විශ්වය අභිබවා" යන තේමාව යටතේ විදුහල්පතිවරුන් 450ක් වැඩමුළු 4ක් මඟින් පුහුණු කිරීම
  - කෙටිකාලීන විදේශ පුහුණු පාඨමාලා 3ක් මඟින් විදුහල්පතිවරුන් 83ක් හා අධ්‍යාපන නිලධාරීන් 13 දෙනෙකු පුහුණු කිරීම
  - වැඩමුළු 2ක් සැලසුම් හා සංවර්ධන අධ්‍යක්ෂවරුන් 98 දෙනෙකු සඳහා පැවැත්වීම
  - තාක්ෂණික විද්‍යාගාර ගුරුවරුන් 188 දෙනෙකු හා අධ්‍යාපන නිලධාරීන් 8 දෙනෙකු වැඩමුළු 2ක් මඟින් පුහුණු කිරීම

### 4.1.3. ජාතික පාසල් සංවර්ධනය

**ගුණාත්මක සංවර්ධනය**

- පාසල් ළමුන්ගෙන් මුදල් එකතු කිරීම වැළැක්වීම සඳහා 05/2015 චක්‍රලේඛය නිකුත් කර එයට අනුකූල ව සකස් කරන ලද ජාතික පාසල් 271ක අයවැය ඇස්තමේන්තු අනුමත කිරීම
- ද්විතීයික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා උපරිමය රු. 45,600/= ක් වන සේ පාසල් 352 සඳහා ප්‍රතිපාදන ලබා දීම
- ජාතික පාසල් 352හි ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය උදෙසා එක් පාසලකට උපරිමය රු. 1,000,000 බැගින් ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් ව මුලා ප්‍රදාන ලබා දීම
- අ.පො.ස. (උ.පෙළ) සහ අ.පො.ස. (සා.පෙළ) උපකාරක සම්මන්ත්‍රණ පැවැත්වීම

**වෘත්තීය සංවර්ධනය**

- ජාතික පාසල් 151ක විදුහල්පතිවරුන් සඳහා නායකත්ව පුහුණු වැඩමුළු 02ක් පැවැත්වීම

**භෞතික සම්පත් සංවර්ධනය**

- ජාතික පාසල්වල ලීබඩු උපකරණ අලුත්වැඩියා සඳහා එක් පාසලකට උපරිමය රු. 80,000/= ක් වන සේ පාසල් 22 කට උපරිමය 65,340/= ක් වන සේ ඉතිරි පාසල් සඳහා ද ප්‍රතිපාදන වෙන් කිරීම

- විදුහල්පති නිල නිවාස 5ක් හා ගුරු නිවාස 10ක් ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කිරීම
- ජාතික පාසල් 55ක ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා රු.මි. 10 බැගින් වෙන් කිරීම
- ජාතික පාසල්වල තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම් නිමකිරීම හා උපකරණ සැපයීම
- පාසල් 104ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පාසල් ප්‍රදාන ලබා දීම
- පාසල් 140ක විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පාසල් ප්‍රදාන ලබා දීම

### 4.1.4. වතු පාසල් සංවර්ධනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- ♦ වතු පාසල්වල පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සඳහා ගුරු සහ සිසු සහභාගිත්වයෙන් මධ්‍යම පළාතේ වැඩමුළු 14ක්, දකුණු පළාතේ වැඩමුළු 1 ක් හා දෙහිඕවිට කලාපයේ වැඩමුළු 1ක් පැවැත්වීම
- ♦ අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල සංවර්ධනය සඳහා ගුරු සහ සිසු පාදක ව මධ්‍යම පළාතේ වැඩමුළු 44ක්, දකුණු පළාතේ වැඩමුළු 2 ක් හා දෙහිඕවිට කලාපයේ වැඩමුළු 01ක් පැවැත්වීම
- ♦ බදුල්ල සහ පස්සර කලාපවල වතු පාසල් විදුහල්පතිවරුන් සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩමුළුවක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරුන් සඳහා සංවර්ධන රැස්වීම් 1ක් හා හැටන් කලාපයේ සහ මහනුවර දිස්ත්‍රික්කයේ විදුහල්පතිවරුන් සඳහා පාසල් පාදක ගුරු සංවර්ධන වැඩමුළු 02ක් පැවැත්වීම

### 4.1.5. දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය

අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙමළ පාසල් සංවර්ධන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශයේ අනෙකුත් ශාඛා, පළාත් හා කලාප අධ්‍යාපන දෙපාර්තමේන්තු, අනෙකුත් පිළිගත් දේශීය හා විදේශීය සංවිධාන සමග දෙමළ පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කරනු ලබයි.

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- ♦ තෝරා ගත් කලාප 15ක හඳුනාගත් ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් 500කට පාසල් අභ්‍යන්තර ඇගයීම් පිළිබඳ පුහුණුවක් ලබාදීම
- ♦ GIZ ව්‍යාපෘතිය සම්බන්ධීකරණය කරමින් උතුර, නැගෙනහිර, මධ්‍යම, ඌව සහ සබරගමුව පළාත්වල තෝරාගත් ආදර්ශ පාසල් 200ක් සංවර්ධනය කිරීම හා එයට අදාළ කලාප නිලධාරීන් පුහුණු කිරීම

### 4.1.6. මුස්ලිම් පාසල් සංවර්ධනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- ♦ මුස්ලිම් පාසල්වල විදුහල්පතිවරුන්ගේ හා ගුරුවරුන්ගේ නිපුණතා සංවර්ධනය සඳහා පළාත් මට්ටමින් වැඩමුළු 6ක් පැවැත්වීම

## 4.2 පිරිවෙන් අධ්‍යාපනය

**ගුණාත්මක සංවර්ධන වැඩසටහන්**

- ♦ සම්භාෂා ශාස්ත්‍රීය ග්‍රන්ථය සකස් කර පිටපත් 7000ක් මුද්‍රණයට ලබා දීම
- ♦ අධ්‍යාපන කලාප 33ක තෝරා ගත් පිරිවෙන් ගුරුවරුන් සඳහා පැය 100ක දෙමළ භාෂා පුහුණු සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීම
- ♦ දීප ව්‍යාප්ත පිරිවෙන් භාෂා දින වැඩසටහන සිංහල, පාලි, සංස්කෘත හා ඉංග්‍රීසි භාෂා සඳහා පැවැත්වීම
- ♦ සමස්ත ලංකා අන්තර් පරිවේණික භාෂා හා සාහිත්‍ය තරගාවලිය—2015 පැවැත්වීම

- වැඩසටහන් 25ක් මඟින් සිසුන් 3000කට “ආකල්ප හා නායකත්වය” පිළිබඳ පුහුණු කිරීම
- පිරිවෙන් 650ක සහභාගිත්වයෙන් ගණිත දින වැඩසටහන පැවැත්වීම

**භෞතික හා මානව සම්පත් සැපයීම**

- පිරිවෙන් 410ක් වෙත වාර්ෂික වාර්තා පරික්ෂා කොට ආධාර ලබා දීම
- නවක පරිවේණාචාර්ය පත්වීම් 451ක් ලබා දීම
- පරිවේණාධිපති තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම
- විද්‍යායතන පිරිවෙන් 62ක් සඳහා ලී බඩු උපකරණ ලබා දීම
- පිරිවෙන් යටිතල පහසුකම් හා සුළු නඩත්තු කටයුතු වෙනුවෙන් එක් පිරිවෙනකට රු. 260,000 බැගින් ප්‍රතිපාදන ලබා දීම

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- සිසුන් 400 ක් සඳහා ප්‍රාචීන භාෂා සේවාස්ථ පුහුණු වැඩසටහන පැවැත්වීම
- පිරිවෙන් ශාඛාවේ නිලධාරීන් 35 ක් සඳහා පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
- කෘත්‍යාධිකාරී/ හිමිවරුන් 1500 ක් සඳහා තෙදින නේවාසික වැඩමුළුවක් පැවැත්වීම
- විෂයබද්ධ ගුරු උපදේශකවරුන් 98 ක් සඳහා වැඩමුළුවක් පැවැත්වීම
- පළාත් මට්ටමින් දෙදින නේවාසික වැඩමුළුවක් පැවැත්වීම

**4.2.1. වගුව : පිරිවෙන් පිළිබඳ මූලික තොරතුරු - 2015**

| පිරිවෙන් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | | | පරිවේණාචාර්ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | පැවිදි | ගිහි | එකතුව | පැවිදි | ගිහි | එකතුව |
| 749 | 34,652 | 29,954 | 64,606 | 3,124 | 3,371 | 6,495 |

## 4.3 නොවිධිමත් අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- පළාත් හා කලාප නොවිධිමත් අධ්‍යාපන නිලධාරීන් 33ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- නොවිධිමත් අධ්‍යාපන ආදායම් ඉපයීමේ පාඨමාලා යටතේ පාවහන් නිෂ්පාදනය පිළිබඳ උතුරු නැගෙනහිර පළාත් දෙමළ මාධ්‍ය උපදේශකවරුන් 38 දෙනෙකු පුහුණු කිරීම හා බස්නාහිර. දකුණු හා වයඹ පළාත්වල උපදේශකවරුන් 40 දෙනෙකු සඳහා අත්කම් හා විසිතුරු සාරි සැකසීමේ වැඩමුළු පැවැත්වීම.
- ඉගෙනුම් ද්‍රව්‍ය සම්පාදනය කිරීම පිළිබඳ සාක්ෂර පාඨමාලා උපදේශකවරුන් 72ක් පුහුණු කිරීම.
- සාක්ෂර උපදේශකවරුන් 63ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම

- සුනීත විද්‍යාලයේ ඉගෙනුම ලබන බන්ධනාගාරගත නේවාසික සිසුන් 71ක් හා ගුරුවරුන් සඳහා උපදේශන වැඩසටහනක් පැවැත්වීම

- සාක්ෂර පංති සිසුන් 178ක් ඇතුළු 271කගේ සහභාගිත්වයෙන් සාක්ෂර දිනය සැමරීම

**භෞතික සම්පත් සැපයීම**

- පළාත් මට්ටමේ ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන 21ක් හා ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 10ක් ක්‍රියාත්මක කිරීමටත් සාක්ෂර පන්ති 28ක් හා කාර්යබද්ධ සාක්ෂර පන්ති 20ක් පැවැත්වීම සඳහාත් මාවත්වාසී ළමයින් සඳහා මීගමුව, කතරගම, බණ්ඩාරවෙල හා මහනුවර සාක්ෂර පන්ති ආරම්භ කිරීමටත් පළාත් වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීම

- නොවිධිමත් අධ්‍යාපන මධ්‍යස්ථාන සඳහා පරිගණක යන්ත්‍ර 36ක්, පරිගණක මුද්‍රණ යන්ත්‍ර 26ක්, ගෘහ විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ උපකරණ කට්ටල 36ක්, ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ උපකරණ කට්ටල 36ක් මිල දී ගෙන ලබා දීම

## 4.4 විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- විශේෂ අවශ්‍යතා සහිත ළමයින් විධිමත් ව හඳුනාගැනීම පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 386ක්, සංඥා භාෂාව පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් 40ක් හා ගුරුවරුන් 36ක් සඳහා දින 3ක බ්‍රේල් පුහුණු වැඩසටහන් 7ක් පැවැත්වීම
- විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා පළාත් මට්ටමින් අධ්‍යාපන කඳවුරු පැවැත්වීම
- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ විශේෂ අධ්‍යාපන ගුරුවරුන් දැනුම්වත් කිරීම සඳහා පළාත් වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීම

**උපකරණ පහසුකම් සැපයීම**

- විශේෂ අවශ්‍යතා සහිත 1-5 ශ්‍රේණි සිසුන් සඳහා ඉ-තක්සලාව වැඩසටහන ප්‍රතිනිර්මාණය කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත ළමයින් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයක් පිළිබඳ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා අත්පොත් සකස් කිරීම
- පාසල් 3ක විශේෂ අධ්‍යාපනය සඳහා නව ඉදිකිරීම් සිදුකිරීම හා පාසල් 16ක විශේෂ අධ්‍යාපන පන්ති කාමර අලුත්වැඩියා කිරීම
- විශේෂ අධ්‍යාපන ළමයින් සඳහා ක්‍රීඩා උපකරණ කට්ටල 31ක්, ව්‍යායාම කට්ටල 30ක්, බ්‍රේල් උපකරණ කට්ටල 75ක්, ලැප්ටොප් පරිගණක 20ක්, මුද්‍රණ යන්ත්‍ර 25ක් මිල දී ගැනිමට කටයුතු කිරීම
- ඇස් කණ්නාඩි 4000ක් හා සවන් වහල් 50ක් ලබා ගැනීමට පළාත් වෙත මුදල් ප්‍රතිපාදන ලබා දීම
- හෝමාගම කහතුඩුව වෙනිවැල්කොළ කනිටු විදුහලේ ඉදිකිරීමට නියමිත විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයේ පරිශ්‍රය වැට හා ගොඩනැගිලි අලුත්වැඩියාව කිරීම
- ආබාධ සහිත ළමයින් 135ක් ඇතුළු සහභාගිවන්නන් 300කගේ සහභාගිත්වයෙන් ජාත්‍යන්තර ආබාධිත දිනය සැමරීම

## 4.5 ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්

### 4.5.1. වගුව : ශිෂ්‍ය සුභසාධන වැඩසටහන්

| වැඩසටහන | වියදම රු.මි. | | | | | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2015 |
| කිරි වීදුරුවක් ලබා දීම | 178 | 249 | 205 | 230 | 197 | 127.6 | 84,843 |
| පෙළපොත් | 1941 | 2294 | 2400 | 2329 | 2700 | 3000 | 3,830,970 |
| පාසල් නිල ඇඳුම් | 949 | 1364 | 1600 | 1739 | 3574 | 2600 | 4,325,567 |
| ලංගම වාර ප්‍රවේශපත්‍ර | 1369 | 1359 | 1233 | 1430 | 1695 | N/A | N/A |
| 5 ශ්‍රේණියේ ශිෂ්‍යාධාර | 225 | 283 | 240 | 268 | 300 | 325 | 122,309 |
| පාසල් පෝෂණ වැඩසටහන | 2674 | 2630 | 2850 | 3076 | 3725 | 4082 | 1,098,802 |
| දුෂ්කර පාසල් ළමුන් සඳහා සපත්තු ජෝඩුවක් ලබා දීම | - | - | - | 0.05 | 270 | 600 | 700,000 |

**මූලාශ්‍රය : මුදල් අමාත්‍යාංශය: වාර්ෂික වාර්තාව 2015, මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය** N/A—වාර්තා වී නොමැත

### 4.5.2 ශිෂ්‍යාධාර වැඩසටහන්

ඉගෙනුමට දක්ෂතා ඇති නමුත් ආර්ථික අපහසුකම් ඇති ශිෂ්‍ය, ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය සඳහා පහත සඳහන් පරිදි විවිධ ශිෂ්‍යාධාර වැඩසටහන් වාර්ෂිකව ක්‍රියාත්මක වේ.

- **5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව :** ශිෂ්‍යත්වය සමත් වන අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් 10,000 කට වාර්ෂික ව රු. 5,000 බැගින් ශිෂ්‍යාධාර ලබා දීම

- **මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව :** අ.පො.ස. (සා/පෙ) ඉහළින් ම සමත් වූ අඩු ආදායම්ලාභී දරුවන්ට උ.පෙළ හැදෑරීමට වාර්ෂික ව ශිෂ්‍යත්ව 150ක් පිරිනැමීම

- **ඩයලොග් ශිෂ්‍යත්ව :** අ.පො.ස. (සා/පෙ) ඉහළින් සමත් වී උ.පෙළ ගණිතය විෂය ධාරාව හදාරන අඩු ආදායම්ලාභී දරුවන් 30ක් සඳහා වාර්ෂික ව ශිෂ්‍යත්ව ප්‍රදානය

- **තාක්ෂණවේදය ශිෂ්‍යත්ව :** ශිෂ්‍යත්ව අරමුදල ආරම්භ කර EKSP ව්‍යාපෘති මුදල් ද යොදවා අරමුදල් තර කිරීම සිදුකර පළමු වටය සඳහා ශිෂ්‍යත්ව 150ක් ලබා දුන් අතර දෙවන වටය සඳහා ශිෂ්‍යත්ව 200ක් තෝරා ගෙන ඇත

- **සුජාත දියණි ශිෂ්‍යත්ව :** කොරියානු ජාතික ලී යංග් ඒ මහත්මියගේ අනුග්‍රහයෙන් ප්‍රතිපාදන ලැබෙන මෙම ශිෂ්‍යත්ව, තාක්ෂණ විද්‍යාව හදාරන සිසුවියන්ට පිරිනැමේ

- **වෝග් රන් පවුම් ශිෂ්‍යත්ව :** වෝග් ජුවලර්ස් ආයතනයේ අනුග්‍රහයෙන් පිරිනැමිණි



## 4.6 පාසල් පෝෂණ හා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

- **4.6.1.** වගුව : පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන - 2015

| පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| 7,948 | 1,098,802 | 4,082.50 |

- **4.6.2.** වගුව : පාසල් ළමුන් සඳහා කිරි වීදුරුවක් ලබා දීමේ වැඩසටහන

| පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| 352 | 84,843 | 127.6 |

- **4.6.3.** වගුව : ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබා දීම (WASH in School)

| ක්‍රියාකාරකම | පාසල් සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|
| පළාත් 9 සඳහා ජල හා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම | 133 | 67.8 |
| දෑත් සේදීමේ ස්ථාන පහසුකම් ලබාදීම | 44 | |

මූලාශ්‍රය : පාසල් සෞඛ්‍ය හා පෝෂණය ශාඛාව

- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන

නිර්ණායක 22ක් යටතේ පාසල් සහතිකකරණය සිදු කරනු ලබන අතර පාසල් මට්ටමේ ස්වයං ඇගයීම පාසල් 8,946ක අවසන් කර කලාප මට්ටමේ ඇගයීම් කලාප 84ක සිදු කරන ලදි.

- 2015.06.16-17 දිනයන්හි පාසල් සිසු ජල හා සනීපාරක්ෂක සමුළුව අපේ ගම පරිශ්‍රයේ දී ද, 2015.10.12-16 දිනයන්හි දී ජල හා සනීපාරක්ෂාව හා ස්වස්ථතාව සම්බන්ධ දකුණු ආසියාතික රටවල් අතර දැනුම හුවමාරු කර ගැනීමේ ජාත්‍යන්තර සමුළුව කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී ද ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ ප්‍රදානත්වයෙන් පැවැත්විණි.
- පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිත ආපනශාලා පවත්වාගෙන යාම පිළිබඳ ව නව චක්‍රලේඛය 2015.12.31 සිට බලාත්මක කරන ලදි.





**4.6.4.** වගුව : මෙම වැඩසටහන් තුළින් දරුවන් ලද ප්‍රතිලාභ

| දර්ශකය | 2007 පැවති තත්ත්වය | 2015 ළඟා කර ගත් තත්ත්වය |
|---|---|---|
| වැසිකිළි පහසුකම් නොමැති පාසල් ගණන | 1299 | 74 |
| වැසිකිළි පහසුකම් අවශ්‍යතාවෙන් 50% ක් හෝ ඇති පාසල් ප්‍රතිශතය | 55% | 83% |
| කිසියම් ප්‍රභවයකින් පානීය ජලය සැපයෙන පාසල් ප්‍රතිශතය | N/A | 87% |
| මිටි බව සහිත සිසු ප්‍රතිශතය | 20.9% | 8.9% |

මූලාශ්‍රය**:** පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව

2007ට සාපේක්ෂව 2015 වන විට පාසල්වල සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර ඇති අතර තවදුරටත් සියලුම පාසල්වලට එම පහසුකම් සැපයීම සඳහා 2016 දී විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

# 05. ඉගෙනුම් සංවර්ධන වැඩසටහන්

## 5.1 ප්‍රාථමික අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- අන්තර්කරණ අධ්‍යාපනය සවිබල ගැන්වීම සඳහා ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන් හා ප්‍රාථමික ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 8ක් පැවැත්වීම හා ගුරු පුහුණු මොඩියුලය සකස් කිරීම
- පාසල් අභ්‍යන්තර අධීක්ෂණය පිළිබඳ ව පළාත් හා කලාප නිලධාරීන් සවිබල ගැන්වීම සඳහා වැඩසටහන් 3ක් පැවැත්වීම
- 1 ශ්‍රේණිය විෂය මාලාවට අදාළ ව නිලධාරීන්ගේ හා ගුරු උපදේශකවරුන්ගේ කාර්ය භාරය පිළිබඳ ව දැනුම්වත් කිරීමේ සැසි 2ක් පැවැත්වීම
- කාර්ය මූලික පර්යේෂණ පිළිබඳ ව ප්‍රාථමික ගුරු පුහුණු සැසි 3ක් පැවැත්වීම
- බහුතල ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ව නිලධාරීන්ගේ හා ප්‍රාථමික ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩමුළු 7ක් පැවැත්වීම
- ප්‍රාථමික අධ්‍යාපනය සඳහා මෘදුකාංග භාවිතය පිළිබඳ ව පළාත් හා කලාප නිලධාරීන් දැනුම්වත් කිරීමේ සැසි 5ක් පැවැත්වීම
- ඉංග්‍රීසි භාෂා කුසලතා වර්ධනය පිළිබඳ ව ප්‍රාථමික ගුරු උපදේශකවරුන් සඳහා සැසි 13ක් පැවැත්වීම
- ප්‍රාථමික පන්තිවල පරිසර සමාජ හා සෞඛ්‍ය ක්‍රියාකාරකම් කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ සැසි 18ක් පැවැත්වීම

**ශිෂ්‍ය සාධනය නැංවීම**

- බස්නාහිර පළාතේ දෙමළ මාධ්‍ය ප්‍රාථමික සිසුන්ගේ පළමු ප්‍රධාන අවධියේ ඉගෙනුම් නිපුනතා මැනබැලීම සඳහා අධ්‍යයනයක් සිදු කිරීම
- 5 ශිෂ්‍යත්ව ප්‍රතිඵල විශ්ලේෂණ වාර්තා 450ක් මුද්‍රණය කර බෙදාහැරීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 66.63 |
| TSEP | 0.90 |
| UNICEF | 0.63 |
| JICA | 1.28 |
| එකතුව | 69.44 |

**භෞතික සම්පත් සංවර්ධනය**

- ජාතික පාසල්වල ප්‍රාථමික අංශයේ භෞතික අවශ්‍යතා සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන සඳහා මූල්‍ය ප්‍රදාන ලබාදීම
- ප්‍රාථමික අංශ අලුත්වැඩියා සහ නව ඉදිකිරීම් සිදුකිරීම
- ජාතික පාසල් 151ක් සඳහා ගුණාත්මක යෙදවුම් ප්‍රතිපාදන වෙන් කිරීම

## 5.2 ගණිත අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- ගණිත විෂයය සඳහා පත්වීම් නොලද නමුත් ගණිත විෂයය උගන්වන ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා එක් ව ගණිතය ඉගැන්වීම පිළිබඳ මාස 6ක උසස් සහතික පත්‍ර පාඨමාලාව ආරම්භ කර ගුරුවරුන් 80ක් සඳහා පුහුණුව ලබා දීම
- ගණිත උපකරණ භාවිතය හා ක්‍රියාකාරකම් පාදක ව ගණිත ගුරුවරුන් සවිබල ගැන්වීමේ දින 4ක නේවාසික පුහුණු වැඩසටහන් 3ක් ගුරුවරුන් 235ක් සඳහා පැවැත්වීම

- උසස් පෙළ සංයුක්ත ගණිත විෂයය උගන්වන ගුරුවරුන් 61 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල දායකත්වයෙන් සවිබල ගැන්වීමේ වැඩසටහන් 3ක් පැවැත්වීම
- අලුතින් පද්ධතියට එක්වූ සිංහල මාධ්‍ය ගණිත උපදේශකවරුන් 98 දෙනෙකු සඳහා දින 4ක නේවාසික වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- තත්ත්ව කව සංකල්පය තුළින් එක් එක් පාසලට, කොට්ඨාසයට, කලාපයට හෝ පළාතට සුවිශේෂී වූ තත්ත්ව හඳුනා ගනිමින් ගුරු සිසු අභිප්‍රේරණය තුළින් ශිෂ්‍ය සාධන මට්ටම ඉහළ නැංවීම සඳහා වයඹ පළාත් වැඩසටහන පවත්වා පළාත් නිලධාරීන්, කලාප ගණිත විෂය අධ්‍යක්ෂවරුන්, ගුරු උපදේශකවරුන්, ගුරුවරුන් හා සිසුන් 107 දෙනෙකු දැනුම්වත් කිරීම
- "ගණිත උපකරණ භාවිතය පිළිබඳ ගුරු සිසු මාර්ගෝපදේශ සංග්‍රහය" දෙමළ මාධ්‍යයෙන් 450ක් හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් 550ක් ලෙස පිටපත් මුද්‍රණය කර බෙදාහැරීම
- තේමා පාදක ගණිතාධාරක e පොතක් බවට පරිවර්තනය කිරීම හා e තක්සලාව ගණිත විෂයය ඉගැන්වීම සඳහා යොදා ගැනීම

**සමස්ත ලංකා හා අන්තර්ජාතික ගණිත තරගාවලි ජයග්‍රහණ**

- සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය පිළිබඳ අභිප්‍රේරණ වැඩසටහන් හරහා පළාත් හා කලාප ගණිත විෂයභාර නිලධාරීන්, ගුරු උපදේශකවරුන් හා ගණිත ගුරුවරුන් 484 දෙනෙකු දැනුම්වත් කිරීම
- සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලිය හා සමස්ත ලංකා ගණිත නාට්‍ය තරගාවලිය පවත්වා ජයග්‍රහණ සඳහා සහතික පිරිනැමීම.
- චීනයේ පැවති අන්තර්ජාතික ගණිත ඔලිම්පියාඩ් තරගාවලියට සහභාගි වූ සිසුහු රන් පදක්කම් 2ක්, රිදී පදක්කම් 01ක් හා ලෝකඩ පදක්කම් 4ක් ද කුසලාන 5ක් ද දිනා ගැනීමට සමත්වූහ. ජොෂ්ඨ අංශයේ අන්තර්ජාතික ගණිත තරගාවලියකින් ප්‍රථම වරට රන් පදක්කමක් දිනා ගැනීම මෙහි දී විශේෂ විය
- 2015 නොවැම්බර් මස කනිෂ්ඨ අංශයේ සිසුන් සඳහා තායිලන්තයේ පැවති 12 වන අන්තර්ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලියේ දී (IMSO - 2015) රන් පදක්කමක්, රිදී පදක්කම් 3ක් හා ලෝකඩ පදක්කම් 6ක් වශයෙන් දිනා ගැනීමට සිසුහු සමත් වූහ

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 4.23 |
| ESDP | 8.39 |
| TSEP | 3.20 |
| එකතුව | 15.82 |

## 5.3 විද්‍යා අධ්‍යාපනය

ගෝලීය ප්‍රවනතාවට අනුව ශ්‍රී ලංකාවේ විද්‍යා අධ්‍යාපනයේ සම අවස්ථා ලබා දීම සඳහා ක්‍රියාත්මක වන වැඩසටහන් යටතේ 2015 වසර තුළ ඉටුකරන ලද කාර්යය මෙහි දැක්වේ. ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට වඩාත් නැඹුරු වූ නව විෂය මාලාව ක්‍රියාත්මක කිරීම සඳහා ගුරුවරුන්ගේ ධාරිතා වර්ධනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක් ව කටයුතු කිරීමත් භෞතික සම්පත් සපුරාලීමත් විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

**ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම**


- සාමාන්‍ය පෙළ විද්‍යාව ප්‍රශ්න පත්‍ර 11ක් ද උසස් පෙළ තාක්ෂණය සඳහා විද්‍යාව ප්‍රශ්න පත්‍ර 2ක් ද ඇතුළු ව ප්‍රශ්න එකතුවක් අන්තර්ජාලය ඔස්සේ නිකුත් කිරීම

**භෞතික සම්පත් සංවර්ධනය**

- ජංගම විද්‍යාගාර කට්ටලය සඳහා පිරිවිතරවලට අනුව රසායන ද්‍රව්‍ය හා උපකරණ සකස්කර විද්‍යාගාර නොමැති පාසල් 3000ක් සඳහා ලබාදීමට අදාළ අයවැය යෝජනාව ඉදිරිපත් කිරීම

**ධාරිතා සංවර්ධනය**

- ජාතික පාසල් ගුරුභවතුන් 390ක් හා වතු පාසල් ගුරුභවතුන් 232ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම

















- රසායනාගාර සහායකයින් 65 දෙනෙකු පුහුණු කිරීම
- ක්ෂේත්‍ර අධ්‍යාපන මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා ස්වාභාවික මංපෙත් සකස් කිරීමේ පුහුණු වැඩසටහන
- ඉන්දියාවේ හොම්බාබා විද්‍යා ආයතනයේ පුහුණු පාඨමාලාවක් සඳහා විද්‍යා ගුරුභවතුන් හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් 20ක් සහභාගි කරවීම
- විද්‍යා ගුරුභවතුන් හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් 45 දෙනෙකු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීමට ප්‍රතිපාදන ලබාදීම

**5.3.1. ප්‍රස්ථාරය:** අ.පො.ස. (සා.පෙළ) විද්‍යාව සමත්වීමේ ප්‍රතිශතය 2008-2013




**5.3.2. ප්‍රස්ථාරය:** අ.පො.ස. (උ.පෙළ) විද්‍යා අංශයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය 2012 - 2015




**5.3.1. වගුව:** අන්තර්ජාතික ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් ( **IMSO**) තරගාවලියේ දී ශිෂ්‍යයන් ලබාගත් ජයග්‍රහණ

| පදක්කම් වර්ගය/වර්ෂය | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රන් | - | - | - | - | - | 2 | 4 | 4 | 1 | 3 |
| රිදී | - | 1 | - | 2 | 1 | 7 | 8 | 5 | 7 | 7 |
| ලෝකඩ | 1 | 2 | 3 | 1 | 11 | 2 | 6 | 3 | 3 | 2 |
| එකතුව | 1 | 3 | 3 | 3 | 12 | 11 | 18 | 12 | 11 | 12 |

මූලාශ්‍රය : විද්‍යා ශාඛාව

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | **8.09** |
| ESDP | **7.89** |
| TSEP | **5.39** |
| එකතුව | **21.37** |

## 5.4 අ.පො.ස. (උ.පෙ.) තාක්ෂණවේදය විෂය ධාරාව

**5.4.1 වගුව:** අ.පො.ස. (උ.පෙ.) තාක්ෂණවේදය ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව සහ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව

| පළාත | පාසල් සංඛ්‍යාව | | | වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 2013 ආරම්භක | 2014 අලුතින් අනුමත කළ | 2015 අලුතින් අනුමත කළ | |
| බස්නාහිර | 51 | 10 | 8 | 5577 |
| මධ්‍යම | 35 | 10 | 13 | 3616 |
| දකුණ | 36 | 8 | 7 | 4296 |
| උතුර | 20 | 16 | 3 | 2121 |
| නැගෙනහිර | 19 | 16 | 12 | 2034 |
| වයඹ | 26 | 13 | 14 | 3421 |
| උතුරු මැද | 22 | 11 | 4 | 2550 |
| ඌව | 21 | 8 | 4 | 2045 |
| සබරගමුව | 21 | 9 | 9 | 2687 |
| **එකතුව** | **251** | **101** | **74** | **28347** |

මූලාශ්‍රය : තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

**5.4.2 වගුව:** තාක්ෂණවේදය සඳහා ගුරුවරුන් බඳවා ගැනීම 2014/2015

| ගුරු වර්ගය | බඳවා ගත් සංඛ්‍යාව |
|---|---|
| ඉංජිනේරු තාක්ෂණවේදය | 338 |
| ජෛව පද්ධති තාක්ෂණය | 265 |
| තාක්ෂණය සඳහා විද්‍යාව | 235 |

මූලාශ්‍රය : තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

**ගුරු පුහුණුව**

- ඉංජිනේරු තාක්ෂණවේදය, නිර්මාණකරණය හා තාක්ෂණවේදය විෂයයන් උගන්වන ගුරුභවතුන් සඳහා විෂය නිර්දේශයේ කොටස් ආවරණය වන පරිදි ගුරු පුහුණු වැඩමුළු 22ක් පවත්වා ගුරුවරුන් 1780ක් පුහුණු කිරීම

- උසස් ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් දිශාභිමුඛ කිරීමේ වැඩසටහනක් හා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුභවතුන් සඳහා නේවාසික ගුරු පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

- උසස් පෙළ තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක පාසල්වල විදුහල්පතිවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 02ක් පැවැත්වීම

- ඉංජිනේරු තාක්ෂණවේදය උගන්වන ඩිප්ලෝමාධාරී ගුරුවරුන් 200කට BEd උපාධිය ලබා ගැනීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව උපාධි පාඨමාලාව දෙසැම්බර් මස සිට ආරම්භ කිරීම

**විෂය ධාරාව ප්‍රවර්ධනය**

- මුලාකෘති ප්‍රශ්න පත්‍ර පොත් විභාග දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර විෂය ක්‍රියාත්මක සියලු ම පාසල් වෙත බෙදා හැරීම
- අ.පො.ස. (උ.පෙ.) තාක්ෂණවේදය විෂය ධාරාව සඳහා ශිෂ්‍යයන් නැඹුරු කිරීමට පුවත්පත් නිවේදන, අත්පත්‍රිකා හා පෝස්ටර් භාවිතයෙන් දැනුම්වත් කිරීම් වැඩසටහන් දියත් කිරීම

**ශිෂ්‍ය සාධනය**

- පළමු ශිෂ්‍ය කණ්ඩායම 2015 වසරේ අ.පො.ස. (උ.පෙ.) සඳහා පෙනී සිටියහ. ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ලකුණුවලින් 25% ක් ලබා දීමට යෝජිත අතර මෙවර 15%ක් පමණක් ඒ සඳහා ලබා දෙන ලදි.

**5.4.3 වගුව: තාක්ෂණ ධාරාවේ අ.පො.ස. (උ.පෙ.) ප්‍රතිඵල - 2015**

| ධාරාව | පෙනීසිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය |
|---|---|---|---|
| ජෛව පද්ධති තාක්ෂණය | 4,815 | 2,905 | 60.3% |
| ඉංජිනේරු තාක්ෂණය | 7,882 | 3,940 | 49.9% |

**ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) ලබා දීම**

- අ.පො.ස.(උ.පෙ.) තාක්ෂණවේදය හදාරන සිසුන්ට G-NVQ 3 මට්ටම ලබාදීමට යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය සමඟ එක් ව සාකච්ඡා කර තීරණය කර ඇත.

**තාක්ෂණ පීඨ ඉදිකිරීම**

තාක්ෂණ පීඨ 62ක ඉදිකිරීම් සම්පූර්ණයෙන් නිම කර ඇති අතර 250ටම උපකරණ ලබා දී ඇත.

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 3.98 |
| ESDP | 19.63 |
| එකතුව | **23.61** |

## 5.5 ගෘහ ආර්ථික විද්‍යා අධ්‍යාපනය

- සිංගර් අනුග්‍රහයෙන් පැවැත්වුණ ගෘහ ආර්ථික විද්‍යා ප්‍රායෝගික පුහුණු වැඩසටහන : ගුරුවරු 270 ක් හා සිසුහු 780ක් සහභාගි වූහ.
- විෂය සංවර්ධන වැඩසටහන : නිලධාරීහු 127 ක් දැනුම්වත් කරන ලදහ.
- “රස සරණිය“ වැඩසටහන : දකුණ,වයඹ හා සබරගමුව පළාත්වල සිසුහු 960 ක් හා ගුරුවරු 321 ක් සහභාගි වූහ.
- දැනුම මිනුම තරග : පළාත් මට්ටමින් සිසුහු 1,330 ක් සහභාගි වූහ.

## 5.6 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය

**ධාරිතා සංවර්ධන හා ගුරු පුහුණු වැඩසටහන්**

- නව පත්වීම් ලද උපාධිධාරි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරු භවතුන් 75 දෙනෙකු සඳහා දින 6ක පුහුණුවක් ලබා දීම
- අ.පො.ස. (උ.පෙ.) තොරතුරු තාක්ෂණ විෂයය උගන්වන ගුරුවරුන් 386ක් සඳහා දින 7ක පුහුණුවක් ජාතික අධ්‍යාපන ආයතනය හා විශ්වවිද්‍යාලය සමඟ එක් ව ලබා දීම
- අ.පො.ස. (සා.පෙ.) සඳහා බඳවා ගත් විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරී නව ගුරුභවතුන් 117ක් සඳහා දින 5ක පුහුණුවක් ලබා දීම
    - නව්‍ය තොරතුරු තාක්ෂණ පන්ති කාමරය (Innovative ICT Classroom) ඉගැන්වීමේ ක්‍රියාවලිය පිළිබඳ 36 දෙනෙකු ද
    - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සවිබල ගැන්වුණු ප්‍රශස්ත පාසලක් උදෙසා ගුරුවරුන්ගේ කාර්යභාරය පිළිබඳ 68 දෙනෙකු ද
    - පරිගණක දෘඩාංග හා ජාලකරණය පිළිබඳ 30 දෙනෙකු ද
    - සූර්ය බලයෙන් ක්‍රියාත්මක වන පරිගණක විද්‍යාගාර භාර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරු භවතුන් 20 දෙනෙකු සඳහා ද පුහුණුවක් ලබාදීම.
    - Java, Intel Teach, SQL පිළිබඳ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ගුරු භවතුන් 103 දෙනෙකු පුහුණු කිරීම.

- උපාධිධාරි නොවන තොරතුරු තාක්ෂණ ගුරු භවතුන් සඳහා උපාධි අවස්ථා ලබා දීම - වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මඟින් උපාධිය ලබා ගැනීම සඳහා ගුරුභවතුන් 35 දෙනෙකුට මෙම වසරේ අවස්ථා ලබා දෙන ලදි.

- DVD හා ගුරු අත්පොත් මුද්‍රණය
    - විවෘත හා නිදහස් මෘදුකාංග පාසල් පද්ධතියට හඳුන්වා දීම සඳහා ගුරු අත්පොතක් සකස් කර පිටපත් 1500ක් මුද්‍රණය කිරීම
    - පාසල් පද්ධතියට ලබා දීම සඳහා විවෘත හා නිදහස් මෘදුකාංග ඇසුරින් සකස් කරන ලද ඉසුරු ලිනක්ස් DVD 2000ක් මුද්‍රණය කිරීම
    - පාසල් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානවල අත්පොත් සංස්කරණය කිරීම.
    - පාසල් කළමනාකරණය සඳහා යොදා ගැනීමට සකස් කරන ලද මෘදුකාංග කට්ටලය ඇතුළත් DVD 3000ක් මුද්‍රණය කිරීම

පළාත් හා කලාප තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන මධ්‍යස්ථාන

- මේ සම්බන්ධ ව ඉදිරිපත් කරන ලද විශේෂ ව්‍යාපෘති යෝජනාවට අනුව රු.මි. 150ක් 2015 වර්ෂය සඳහා ලැබුණු අතර කලාප මට්ටමේ අවශ්‍යතා හඳුනාගෙන මහනුවර, මාතර, ඉබ්බාගමුව, යාපනය, තෙන්මාරච්චි, මඩකලපුව, මධ්‍යම, තෙල්දෙණිය, නිවිතිගල, දිඹුලාගල හා කොත්මලේ යන කලාප 11 හි මධ්‍යස්ථාන ඉදි කිරීමට කටයුතු කරන ලදි. මෙම මධ්‍යස්ථාන ගුරු පුහුණුව, පාසල් හැරගිය සිසුන්ට පාඨමාලා පැවැත්වීම මෙන් ම ප්‍රජාවට අවශ්‍ය තොරතුරු සපයන මධස්ථාන ලෙස ද ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- NVQ පාඨමාලා - දිවයින පුරා පිහිටි පළාත් හා කලාප තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන 35 ක NVQ 3 හා NVQ 4 පාඨමාලා ක්‍රියාත්මක වේ. මධ්‍යස්ථාන 47ක පාඨමාලා පැවැත්වීමට සැලසුම් කර ඇත. මේ සඳහා ගුරුභවතුන් 25 දෙනෙකු දැනුම්වත් කිරීම පිණිස සිංහල 2000ක් හා දෙමළ 1000ක් ලෙස ඇගයීම් වාර්තා පොත් මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදි.

- ICDL/ IPICT පාඨමාලා - පාසල් හැරගිය සිසුන් සඳහා ICDL ( ජාත්‍යන්තර පරිගණක ධාවන බලපත්‍ර) පාඨමාලා පැවැත්වීමට මධ්‍යස්ථාන 77ක් ද IPICT (ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහතික) පාඨමාලා සඳහා මධ්‍යස්ථාන 66ක් ද ලියාපදිංචි වී ඇත. IPICT පාඨමාලා සඳහා උපදේශකවරුන් වශයෙන් කටයුතු කිරීමට ගුරුවරුන් 15 දෙනෙකු පුහුණු කරන ලද අතර ICDL හා IPICT පොත් කට්ටල 400 බැගින් ලබා ගැනීම මෙම වසර තුළ සිදු කර ඇත. ICDL පාඨමාලාව සඳහා ගුරුභවතුන් 400ක් වෙනුවෙන් විභාග ගාස්තු ගෙවන ලදි.

- වෘත්තීය පාඨමාලා - පාසල් හැරගිය සිසුන් ඉලක්ක කර ගනිමින් ජනමාධ්‍ය, සත්කාරක කළමනාකරණය, ඇඟලුම් කළමනාකරණ, කෘෂිකර්ම සහ තොරතුරු තාක්ෂණ ව්‍යාපාර බාහිරකරණය යන රැකියාභිමුඛ පාඨමාලා 5ක් අදාළ රැකියා ආයතන හා මයික්‍රොසොෆ්ට් සමාගම හා ඒකාබද්ධ ව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම වසරේ මධ්‍යස්ථාන 10 ක ක්‍රියාත්මක කරන ලදි.

**පාසල්වල පරිගණක පහසුකම් සංවර්ධනය**

- ජාතික පාසල්වලට පරිගණක ලබා දීම - ජාතික පාසල් 20ක පරිගණක මධ්‍යස්ථාන සඳහා ජාලගත නව පරිගණක හා උපාංග ලබාදීම හා එක් පාසලකට 21 බැගින් ජාතික පාසල් 20ක් සඳහා ජාතික පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විද්‍යාගාර ලීබඩු මිල දී ගැනීම

- ශ්‍රී ලංකා - දකුණු කොරියා මිත්‍රත්ව විද්‍යාගාරය - අධ්‍යාපන අමාත්‍යාංශය හා දකුණු කොරියාවේ ග්වැන්ග්ජු මෙට්‍රොපොලිටන් අධ්‍යයන දෙපාර්තමේන්තුව අතර පවතින අවබෝධතා ගිවිසුමට අනුව මෙම වසරේ දී පරිගණක 50ක් ස්ථාපිත කළ මොරටුව වේල්ස් කුමරි විද්‍යාලයේ පරිගණක විද්‍යාගාරය සිසු අයිතියට පත් කිරීම

- වාර්ෂික පාසල් පරිගණක දෘඩාංග නඩත්තු වැඩසටහන යටතේ ලංකාව පුරා පාසල්වල පරිගණක 711ක් සම්පූර්ණයෙන් ම අලුත්වැඩියා කිරීම හා පරිගණක 520ක් සඳහා නව උපාංග සවිකිරීම

- පරිගණක දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායමේ පුහුණු වීම - පාසල්වල පරිගණක අලුත්වැඩියා කටයුතු සිදු කිරීම සඳහා කලාපයකින් ගුරුවරුන් 5 දෙනෙකු බැගින් තෝරා ගෙන ජාතික මට්ටමින් ස්ථාපිත කර ඇති පරිගණක දෘඩාංග හා ජාලකරණ විසඳුම් කණ්ඩායම්වලට අලුතින් එකතුවන ගුරුවරුන් විශ්වවිද්‍යාල හරහා පුහුණු කිරීම අඛණ්ඩ ව සිදු වන අතර මේ යටතේ 2015 දී ගුරුවරුන් 60 දෙනෙක් පුහුණු කරවන ලදහ.

- පරිගණක හා උපාංග අලුත්වැඩියාකිරීම් වාර්ෂික වැඩසටහන - සෑම වසරක ම දිස්ත්‍රික්ක මට්ටමින් පැවැත්වෙන වැඩමුළු හරහා පරිගණක දෘඩාංග හා ජාලකරණ කණ්ඩායමේ සමාජිකයන් විසින් පරිගණක අලුත්වැඩියා සිදු කරනු ලබන අතර ඉවත්කළ යුතු පරිගණක සඳහා නිර්දේශය ලබා දීම සිදු වේ. මෙම වැඩසටහන හරහා රු.මි. 71ක පමණ මුදලක් රජයට ඉතිරි වේ

- අන්තර්ජාලයෙන් දරුවන් ආරක්ෂා කර ගැනීම - ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය හා එක් ව පාසල් මට්ටමින් පවත්වන සම්මන්ත්‍රණ මාලාව යටතේ පාසල් 9ක මෙම වසරේ සම්මන්ත්‍රණ පැවැත්වීම

**ඉගෙනුම් මෘදුකාංග නිර්මාණය**

- ඉ-තක්සලාව ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතියට පෙළපොත, විෂයානුබද්ධ මෘදුකාංග, ප්‍රශ්නෝත්තර සහ වීඩියෝපට මෙන් ම ඉ- පුස්තකාලයක් ද ලිපි අන්තර්ගත කිරීමට මෙන් ම විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ට ගැළපෙන පරිදි මෘදුකාංග සකස් කිරීමටත් අ.පො.ස. (උ.පෙ.) තාක්ෂණ, කලා හා වාණිජ විෂය ධාරා සඳහා මෙන් ම පිරිවෙන් අධ්‍යාපනයට අදාළ අන්තර්ගතයන් සකස් කිරීමටත් පියවර ගැනීම

- නැණසැස අධ්‍යාපන නාලිකව - ඩයලොග් ආයතනයේ අනුග්‍රහය ඇති ව පාසල්වලට ලබා දුන් රූපවාහිනි යන්ත්‍ර හා ඩයලොග් සබඳතාව භාවිත කර නැණසැස අධ්‍යාපන නාලිකාව නැරඹීම සඳහා පාසල් 1970කට පහසුකම් ලබා දී ඇත.

- ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයන්ගේ තරගාවලිය - 2015 වර්ෂයේ පැවැති 7 වන තරගාවලිය සිසුන් සඳහා මාර්ගගත පරීක්ෂණය හා සිසුන් , ගුරු සිසුන් හා ගුරුවරුන් සඳහා මෘදුකාංග නිර්මාණය කිරීමේ තරග වලින් සමන්විත විය.



| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | **158.77** |
| ESDP | **16.97** |
| JICA | **0.74** |
| TSEP | **2.92** |
| එකතුව | **179.40** |

## 5.7 ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය

- ප්‍රදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථාන වෙත මූල්‍ය ප්‍රදානය කරමින් ඒ හරහා සමස්ත ගුරු පුහුණුව ශක්තිමත් කිරීම හා ඉංග්‍රීසි කඳවුරු පැවැත්වීම
- ජාතික ඉංග්‍රීසි දින තරග පැවැත්වීම
- ඉංග්‍රීසි ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම
- අ.පො.ස. (සා.පෙ) හා අ.පො.ස. (උ.පෙ) විෂයමාලාවට අදාළ ව ගුරු පුහුණුව
- භාෂා තරග විනිශ්චය සඳහා පුහුණුව
- ප්‍රාථමික ගුරු උපදේශකවරුන් සඳහා නිමග්න පුහුණුව
- ඇගයීම් අයිතම සකස් කිරීමේ වැඩමුළුව
- ඉංග්‍රීසි නාට්‍ය හා රංගනය පිළිබඳ වැඩමුළුව
- ශිෂ්‍යත්ව සඳහා ප්‍රායෝගික පුහුණු ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම
- විභාග පෙරහුරු සම්මන්ත්‍රණ පැවැත්වීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 2.27 |

## 5.8 ද්විභාෂා හා ත්‍රෛභාෂා අධ්‍යාපනය

ද්විතීයික ශ්‍රේණිවල දී සිසුන් තුළ ඉංග්‍රීසි භාෂා කුසලතාව නැංවීමේ අරමුණින් ක්‍රියාත්මක ද්විභාෂා අධ්‍යාපන වැඩසටහන විෂය භාෂා සමෝධානික ඉගෙනුම් ප්‍රවේශය (CLIL) ඔස්සේ ක්‍රියාත්මක කෙරේ. 2015 වර්ෂය සඳහා ඉලක්ක වූයේ 7,11 හා 13 ශ්‍රේණි සඳහා මෙම ප්‍රවේශය හඳුන්වාදීමත් 8 ශ්‍රේණියේ ද්විභාෂා උගන්වන ගුරුවරුන් පුහුණු කිරීමත් ය.

**ධාරිතා සංවර්ධන වැඩසටහන් :**

- බ්‍රිතාන්‍ය කවුන්සිලය හා එක් ව සමෝධානික ඉගෙනුම් ප්‍රවේශය (CLIL) පිළිබඳ ව පුහුණු වැඩමුළු 02ක් මඟින් 180 දෙනෙකු පුහුණු කිරීම
- වැඩමුළු 05ක් මඟින් ද්විභාෂා ගුරුවරුන් 45 දෙනෙකුගේ භාෂා සංවර්ධනය සිදු කිරීම
- ද්විභාෂා අධ්‍යාපන සංවර්ධන වැඩසටහන පිළිබඳ ව දහසක් පාසල් වැඩසටහනට අයත් පාසල්වල විදුහල්පතිවරුන් 930ක් වැඩසටහන් 18ක් මඟින් දැනුම්වත් කිරීම
- විෂය භාෂා සමෝධානික ඉගෙනුම් ප්‍රවේශය පිළිබඳ වැඩමුළු 11ක් මඟින් ගුරුවරුන් 273ක් පුහුණු කිරීම
- ද්විභාෂා ඉංග්‍රීසි භාෂා ගුරුවරුන් ඒකාබද්ධ කර කාර්ය මූලික පර්යේෂණ වැඩමුළු 08ක් පවත්වා 40 දෙනෙකු පුහුණු කිරීම
- ඉන්දියාවේ නව දිල්ලි නුවර පවත්වන ලද 11 වන අන්තර් භාෂා සංවර්ධන සමුළුව සඳහා සම්පත්දායකයින් 20 දෙනෙකු සහභාගිකරවීම

**ශිෂ්‍ය පාදක වැඩසටහන් :** නියමු වැඩසටහන් ලෙස ඌව පළාතේ විවාද තරගාවලියක් පැවැත්වීම හා කලාපයකින් පාසල් 2 බැගින් ගෙන පාසල් සම්බන්ධීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**ත්‍රෛභාෂා අධ්‍යාපන වැඩසටහන :** භාෂා ප්‍රතිපත්ති හා සැලසුම්කරණය පිළිබඳ සම්පත් පුද්ගල සංචිතයක් පිහිටුවා සියලු පාර්ශ්වකරුවන්ගේ ධාරිතා සංවර්ධනයට පියවර ගැනීම හා භාෂා ජර්නලයක් සකස් කිරීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල<br>TSEP<br>**JICA** | 15.72 |

## 5.9 ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය

**ප්‍රතිපත්තිමය තීරණ**

- **මවුබස, සිංහල හා මවුබස දෙමළ ඉගැන්වීම සඳහා සුදුසුකම් සහිත ගුරුවරුන් යෙදවීම**

  පාසලකට ගුරුවරුන් ලබා දීමේ දී මවුබස උගන්වන ගුරුවරුන් පොදු ගුරුවරුන් යටතේ වර්ගීකරණය කර ගණනය කිරීම මෙතෙක් පැවති ක්‍රමය වූ අතර 12/2015 චක්‍ර ලේඛයෙන් එය සංශෝධනය කර මවුබස සිංහල හා මවුබස දෙමළ ඉගැන්වීමට අවශ්‍ය සංඛ්‍යාව වෙන වෙන ම ගණනය කිරීමට පියවර ගෙන ඇත. මේ මගින් එම විෂයයන් ඉගැන්වීම සඳහා සුදුසුකම් සහිත ගුරුවරුන් නිශ්චිතව ම හඳුනාගෙන පාසල්වලට ලබා දීමට හැකි වේ.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නව ව්‍යවස්ථාව අනුව සිංහල හා දෙමළ භාෂා ඉගැන්වීම අධීක්ෂණය සඳහා විශේෂ සේවක සංඛ්‍යාව යටතේ නිලධාරීන් බඳවා ගැනීමට අවස්ථාව ලැබී ඇත.

- **පාසල තුළ භාෂා භාවිතය**

  පාසලේ දැන්වීම් පුවරුවේ සිට සියලුම කටයුතු සන්නිවේදනය කිරීම පිණිස භාෂාත්‍රය ම භාවිත කිරීම මගින් පාසල් ප්‍රජාවේ ආකල්පමය වෙනසක් ඇති කර සහජීවනය වර්ධනය කිරීම අරමුණු කර ගෙන පාසල තුළ භාෂා භාවිතය පිළිබඳ ව 01/2015 චක්‍රලේඛය නිකුත් කරන ලදි.

- 2015 සමස්ත ලංකා සිංහල භාෂා දින තරගාවලිය පැවැත්වීම
  ශිෂ්‍ය සහභාගිත්වය - 1078

- 2015 සමස්ත ලංකා දෙමළ භාෂා දින තරගාවලිය පැවැත්වීම
  ශිෂ්‍ය සහභාගිත්වය - 600

- දෙවන ජාතික භාෂා ඇගයීම් ක්‍රියාවලිය
  ශිෂ්‍ය සහභාගිත්වය - 566

- 2015 සමස්ත ලංකා සමාජ විද්‍යා දින තරගාවලිය පැවැත්වීම
  ශිෂ්‍ය සහභාගිත්වය - 1512

**ධාරිතා සංවර්ධන වැඩසටහන් :**

- 6,11 ශ්‍රේණිවල ගුරුවරුන් සඳහා පළාත් මට්ටමින් සිංහල භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම
- දෙමළ භාෂා ගුරුවරුන් 415ක් පුහුණු කිරීම
- දෙවන ජාතික භාෂා ගුරුවරුන් 1705ක් පුහුණු කිරීම
- සමාජ විද්‍යා ගුරුවරුන් 377ක් පුහුණු කිරීම
- නුවණ හා කුර්මති සඟරා මුද්‍රණය කිරීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 8.59 |

## 5.10 වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය

**ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- වාණිජ විෂය භාර ව කටයුතු කරන පළාත් හා කලාප කාර්යාලවල සියලු ම අධ්‍යක්ෂකවරුන්ගේ, ගුරු උපදේශකවරුන්ගේ හා සම්පත්දායක ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා සිංහල මාධ්‍ය වැඩමුළු 3ක් පවත්වා 174 දෙනෙකුගේ හා දෙමළ මාධ්‍ය වැඩමුළුවක් පවත්වා 48 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය කිරීම

- සියලු ම පළාත්වල අ.පො.ස (උසස් පෙළ) ගිණුම්කරණය, ව්‍යාපාර අධ්‍යයනය හා ආර්ථික විද්‍යාව උගන්වන සිංහල මාධ්‍යය හා දෙමළ මාධ්‍ය ගුරුවරුන් සඳහා නේවාසික නොවන වැඩමුළු 23ක් මගින් ගුරුවරු 1,705කගේ දැනුම යාවත්කාලීන කිරීම

**ශිෂ්‍ය ප්‍රවේශය වැඩිකිරීම හා සාධනය ඉහළ නැංවීම**

- 2015 අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙරහුරු ප්‍රශ්න පත්‍ර සකස් කිරීම
- අ.පො.ස. (උසස් පෙළ) වාණිජ විෂය ධාරාව හදාරන අඩු ආදායම්ලාභී සිසුන් 90 දෙනෙකු සඳහා ගණකාධිකාරී ශිල්පීය ආයතනය (AAT) හා එක් ව මූල්‍යමය හා මූල්‍ය නොවන ශිෂ්‍යාධාර ලබා දීමට කටයුතු කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුව , පාරිභෝගික සේවා අධිකාරිය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව, වාණිජ මණ්ඩලය හා වාණිජ බැංකු එක් ව සිසුන් සඳහා පාසල් මට්ටමින් විවිධ ප්‍රායෝගික වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම
- AAT ආයතන හා එක් ව හොඳ ම වාර්ෂික වාර්තා හා ගිණුම් තරගාවලිය ජාතික පාසල් අතර සංවිධානය කිරීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 0.37 |
| ESDP | 10.70 |
| එකතුව | 11.07 |

## 5.11 කෘෂිකර්මය හා පරිසර අධ්‍යයනය

**ජෛව පද්ධති තාක්ෂණවේදය**

අ.පො.ස. (උ.පෙ) තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ 2015 වන විට පාසල් 422ක ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ඉගැන්වේ. විෂය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව 11,230ක් පමණ වේ.

- 2015 වර්ෂයේ දී කෘෂි විද්‍යා උපාධිධාරී ගුරුභවතුන් 24ක් සහ කෘෂි විද්‍යා ශික්ෂණ ඩිප්ලෝමාධාරීන් 60 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කිරීම
- නවක ගුරුභවතුන් සහ පද්ධතියේ සිටින ගුරුභවතුන් 340ක් සඳහා ජෛව තාක්ෂණ විෂයයට අදාළ ව ජාතික අධ්‍යාපන ආයතනය හා එක් ව පුහුණු වැඩසටහන් 4ක් පැවැත්වීම
- ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය මාලාවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් 32ක් ආවරණය කරමින් දින 8ක නේවාසික වැඩසටහනක් කැලණිය විශ්වවිද්‍යාලයේ දී පැවැත්වීම
- “අ.පො.ස. (උ.පෙ) ජෛව පද්ධති තාක්ෂණවේදය ප්‍රායෝගික ක්‍රියාකාරකම් අත්වැල” පොත සකස් කර මුද්‍රණය කර පාසල් වෙත බෙදාහැරීම
- ජෛව පද්ධති තාක්ෂණවේදය විද්‍යාගාර උපකරණ පාසල් 250කට ලබා දෙන ලද අතර විෂයය පිළිබඳ සිසුන් ගුරුභවතුන් හා ප්‍රජාව දැනුමවත් කිරීම සඳහා වාර්තාමය වීඩියෝ පටයක් ද සකස් කිරීම

**අ.පො.ස. (උ.පෙ.) කෘෂි විද්‍යාව**

- විෂය නිර්දේශයට අදාළ කෘෂි තාක්ෂණය පිළිබඳ කෘෂිකර්ම නිලධාරීන්, ගුරු උපදේශකවරුන් හා ගුරුභවතුන් පුහුණු කිරීමේ වැඩසටහන් 8ක් පැවැත්වීම

**කෘෂි හා ආහාර තාක්ෂණය හා ජලජ ජීව සම්පත් තාක්ෂණය**

- 10 ශ්‍රේණිය නව විෂය නිර්දේශය 2015 දී ක්‍රියාත්මක වූ අතර ඒ අනුව 2015 දී ක්‍රියාත්මක වන 11 ශ්‍රේණියේ විෂය නිර්දේශය පිළිබඳ ව ගුරුභවතුන් හා අදාළ නිලධාරීන් පුහුණු කිරීම
- අ.පො.ස. (සා.පෙ.) සිසුන්ගේ න්‍යායික දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය සඳහා සමස්ත ලංකා කෘෂි විද්‍යා දැනුම මිනුම තරගාවලියක් පැවැත්වීම

**පරිසරයේ යහපැවැත්ම උදෙසා පරිසරය පිළිබඳ අධ්‍යයනය හා නිරීක්ෂණය කිරීමේ ජාත්‍යන්තර වැඩසටහන (GLOBE)**

- ගුරුභවතුන් 40ක ගේ සහභාගිත්වයෙන් ගුරු පුහුණු වැඩසටහන් 3ක් හා ලෝක පරිසර දිනය හා ජල දිනයට සමගාමී ව සිසු කඳවුරු හා විවිධ වැඩසටහන් පැවැත්වීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල<br>ESDP<br>TSEP | 24.43 |

## 5.12 ආගමික හා සාරධර්ම අධ්‍යාපනය

- ගුරු සහායක වශයෙන් බඳවාගත් ධර්මාචාර්ය සමතුන් වැඩමුළු 17ක් මඟින් පුහුණු කිරීම
- කතෝලික ධර්මය උගන්වන ගුරුවරුන් 625ක් වැඩමුළු 8ක් මඟින් ද, හින්දු ධර්මය උගන්වන ගුරුවරුන් 101ක්, ඉස්ලාම් ධර්මය උගන්වන ගුරුවරු 210ක් වැඩමුළු 3ක් මඟින් හා කතෝලික ධර්මය උගන්වන ගුරුවරුන් 41ක් වසර තුළ පුහුණු කිරීම
- අමාත්‍යාංශය තුළ නවරාත්‍රි පූජාව පැවැත්වීම හා නත්තල් දිනය සැමරීම කරන ලදි

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 4.36 |

## 5.13 විෂය සමගාමී ක්‍රියාකාරකම්, ශිෂ්‍ය උපදේශන වැඩසටහන් හා සාම අධ්‍යාපනය

**ශිෂ්‍ය මාර්ගෝපදේශය හා උපදේශනය**

- පාසල් වෘත්තීය මාර්ගෝපදේශ ගුරුවරුන් 736ක් සඳහා දැනුම්වත් කිරීමේ දෙදින පුහුණු වැඩසටහන් පැවැත්වීම
- මාර්ගෝපදේශ හා උපදේශන සේවාවේ නියැලෙන සම්පත් පුද්ගලයින් 105ක් සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් පැවැත්වීම
- පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන ගුරු පුහුණු මොඩියුලයක් නිර්මාණය කිරීම
- අ.පො.ස. (උ.පෙ.) තාක්ෂණවේදය විෂයය ධාරාවට ශිෂ්‍යයන් යොමුවීම වැඩිකිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩමුළු පැවැත්වීම

**විෂය සමගාමී කටයුතු**

- රත්නපුර හා කුරුණෑගල දිස්ත්‍රික්කවල ශිෂ්‍ය නායක නායිකාවන් 300ක් සහ ගුරුවරුන් හා සම්පත් පුද්ගලයින් 100ක් පමණ සහභාගි වූ ශිෂ්‍ය නායකත්ව සංවර්ධනය වැඩසටහන පැවැත්වීම
- ශිෂ්‍යයන් 2641ක් හා ගුරුවරුන් 530ක් සඳහා සෞඛ්‍යදාන ව්‍යාපාරය පිළිබඳ ව වැඩමුළු පැවැත්වීම
- ශිෂ්‍යයන් 260ක් හා ගුරුවරුන් 491ක් සඳහා බාලදක්ෂිකා සංගමය පිළිබඳ ව වැඩමුළු පැවැත්වීම
- බාලදක්ෂ සංගමයේ ශිෂ්‍යයන් 1413ක් හා ගුරුවරුන් 876ක් සඳහා වැඩමුළු පැවැත්වීම
- සමස්ත ලංකා ඡායාරූප තරගාවලිය, 2014 ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වීම හා 2015 තරගාවලිය අවසන් කිරීම

**සාම අධ්‍යාපනය**

- සෙනෙහසක තක්සලාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් 4ක් 150ක සහභාගිත්වයෙන් පැවැත්වීම
- දෙනුවර මිතුරෝ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 7ක් 900ක සහභාගිත්වයෙන් පැවැත්වීම හා දෙනුවර මිතුරෝ වැඩසටහන් 2ක් 720ක සහභාගිත්වයෙන් පැවැත්වීම

- ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන් 2ක් 180කගේ සහභාගිත්වයෙන් පැවැත්වීම
- පළාත් හා කලාප සම්බන්ධීකරණ නිලධාරී ධාරිතා සංවර්ධන වැඩසටහනක් 100කගේ සහභාගිත්වයෙන් පැවැත්වීම

**මත්ද්‍රව්‍ය නිවාරණය**

- පුහුණුව හා දැනුම්වත් කිරීම් : මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ සම්බන්ධීකරණ නිලධාරීහු 195ක් හා පාසල් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු බාර නියෝජ්‍ය විදුහල්පතිවරු 38 දෙනෙක් ද අධ්‍යාපන විද්‍යාපීඨ 14ක අභ්‍යාසලාභී ගුරුවරු 2626 දෙනෙකු පුහුණු වැඩසටහනක්ද හරහා දැනුම්වත් කරන ලදහ
- උපදේශන ගුරුවරුන් 437 දෙනෙකු පාසල් වෘත්තීය මාර්ගෝපදේශය පිළිබඳ ව දැනුම්වත් කිරීම
- කලාප මට්ටමින් තෝරාගත් පළපුරුදු ගුරු උපදේශකවරුන් 70 දෙනෙකු පුහුණු කර පාසල් උපදේශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා යොමු කිරීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | **5.95** |

## 5.14 සෞන්දර්ය අධ්‍යාපනය

- සෞන්දර්ය ගුරු පුහුණුව - අතිදුෂ්කර කලාප කේන්ද්‍ර කර ගනිමින් චිත්‍ර ගුරුවරුන් 411 ක් නැටුම් ගුරුවරුන් 703 ක්, සංගීත ගුරුවරුන් 1,690 ක් , නාට්‍ය හා රංගන කලාව ගුරුවරුන් 231ක්, බටහිර සංගීත ගුරුවරුන් 220ක් වන සේ ගුරුවරුන් 3,255ක් පුහුණු කිරීම.
- සෞන්දර්ය විෂයයන් සංවර්ධනය සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය ව වැඩසටහන්
    - ළමුන් 100කගෙන් සමන්විත ජාතික තරුණ වාද්‍ය වෘන්දය මාසික ව පුහුණු කිරීම
    - මඩකලපුව හා හැටන් හි ශනි දින බහුශිල්ප මධ්‍යස්ථාන මඟින් සිසුන් 4500කට වසර තුළ පුහුණුවීම් ලබා දීම.
    - " සංගීත" ශාස්ත්‍රීය සඟරාව එළි දැක්වීම
- අතිදුෂ්කර කලාපවල සිසුන්ගේ සෞන්දර්ය විෂයයන් හි දැනුම සංවර්ධනය සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය වැඩමුළු පැවැත්වීම (චිත්‍ර කලා විෂය සඳහා සිසුන් 1,125, ශාස්ත්‍රීය සංගීතය 680)
- සමස්ත ලංකා සෞන්දර්ය තරග - සංගීත, නැටුම්, චිත්‍ර, බටහිර සංගීත හා නාට්‍ය හා රංග කලා තරග පවත්වා ජයග්‍රහණ ලැබූ ළමුන් 38,850 ක් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම.
- උපකරණ සැපයීම - පාසල් 61කට රු.මි. 10.7 ක් වටිනා සෞන්දර්ය උපකරණ ලබාදුන් අතර පාසල් 22කට උපකරණ අලුත්වැඩියා සඳහා ප්‍රතිපාදන ලබා දීම

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | **14.75** |







## 5.15 පාසල් පුස්තකාල සංවර්ධනය

- 'පාසල් සිසුන් සඳහා කියවීම් කඳවුරු පැවැත්වීම' යන වැඩසටහන යටතේ පාසල්වලට බෙදා දීමට පොත් මිලදී ගන්නා ලදී.
- "කියවමු-දිනමු" සමස්ත ලංකා ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනේ ලිඛිත පරීක්ෂණය පවත්වන ලදී.
- කියවීම් මාසය සැමරීම වෙනුවෙන් පාසල් දැනුම්වත් කර පාසල් මට්ටමින් වැඩසටහන් පවත්වන ලදී.
- තාක්ෂණ විෂය ධාරාවට අදාළ පොත්, 2014 වසරේ අ.පො.ස. (සා.පෙ.) ඉහළින් සමත් සිසුන්ට ලබා දෙන පොත් හා ආසියානු පදනම් ආයතනයෙන් ලද පොත්, පාර්සල් කර බෙදාහැරීමේ කටයුතු සිදු කරන ලදී.

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 4.21 |

## 5.16 ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා

සෑම ශිෂ්‍යයෙකුම කිසියම් ක්‍රීඩාවක නිරත කරවීමේ අරමුණින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- ප්‍රාථමික අංශයේ සිසුන් දිනපතා ක්‍රියාකාරකම්වලට යොමු කරවීමට සෑම කලාපයකට ම සම්පත් ගුරුවරුන් පත් කිරීම : ප්‍රාථමික පාසල්වලින් 82%ක පමණ වැඩසටහන් ක්‍රියාත්මක වේ.
- ප්‍රාථමික අංශ සඳහා ළමා මලල ක්‍රීඩා තරගාවලිය : කලාප 30ක තරග අවසන් කර ඇත.
- ද්විතීයික අංශයේ සිසුන් වෙනුවෙන් ප්‍රධාන ක්‍රීඩා 6ක් ව්‍යාප්ත කිරීම :
  ගුරුභවතුන් 324 දෙනෙකු පුහුණු කර සම්පත් පුද්ගලයින් ලෙස යොදවා ඇත.
- වාර විභාගයේ දී ක්‍රීඩාවලට ලකුණු දීම :
  20%ක් පමණ පාසල්වල ලකුණු දීම ආරම්භ කර ඇත.

දක්ෂතා ඇති ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාත්‍යන්තර මට්ටමට රැගෙන යාම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්

- ප්‍රධාන ක්‍රීඩා 6 සඳහා දක්ෂතම ක්‍රීඩක ක්‍රීඩිකාවන් 20 දෙනෙකු බැගින් තෝරාගෙන පුහුණු කර ජාත්‍යන්තර තරග සඳහා ඉදිරිපත් කිරීම.
- ආසියානු පාසල් මලල ක්‍රීඩා තරගාවලි රන් පදක්කම් 5ක් රිදී පදක්කම් 5 සහ ලෝකඩ පදක්කම් 1ක් දිනා ගැනීම
- ආසියානු යොවුන් ක්‍රීඩා උළෙලේ දී රන් පදක්කමක් හා රිදී පදක්කම් 2ක් දිනා ගැනීම
- පොදු රාජ්‍ය මණ්ඩලීය යෞවන ක්‍රීඩා උළෙලේ දී රිදී පදක්කම් 2ක් දිනා ගැනීම
- ශ්‍රී ලංකාවේ ප්‍රථම ක්‍රීඩා උපාධිය ලබා ගත් උපාධිධාරීන් 65 දෙනෙකු ශාරීරික අධ්‍යයන ගුරුවරුන් ලෙස බඳවා ගැනීම.
- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යයන විෂය උගන්වන ගුරු භවතුන්ගේ ධාරිතා සංවර්ධනය :
  පළාත් 5ක් අවසන් කරන ලදි
- ක්‍රීඩා පාසල් 17ක ඉගෙනුම ලබන ක්‍රීඩා ශිෂ්‍යත්වධාරීන් 702ක් වෙනුවෙන් දීමනා ගෙවීම සඳහා සහ අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා රු.මි. 26.45ක මුදලක් එම පාසල් වෙත වෙන් කර දෙන ලදි.
- 2015 සමස්ත ලංකා මලල ක්‍රීඩා තරගයේ දී දක්ෂතා දැක්වූ සියලු ම ක්‍රීඩකයන් සඳහා රු.20000 බැගින් මුදල් පරිත්‍යාගයක් ද දක්ෂතම මලල ක්‍රීඩකයාට හා දක්ෂතම මලල ක්‍රීඩිකාවට රු.100,000 බැගින් මුදල් පරිත්‍යාග ද පිරිනැමිණි.

| වියදම 2015 | රු.මි |
|---|---|
| ඒකාබද්ධ අරමුදල | 69.59 |















Awarding of



# 06. අධ්‍යාපන වෘත්තීය සේවාවන් බලගැන්වීම

## 6.1 ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම

**6.1.1. වගුව ගුරු සේවය සඳහා 2015 වර්ෂයේ බඳවා ගැනීම - මාධ්‍ය අනුව**

| ගුරු වර්ගය | සිංහල මාධ්‍යය | | දෙමළ මාධ්‍යය | | ඉංග්‍රීසි මාධ්‍යය | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | ජාතික පාසල් | පළාත් සභා පාසල් | ජාතික පාසල් | පළාත් සභා පාසල් | ජාතික පාසල් | පළාත් සභා පාසල් | |
| ඉංජිනේරු ඩිප්ලෝමාධාරීන් | 33 | 16 | 10 | 6 | - | - | 65 |
| ශාරීරික අධ්‍යාපන උපාධිධාරීන් | 69 | - | - | - | - | - | 69 |
| ජෛව පද්ධති තාක්ෂණ උපාධිධාරීන් | 8 | 6 | 16 | 8 | - | - | 38 |
| තාක්ෂණය සඳහා විද්‍යාව උපාධිධාරීන් | 3 | 3 | 14 | 10 | - | - | 30 |
| අධ්‍යාපනවේදී උපාධිධාරීන් | - | 94 | - | - | - | - | 94 |
| බටහිර සංගීත උපාධිධාරීන් | 39 | 27 | - | - | - | - | 66 |
| තොරතුරු තාක්ෂණ උපාධිධාරීන් | 84 | 128 | - | - | - | - | 212 |
| ශික්ෂණ විද්‍යාපීඨ | 878 | 2197 | - | - | - | - | 3075 |
| වතු පාසල් ගුරු සහායක | - | - | - | 2216 | - | - | 2216 |
| **එකතුව** | **1114** | **2471** | **40** | **2240** | **-** | **-** | **5865** |

මූලාශ්‍රය : ගුරු ආයතන ශාඛාව

## 6.2 ගුරු අධ්‍යාපනය සහ ගුරු සංවර්ධනය

### 6.2.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

**ගුරු සිසුන් බඳවා ගැනීම**

- 2018 දී විද්‍යාපීඨ ශික්ෂණ ඩිප්ලෝමාලාභීන් ලෙස ගුරුසේවයට එකතුවීම සඳහා පූර්වසේවා ගුරු අධ්‍යාපනය ලබා දීමට විද්‍යාපීඨ සඳහා සිසුහු බඳවා ගැනීමට සැලසුම් කරන ලද අතර දුෂ්කර ප්‍රදේශවල ගුරු හිඟයට පිළියම් සැලසෙන පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පවතින ගුරු පුරප්පාඩු මත එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් පහත සඳහන් පරිදි බඳවා ගැනීමට සැලසුම් කරන ලදි.

| | |
|---|---|
| සිංහල මාධ්‍යය | - 1,765 |
| දෙමළ මාධ්‍යය | - 1,195 |
| ඉංග්‍රීසි මාධ්‍යය | - 740 |
| **එකතුව** | **- 3,700** |

විද්‍යාපීඨ සංවර්ධනය හා විද්‍යාපීඨ සුපරීක්ෂණ කටයුතු සිදු කිරීම

- 2015 වසර විද්‍යාපීඨ වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංවර්ධනය කිරීම
- තෝරාගත් විද්‍යාපීඨ 4ක් සම්පූර්ණයෙන් නවීකරණය කිරීම හා අනෙක් විද්‍යාපීඨවලට අවශ්‍ය අලුත්වැඩියා සිදු කිරීම
- විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්ගේ පවතින ගැටලු පිළිබඳ සොයා බැලීමට මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- මහරගම නව විද්‍යාපීඨයේ සියලු ඉදිකිරීම් නිම කර අධ්‍යයන කටයුතු ඇරඹීම
- විද්‍යාපීඨ ශික්ෂණලාභීන්ගේ ආහාර දීමනාව රු.1,000කින් වැඩි කිරීම
- පීඨවලට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව 3,000 සිට 6,000 දක්වා වැඩිකිරීම
- කොරියානු ආධාර යටතේ ඉදිවන තාක්ෂණ විද්‍යාපීඨය ඉදිකිරීම සම්බන්ධ ව මූලික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම

### 6.2.2 ගුරු විද්‍යාල

- ගුරු අධ්‍යාපන ආයතනවල ඉහළ කළමනාකරුවන් සඳහා සමාජ ඒකාග්‍රතාව සංවර්ධනය පිළිබඳ ව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා වැඩමුළු දෙකක් පැවැත්වීම
- ගුරු විද්‍යාල 03ක් නවීකරණය සඳහා කටයුතු ආරම්භ කිරීම
- නුපුහුණු ගුරුවරුන් 547ක් දැවුරුදු ගුරු පුහුණුව සඳහා ගුරු විද්‍යාලවලට බඳවා ගැනීම

### 6.2.3 ගුරු මධ්‍යස්ථාන

- නව ගුරු සේවා ව්‍යවස්ථානුකූල මොඩියුල ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන් හා ගුරු විද්‍යාල විදුහල්පතිවරුන් දැනුම්වත් කර වැඩමුළු ක්‍රියාත්මක කිරීම
- අදාළ චක්‍රලේඛය හා අත්පොත් මුද්‍රණය කර බෙදාහැරීම හා පුහුණුකරුවන් පුහුණු කිරීම
- ගුරු මධ්‍යස්ථාන සියල්ල නවීකරණය කිරීමට සැලසුම් කර ඇති අතර ආරම්භක වශයෙන් මධ්‍යස්ථාන 40ක අංග සම්පූර්ණ සියලු පහසුකම් සහිත දෙමහල් ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගැනීම
- අවශ්‍ය භෞතික සම්පත් ලබාදීම
- කලාප මට්ටමින් හඳුනාගත් ගුරු පුහුණු අවශ්‍යතා සඳහා වැඩසටහන් 5ක් සකස්කර එක් මධ්‍යස්ථානයකට රු. 10,000 බැගින් මධ්‍යස්ථාන 109 ක් සඳහා ප්‍රතිපාදන ලබාදීම

### 6.2.4 පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන

- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන ශ්‍රී ලංකාව තුළ සියලු ම පාසල් කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමින් අධ්‍යාපන කලාප කේන්ද්‍ර කරගනිමින් හඳුන්වාදීම
- පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහන් සඳහා තාක්ෂණික සහාය ලබා දීමට උපකරණ කට්ටල සකස් කිරීම
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාල මඟින් පද්ධතියට එකතුවන නවක ගුරුවරුන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම
- සාර්ථක පන්ති කාමර ව්‍යවහාර හඳුනා ගැනීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

### 6.2.5 ගුරු අවශ්‍යතා ගණනය කිරීමට නව චක්‍රලේඛයක්

- වත්මන් අවශ්‍යතාවලට ගැළපෙන පරිදි ගුරුවරුන් බඳවා ගැනීම සඳහා නව චක්‍රලේඛයක් සකස්කොට පළාත්වල එකඟතාව ලබාගැනීමට යැවීම

## 6.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවය

2014.10.22 දින සිට ක්‍රියාත්මක වන නව සේවා ව්‍යවස්ථාවට අනුව නිලධාරීන් 11,670 දෙනෙකු අදාළ ශ්‍රේණියට අන්තර් ග්‍රහණය කර 1,727 දෙනෙකුට පළමු පන්තියටඋසස්වීම් ලබා දෙන ලදි.

## 6.4 ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

- 1 පන්තිය
    - ♦ දිගුකාලීන ව පැවති පුරප්පාඩු පිරවීමට වර්ෂය තුළ කටයුතු කරන ලදි. ඒ අනුව 2006 සිට 2013 දක්වා පැවති 1 පන්තියේ පුරප්පාඩු පිරවීම සඳහා 22 දෙනෙකු I පන්තියට උසස් කිරීම සිදු විය.
    - ♦ 2014.07.01 දිනට පැවති පුරප්පාඩු 5ක් සඳහා උසස් කිරීමට අයදුම්පත් කැඳවීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි.
- 2-I පන්තිය
    - ♦ 2014.07.01 දිනට පැවති පුරප්පාඩු 44ක් සඳහා අයදුම්පත් කැඳවන ලදි.
- 2-II පන්තිය
    - ♦ 2014.07.21 දිනට පැවති පුරප්පාඩු 52ක් සඳහා අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයට සැලසුම් කරන ලදි.
- 3 පන්තිය
    - ♦ 2014 දෙසැම්බර් මස බඳවා ගැනීමේ දී සම්පූර්ණ නොවූ පුරප්පාඩු 55ක් සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කොට නැවත අයදුම්පත් කැඳවන ලදි.
    - ♦ 3 පන්තියේ පැවති පුරප්පාඩු පිරවීම සඳහා 195 ක් වසර තුළ අලුතින් බඳවා ගැනීම සිදු කරන ලදි.
- බඳවා ගත් නිලධාරීන් සඳහා දින 23ක පුහුණුවක් ලබා දී විද්‍යාපීඨ සඳහා ස්ථානගත කරන ලදි.
- අංක 1925/37 හා 2015.07.28 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම ආරම්භ කෙරිණි.
- නව සේවා ව්‍යවස්ථාව අනුව ගණනය කළ පුරප්පාඩු 1,190ක් සඳහා බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදනය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිසමට ඉදිරිපත් කරන ලදි.

## 6.5 ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

- 2015.08.21 දින සිට ක්‍රියාත්මකවන පරිදි නව සේවා ව්‍යවස්ථාව ගැසට් කරන ලදි.
- ඒ අනුව පුරප්පාඩු ගණනය කර 850ක් බඳවා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලදි.

## 6.6 අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම්

| සේවය හා ශ්‍රේණිය | ජාතික පාසල් | විද්‍යාපීඨ | ගුරු විද්‍යාල | ගුරු මධ්‍යස්ථාන |
|---|---|---|---|---|
| | බඳවාගත් සංඛ්‍යාව | බඳවාගත් සංඛ්‍යාව | බඳවාගත් සංඛ්‍යාව | බඳවාගත් සංඛ්‍යාව |
| පාසල් කම්කරු/කම්කරු | 950 | 210 | 140 | 100 |
| මුරකරු | 160 | 17 | - | - |
| අරක්කැමි | 43 | 13 | 01 | - |
| සනීපාරක්ෂක කම්කරු | 156 | 31 | 04 | 04 |
| විදුලි කාර්මික/ජලනල කාර්මික | - | 04 | - | - |
| සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි (ගැහැණු/පිරිමි) | - | 43 | - | - |
| සහකාර නේවාසිකාගාර පාලක/ පාලිකා | 77 | - | - | - |

## 6.7 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

**වෘත්තීය සංවර්ධන වැඩසටහන් - දේශීය හා විදේශීය**

| | වැඩසටහන | සහභාගිත් වය |
|---|---|---|
| 1 | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය -2014 විවෘත කණ්ඩායම එක් අවුරුදු අධ්‍යාපන පරිපාලන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන | 138 |
| 2 | 2014 අධ්‍යාපන පරිපාලන සේවය සීමිත කණ්ඩායම නවක නිලධාරි පුහුණු වැඩසටහන | 168 |
| 3 | ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III නවක නිලධාරීන් දිශාභිමුඛ කිරීමේ වැඩසටහන් (සිංහල හා දෙමළ ) | 220 |
| 4 | පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාල ප්‍රසම්පාදන කාර්යයෙහි නියැලෙන නිලධාරී ධාරිතා සංවර්ධන වැඩසටහන | 313 |
| 5 | කලාප හා කොට්ඨාස අධ්‍යාපන කාර්යය ශක්තිමත් කිරීමේ වැඩසටහන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් ,කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් | 284 |
| 6 | සැලසුම් විෂයභාර නියෝජ්‍ය හා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා කුසලතා සංවර්ධන වැඩසටහන | 40 |
| 7 | අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීයේ කාර්යභාරය හා ඉලක්ක හඳුනා ගැනීම සඳහා වූ වැඩමුළුව | 155 |
| 8 | කාර්යාල කළමනාකරණය පිළිබඳ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල කාර්ය මණ්ඩල නිලධාරීන් දැනුම්වත් කිරීම | 150 |
| 9 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ දෙමළ මාධ්‍ය කථිකාචාර්යවරු සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන | 71 |
| 10 | පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලවල මූල්‍ය කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ මූල්‍ය කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන | 354 |
| 11 | උසස් කිරීමේදී වැටුප් සකස් කිරීම පිළිබඳ ව රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන | 126 |
| 12 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ කතිකාචාර්යවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන | 71 |
| 13 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල කාර්ය මණ්ඩල සඳහා මූල්‍ය කළමනාකරණ වැඩසටහන | 48 |
| 14 | ජාතික පාසල් විදුහල්පතිවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන | 200 |
| 15 | අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා ලිපිගොනු කළමනාකරණ පුහුණු වැඩසටහන | 666 |
| 16 | අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම වෙනුවෙන් ප්‍රතිපාදන ලබාදීම | 20 |
| 17 | අමාත්‍යාංශ විමර්ශන නිලධාරීන් සඳහා මූලික විමර්ශන පැවැත්වීම පිළිබඳ වැඩසටහන | 45 |
| 18 | ද්විතියික පාසල්1000 වැඩසටහනට අයත් පාසල්වල විදුහල්පතිවරුන් සඳහා තායිලන්තයේ පුහුණු වැඩසටහන | 30 |
| වියදම රු.මි. 63.5 | | |

# 07. සැලසුම්කරණය හා කාර්යසාධන ඇගයීම් ක්‍රියාවලිය සවිබල ගැන්වීම

## 7.1 ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය

- 2015 වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම හා 2016-2020 අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහනට අදාළ ක්‍රමෝපායික මධ්‍යකාලීන සැලසුම් හා 2016 වාර්ෂික සැලසුම් සකස් කිරීමට පියවර ගන්නා ලදි.

- ව්‍යාපෘති යෝජනා 43ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදි. ඉන් යෝජනා 10ක් සඳහා 2016 අයවැය යෝජනා යටතේ ප්‍රතිපාදන වෙන් ව ඇත.

- නව අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිබඳ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කමිටු පත් කර ඉදිරිපත් වූ යෝජනා අනුව වාර්තා සකස් කර ඉදිරි කටයුතු සඳහා පියවර ගන්නා ලදි.

- සියලු ජාතික පාසල් වලට ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන ලබාදීම සඳහා ක්‍රමවේදය පිළියෙල කිරීම, ඊට අදාළ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය පිළියෙල කිරීම හා ජාතික පාසල් 352ක් සඳහා ප්‍රදාන ලබා දීම.

## 7.2 විදේශාධාර වැඩසටහන් සම්බන්ධීකරණය හා ප්‍රතිඵල ඇගයීම

- TSEP (ලෝක බැංකු) හා DFAT නිරීක්ෂණ කණ්ඩායම් සහ පළාත් හා රේඛීය අමාත්‍යාංශ මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන අතර සම්බන්ධීකරණය

- ESDP/ ADB,DFAT, UNICEF, KOICA, GIZ, USAID, Save the Children යන විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය

- TSEP ව්‍යාපෘතියේ කාර්යසාධන දර්ශක (DLI) හා බැඳුණු ක්‍රියාකාරකම් පිළිබඳව තුන්වන පාර්ශ්වීය ඇගයීම් නිම කිරීම

- ESDP/ ADB වැඩසටහනට අදාළව කාර්යසාධන ප්‍රතිඵල (DLR) හා බැඳුණු ක්‍රියාකාරකම් පිළිබඳ ව ප්‍රගති සමාලෝචනය ESDP / SMTSU ඒකකය හරහා සියලු පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් සිදු කිරීම

## 7.3 ප්‍රමිති පාදක පාසල් ඇගයීම්කරණ ක්‍රියාවලිය

- ප්‍රමිති පාදක පාසල් ඇගයීම්කරණය සඳහා "අපේ පාසල කොතරම් ගුණාත්මක ද?" නමින් සංශෝධිත නව ඇගයීම් මාර්ගෝපදේශයක් හඳුන්වා දීම
    - ♦ හඳුනාගත් ක්ෂේත්‍ර 8ක් ඔස්සේ අභ්‍යන්තර හා බාහිර වශයෙන් පාසල් ඇගයීමට ලක් කෙරේ.
    - ♦ නිර්ණායක අනුව ඒ ඒ ක්ෂේත්‍රවලට ලකුණු ලබා දී පාසල් අධ්‍යයන ගුණාත්මක දර්ශකය (SEQI) ගණනය කෙරේ.

2015 වර්ෂයේ ඇගයීමට ලක් වූ පාසල් සංඛ්‍යාව

| පළාත | ඇගයීමට ලක් වූ පාසල් |
|---|---|
| බස්නාහිර | 626 |
| මධ්‍යම | 794 |
| දකුණු | 493 |
| උතුර | 602 |
| නැගෙනහිර | 680 |
| වයඹ | 933 |
| උතුරු මැද | 482 |
| ඌව | 720 |
| සබරගමුව | 302 |
| එකතුව | 5632 |

- බාහිර ඇගයීම් ලකුණු අනුව පාසල් අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 50%ට අඩු ජාතික පාසල් 15ක නියෝජ්‍ය විදුහල්පතිවරුන් 30 දෙනෙකු සඳහා විශේෂ පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- පාසල් මට්ටමින් ක්‍රියාත්මක කරන යහපත් ව්‍යවහාර 185 ක් හඳුනා ගෙන ඇගයීමට ලක් කිරීම
- පන්ති වාර්තා පොත සඳහා ජාතික මට්ටමින් ආකෘතියක් සකස් කර මෘදු පිටපත පළාත් වෙත බෙදාහැරීම
- "ගුරු කාර්යය ඇගයීම සඳහා භාවිත කළ හැකි වන සේ ගුරු වාර්තා පොතක් සකස් කර පිටපත් 250,000ක් මුද්‍රණය කර සෑම ගුරුවරයෙකුට ම පිටපත බැගින් ලබා දීම
- විදුහල්පතිවරුන්, ගුරුවරුන් හා ගුරු ශිෂ්‍යයින් සතු විය යුතු නිපුණතා හඳුනා ගනිමින් එම නිපුණතා ඇතුළත් ලේඛනයක් සකස් කිරීම
- සෑම පළාතකින් ම තෝරා ගත් ගුරුවරුන් විදුහල්පතිවරුන් හා පරිවේණාචාර්යවරුන් 890ක් 2015.10.06 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී උත්සවයක් පවත්වා ඇගයීමට ලක් කිරීම
- කලාප කාර්යාල ඇගයීම සඳහා නව ක්‍රමවේදයක් ලෙසින් විද්‍යුත් දත්ත පාදකයක් හඳුන්වා දීම
- පළාත් හා කලාපවල පාසල් ඇගයීම් ක්‍රියාවලිය භාර නිලධාරීන් පර්යේෂණ සඳහා යොමු කිරීම

## 7.4 පෞද්ගලික පාසල් කටයුතු විධිමත් කිරීම

- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සේවය කිරීම සඳහා බඳවා ගන්නා ගුරුභවතුන්ගේ පත්වීම් අනුමත කිරීමේ යෝජනා පත්‍ර කල්ගතවීමෙන් පසු ව ඉදිරිපත් කිරීම වැළැක්වීම සඳහා උපදෙස් ලබා දීම
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල කළමනාකරුවන්ගේ නම් රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා තොරතුරු කැඳවීම
- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් පිහිටුවීම, ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල සේවය කිරීමට පැමිණෙන හා අධ්‍යාපනය සඳහා මෙරටට පැමිණෙන විදේශිකයින්ගේ වීසා නිර්දේශ කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ඇතුළත් යෝජනාවක් කෙටුම්පත් කිරීම
- රජයේ දින 100 වැඩසටහන යටතේ ජාත්‍යන්තර පාසල් නියාමනයට ලක් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීමට පුවත්පත්වල පළ කරන ලද දැන්වීමට අනුව ජාත්‍යන්තර පාසල් 181ක තොරතුරු ලැබී ඇත
- ජාත්‍යන්තර පාසල් නියාමනය සඳහා 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල ( අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංශෝධනයක් ඉදිරිපත් කරන ලද අතර එය අධ්‍යාපනය පිළිබඳ අනුකාරක සභාවේ නිර්දේශ ලබාගැනීමට යොමු කිරීමට තීරණය කර ඇත
- 2015 වර්ෂය තුළ පෞද්ගලික පාසල් 21ක් අධීක්ෂණයට ලක් කරන ලදි

## 7.5 සැමට අධ්‍යාපනය ඉලක්ක සපුරාගැනීම කරා යොමු වූ ප්‍රවේශ


- පාසලේ පළමුවැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවන්ගේ පාසලට ඇති සූදානම තක්සේරුකරණය සඳහා "පාසල් අධ්‍යාපනයට ප්‍රීතිමත් ආරම්භයක් " ක්‍රියාකාරකම් 16ක් ඇතුළත් උපදෙස් සංග්‍රහය නිකුත් කිරීම.
- උපදෙස් සංග්‍රහය භාවිතය පිළිබඳ ව සම්පත්දායකයින් ලෙස ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම හා 2016 වර්ෂයේ පළමු වැනි ශ්‍රේණියට ඇතුළත් වන දරුවන් ඇගයීමට යොමු කිරීම.
- "ඉගෙනුමට නොහැකි දරුවකු නොමැත" යන අන්තර්කරණ අධ්‍යාපන උපදෙස් සංග්‍රහය සියලු ම පළාත්වලට බෙදාදීම.
- පළාත් මට්ටමේ පුහුණුව සඳහා මුදල් වෙන්කර දීම.

## 7.6 අධ්‍යාපන පර්යේෂණ ප්‍රවර්ධනය

- අධ්‍යාපන පර්යාලෝක පර්යේෂණ සඟරාව 4 වන වෙළුම I හා II කලාප 1500 බැගින් මුද්‍රණය කිරීම.
- අධ්‍යාපන පර්යාලෝක පර්යේෂණ සඟරාව ඉදිරි කලාපය වන 5 වන වෙළුම 1 කලාපය පළ කිරීම සඳහා කාලීන පර්යේෂණ සම්භාව්‍ය ලිපි එකතු කිරීම
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධන කටයුතුවලින් සංවර්ධනය කර ගැනීමේ අරමුණින් පර්යේෂණ කටයුතුවලින් සංවර්ධනය කර ගැනීමේ අරමුණින් පර්යේෂණ ක්‍රමවේදය මැයෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය හා ඒකාබද්ධ ව ක්‍රියාත්මක කිරීම
- ගුරුවරුන් 107ක් සඳහා පර්යේෂණ ප්‍රදානයන් ලබාදීම

## 7.7 අධ්‍යාපන සැලසුම් නියාමන ක්‍රමවේදය ශක්තිමත් කිරීම

අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව යටතේ වන ජාතික අධ්‍යාපන අභිමතාර්ථ, විෂයානුබද්ධ අරමුණු, ක්‍රමෝපායයන්, වැඩසටහන් ක්‍රියාකාරකම් හා එම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ විස්තරත් ප්‍රතිලාභීන් පිළිබඳ විස්තරත් විෂයයන් වශයෙන් වෙන් වෙන් ව ඇතුළත් කොට සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධන සැලසුම් විශ්ලේෂණය කළ හැකි වන පරිදිත් ඊට සමගාමී ව ප්‍රගතිය ඇතුළත් කොට ප්‍රතිඵල ළඟා කර ගැනීම පිළිබඳ තර්කානුකූල ව විශ්ලේෂණය කළ හැකි අයුරින් සකස් කරන ලද තොරතුරු පද්ධතියෙහි (Education Project Monitoring Information System) කාර්යයන් 80% ක් පමණ නිම කරන ලදි. අමාත්‍යාංශයේ සියලු ම ශාඛාවල හා පළාත් 8ක නිලධාරීහු මේ පිළිබඳ පුහුණු කරන ලදහ.




(A1) Branch: Monitoring & Performance Review Branch
(A2) Year: 2015
(G5) Month: August

<40 | >=40 & <65 | >=65 & <80 | >=85

**Activity:** Development of the information system covering all the data fields in ESDFP
**Programme:** Education Project Monitoring Information System(EPMIS)

| Category | KPI | Annual Target | Cumulative Target upto Current Month | Cumulative Progress upto Current Month | Progress % |
|---|---|---|---|---|---|
| Process | Percentage Completed | 100 | 100 | 100 | 100.0 |

**Activity:** Train MoE officers on data entry into the system by subject
**Programme:** Education Project Monitoring Information System(EPMIS)

| Category | KPI | Annual Target | Cumulative Target upto Current Month | Cumulative Progress upto Current Month | Progress % |
|---|---|---|---|---|---|
| Output | No. of Officers trained | 80 | 80 | 84 | 105.0 |
| Process | Percentage Completed | 100 | 100 | 110 | 110.0 |

**Activity:** Follow up and continuous support to users to update the progress
**Programme:** Education Project Monitoring Information System(EPMIS)

| Category | KPI | Annual Target | Cumulative Target upto Current Month | Cumulative Progress upto Current Month | Progress % |
|---|---|---|---|---|---|
| Output | No. of Reports Prepared | 9 | 5 | 2 | 40.0 |

**Activity:** Train Provincial officers on data entry into the system by subject
**Programme:** Education Project Monitoring Information System(EPMIS)

| Category | KPI | Annual Target | Cumulative Target upto Current Month | Cumulative Progress upto Current Month | Progress % |
|---|---|---|---|---|---|
| Output | No. of Officers trained | 93 | 93 | 73 | 78.5 |

**Activity:** Preparation of Users' Guide
**Programme:** Capacity development program

| Category | KPI | Annual Target | Cumulative Target upto Current Month | Cumulative Progress upto Current Month | Progress % |
|---|---|---|---|---|---|
| Output | No. of Manuals Prepared | 1 | 1 | 0 | 0.0 |
| Process | Percentage Completed | 100 | 100 | 85 | 85.0 |

**Activity:** Printing of Users Guide in Sinhala ,Tamil& English
**Programme:** Capacity development program

| Category | KPI | Annual Target | Cumulative Target upto Current Month | Cumulative Progress upto Current Month | Progress % |
|---|---|---|---|---|---|
| Output | No. of Manuals Prepared | 1 | 1 | 0 | 0.0 |
| | No. of Copies distributed | 1000 | 500 | 0 | 0.0 |
| Finance | Expenditure R.M. | 0.8000 | 0.0000 | 0.0000 | N.A. |

**Activity:** Conduct capacity development programs for officers

# 08. වියදම් සාරාංශය

## 8.1 පුනරාවර්තන වියදම් සාරාංශය

2015 මුදල් වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 126 වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් ලෙස ප්‍රධාන වැඩසටහන් නවයක් යටතේ සංශෝධිත ඇස්තමේන්තුගත මුදල, පරිපූරක ඇස්තමේන්තු මත හා මාරු කිරීම් මත සංශෝධිත ප්‍රතිපාදන හා සමස්ත වියදම පහත වගුවෙන් දැක්වේ. මෙම වියදම් ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන, දීමනා සහ සේවා සඳහා වේ.

8.1. වගුව : **අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම්**

| ශීර්ෂය | වැඩසටහන | 2015 සංශෝධිත ඇස්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදන ( මාරුකිරීම් හා අතිරේක ප්‍රතිපාදන) FR 66 | 2015.12.31 දිනට වියදම |
|---|---|---|---|---|
| 126 - 1- 1 | අමාත්‍ය කාර්යාලය | 52.10 | 52.10 | 10.66 |
| 126 - 1- 2 | **පරිපාලන හා ආයතනික සේවා** | | | |
| | පාසල් පෝෂණ වැඩසටහන | 3,500.00 | 4,005.00 | 3,936.45 |
| | පාසල් නිල ඇඳුම් | 2,600.00 | 2,600.00 | 2,244.82 |
| | දුෂ්කර පාසල් සිසුන්ට සපත්තු | 600.00 | 300.00 | 291.39 |
| | පෙළපොත් | 3,900.00 | 3,900.00 | 3,898.75 |
| | කිරි වීදුරුවක් ලබා දීම | 335.35 | 130.35 | 127.64 |
| | 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර | 325.00 | 325.00 | 365.11 |
| | පිරිවෙන් සඳහා සිවුරු රෙදි | 84.00 | 84.00 | ---- |
| | ජාතික අධ්‍යාපන ආයතනය | 338.00 | 338.00 | 338.00 |
| | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 110.00 | 110.00 | 110.00 |
| 126 - 1- 11 | ආයතනික කාර්යයන් | 25.00 | 25.00 | 19.17 |
| 126 – 2-3 | ප්‍රාථමික අධ්‍යාපනය | 4,122.00 | 4,122.30 | 4,145.68 |
| 126 – 2-4 | ද්විතීයික අධ්‍යාපනය | 18,156.00 | 18,156.00 | 18,177.76 |
| 126 – 2-5 | විශේෂ අධ්‍යාපනය | 4,843.30 | 4,843.80 | 4,814.89 |
| 126 – 2-6-1 | ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන | 252.20 | 252.20 | 244.31 |
| 126 – 2-6-2 | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 960.40 | 960.40 | 143.54 |
| 126 – 2-8 | අධ්‍යාපනය සඳහා ප්‍රදාන හා ආධාර සංස්කෘතික ක්ෂේත්‍රයට අයත් ආයතන | 66.35 | 66.35 | 28.19 |
| | **මුළු එකතුව** | 40,269.70 | 40,270.50 | 38,896.36 |

**මූලාශ්‍රය : මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය**

ඒ අනුව 2015 වර්ෂයේ සමස්ත පුනරාවර්තන ඇස්තමේන්තුව රු.මිලියන 40,269වූ අතර වියදම රු.මි.38,896ක් විය.වියදමෙහි ප්‍රතිශතය 99% ක් විය.

## 8.2 ප්‍රාග්ධන වියදම් සාරාංශය

2015 වර්ෂයේ 126 වැය ශීර්ෂය යටතේ සංශෝධිත ඇස්තමේන්තුගත මුදල රු.මිලියන17,346ක් විය. මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් හා අතිරේක ප්‍රතිපාදන ලබාගැනීම්වලට අනුව ශුද්ධ ප්‍රතිපාදනය සම වූ අතර 2015.12.31 දිනට වියදම රු.මි. 15,536 ක් විය. වියදම් ප්‍රතිශතය 90% ක් පමණ විය.

**8.2.1 වගුව : අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම්**


| වැඩසටහන | 2015 සංශෝධිත ඇස්තමේන්තුව රු. මි. | මාරු කිරීම් හා අතිරේක ප්‍රතිපාදන | ශුද්ධ ප්‍රතිපාදන | 2015.12.31 දිනට වියදම |
|---|---|---|---|---|
| 126-1-1 අමාත්‍ය කාර්යාලය | 9.95 | +3.49 | 13.44 | 8.51 |
| **126-1-2 ආයතන හා පරිපාලන කටයුතු** | | | | |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා නඩත්තුව | 235.90 | - 3.49 | 232.40 | 123.85 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 1.31 | - | 1.31 | 1.12 |
| පාසල් පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය | 55.00 | - | 55.00 | 52.60 |
| දුෂ්කර පාසල් සඳහා ලී බඩු | 100.00 | - | 100.00 | 56.41 |
| ජාතික අධ්‍යාපන ආයතනය | 333.00 | - | 333.00 | 158.79 |
| **126-1-11 රාජ්‍ය අමාත්‍ය කාර්යාලය** | | | | |
| ප්‍රාග්ධන වත්කම් මිල දී ගැනීම් හා නඩත්තුව | 4.70 | -- | 4.70 | 2.15 |
| කාර්ය මණ්ඩල පුහුණුව | 0.30 | -- | 0.30 | - |
| **126-2-3 ප්‍රාථමික අධ්‍යාපනය** | | | | |
| ප්‍රාථමික පාසල් සංවර්ධනය | 111.80 | +20.00 | 131.80 | 110.02 |
| ආරක්ෂක සේවා විද්‍යාල | 40.00 | +100.00 | 140.00 | 55.75 |
| ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධනය | 79.95 | - | 79.95 | - |
| **126-2-3 ද්විතීයික අධ්‍යාපනය** | | | | |
| ද්විතීයික පාසල් සංවර්ධනය | 1542.00 | + 242.18 | 1784.18 | 1422.66 |
| ජීවන කුසලතාවක් ලෙස ඉංග්‍රීසි | 19.51 | - 19.51 | - | 6351.39 |
| ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය | 5978.10 | +422.27 | 6400.37 | 75.00 |
| දුෂ්කර පාසල්වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් | 78.00 | - | 78.00 | 22.37 |
| පළාත්, කලාප තොරතුරු තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන | 150.48 | -128.10 | 22.38 | 17.46 |
| ක්‍රීඩා පාසල් සංවර්ධනය | 25.00 | + 10.00 | 35.00 | 4821.85 |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන | 5180.00 | - 36.31 | 5143.68 | 4.04 |
| පාසල් පුස්තකාල සංවර්ධනය | 5.00 | - | 5.00 | - |
| **126-2-5 විශේෂ අධ්‍යාපනය** | | | | |
| විශේෂ අධ්‍යාපනය | 32.00 | +14.85 | 46.85 | 32.86 |
| පිරිවෙන් අධ්‍යාපනය | 296.00 | - 15.00 | 281.00 | 262.78 |
| ආබාධිත සිසුන්ගේ අධ්‍යාපනය | 3.00 | - | 3.00 | 2.88 |
| විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන | 20.00 | - 15.00 | 5.00 | 1.38 |
| විත්‍රා ලේන් විශේෂ පාසල | 10.00 | - 10.00 | - | - |
| **126-2-6 ගුරු අධ්‍යාපනය** | | | | |
| ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන | 95.43 | +3.71 | 99.14 | 70.83 |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | 852.00 | -223.10 | 628.90 | 506.70 |
| දකුණු ආසියානු ගුරු සංවර්ධන මධ්‍යස්ථානය | 385.00 | - 366.00 | 19.00 | 17.78 |
| පළාත්බද ගුරු පුහුණු වැඩසටහන | 25.00 | - | 25.00 | 20.38 |
| **126-2-7 සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධනය** | | | | |
| යුනෙස්කෝ ක්‍රියාකාරකම් | 4.69 | - | 4.69 | 4.34 |
| දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතිය (ADB) | 15.80 | +188.95 | 204.75 | 203.02 |
| TESP ව්‍යාපෘතිය (WB) | 1100.00 | - | 1100.00 | 864.89 |
| යුනිසෙෆ් වැඩසටහන් | 7.15 | - | 7.15 | 4.54 |
| සමාජ සංහිඳියාව සඳහා අධ්‍යාපනය (GIZ) | 160.00 | -76.66 | 83.34 | 42.35 |
| තාක්ෂණ ධාරාව සඳහා විද්‍යාපීඨය ඉදිකිරීම (KOICA) | 230.00 | -200.85 | 29.15 | - |
| අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (යුනිසෙෆ්) | 69.93 | - | 69.93 | 69.50 |
| පළාත් 9 සඳහා භාෂා විද්‍යාගාර (ඉන්දියානු ආධාර) | - | +88.56 | 88.56 | 88.56 |
| **126-2-7 සංස්කෘතික ක්ෂේත්‍රයේ ආයතන** | 50.62 | 0.58 | 51.21 | 31.77 |
| **එකතුව** | 17,346.61 | 0.58 | 17,347.20 | 15,536.39 |

මූලාශ්‍රය : විවිධ ගිණුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

## 8.3 සමස්ත අධ්‍යාපන වියදම

2006 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වසර 10 තුළ අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා සහ ආයතන විසින් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා දරන ලද වියදම පහත සටහනෙන් දක්වා ඇත.

**8.3.1 ප්‍රස්තාරය : අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා හා වෙනත් අමාත්‍යාංශ විසින් දරන ලද සමස්ත අධ්‍යාපන වියදම් 2006 - 2015**




මූලාශ්‍රය - අයවැය ඇස්තමේන්තු 2007 - 2016ට අනුව 2005 - 2014 සත්‍ය වියදම සහ 2015 ඇස්තමේන්තුගත වියදම මෙහි ඇතුළත් ය.

| | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් රු.බි. | 7.58 | 7.86 | 5.68 | 6.43 | 6.81 | 8.02 | 7.55 | 11.44 | 20.86 | 24.13 |
| පුනරාවර්තන වියදම් රු.බි. | 55.02 | 62.09 | 63.70 | 69.60 | 79.41 | 82.18 | 82.87 | 99.29 | 116.07 | 127.10 |
| එකතුව රු.බි. | **62.61** | **69.96** | **69.38** | **76.03** | **86.23** | **90.20** | **90.42** | **110.73** | **136.93** | **151.23** |

මූලාශ්‍රය - අයවැය ඇස්තමේන්තු 2007 - 2016 වාර්ෂික වාර්තාව - මුදල් අමාත්‍යාංශය 2014 * ඇස්තමේන්තුගත

# 8.4 ඉදිකිරීම් සඳහා ආයෝජනය - 2015

<table>
<tr><th colspan="3">පාසල් ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා සඳහා ප්‍රාග්ධන වියදම්<br>(රු.මි.)</th></tr>
<tr><th>වැඩසටහන</th><th>පාසල්/ආයතන සංඛ්‍යාව</th><th>2015-12-31 දිනට වියදම (රු .මි.)</th></tr>
<tr><td>ජාතික පාසල්වල ප්‍රාථමික අංශයේ අලුත්වැඩියා</td><td>8</td><td>13.50</td></tr>
<tr><td>ජාතික පාසල්වල ප්‍රාථමික අංශයේ නව ගොඩනැගිලි ඉදිකිරීම්</td><td>12</td><td>44.45</td></tr>
<tr><td>ජාතික පාසල්වල ද්විතීයික අංශයේ අලුත්වැඩියා</td><td>103</td><td>670.10</td></tr>
<tr><td>ජාතික පාසල්වල නව ගොඩනැගිලි</td><td>61</td><td>580.10</td></tr>
<tr><td>පාසල්වල ජල හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම</td><td>39</td><td>78.00</td></tr>
<tr><td>පාසල්වල විශේෂ අධ්‍යාපන ඒකක අලුත්වැඩියා කිරීම</td><td>36</td><td>12.28</td></tr>
<tr><td>විශේෂ අධ්‍යාපන ඒකක ඉදිකිරීම්</td><td>3</td><td>6.15</td></tr>
<tr><td>සීලමාතා ආරාම ඉදිකිරීම</td><td>3</td><td>12.65</td></tr>
<tr><td>ගුරු විද්‍යාල ගුරු මධ්‍යස්ථාන අලුත්වැඩියා</td><td>64</td><td>42.92</td></tr>
<tr><td>ගුරු විද්‍යාල ගුරු මධ්‍යස්ථානවල නව ඉදිකිරීම්</td><td>12</td><td>7.39</td></tr>
<tr><td>ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ අලුත්වැඩියා</td><td>19</td><td>346.60</td></tr>
<tr><td>ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල නව ඉදිකිරීම්</td><td>14</td><td>83.87</td></tr>
<tr><td>ද්විතීයික පාසල් 1000 අලුත්වැඩියා</td><td>22</td><td rowspan="3">1669.10</td></tr>
<tr><td>ද්විතීයික පාසල් 1000 තාක්ෂණ විද්‍යාගාර ඉදිකිරීම්</td><td>58</td></tr>
<tr><td>පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රදාන ලබා දීම</td><td>1160</td></tr>
<tr><td>පළාත් හා කලාප තොරතුරු මධ්‍යස්ථාන ඉදිකිරීම</td><td>13</td><td>21.92</td></tr>
<tr><td>ක්‍රීඩා පාසල්වල නවීකරණ කටයුතු</td><td>4</td><td>11.24</td></tr>
<tr><td>1AB තත්ත්වයට පාසල් උසස් කිරීම සඳහා නවීකරණ කටයුතු</td><td>21</td><td rowspan="2">3740.33</td></tr>
<tr><td>තාක්ෂණික විද්‍යාපීඨ ඉදිකිරීම්</td><td>237</td></tr>
<tr><td>විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම</td><td>1</td><td>1.38</td></tr>
<tr><td>ජාතික පාසල්වල හදිසි නවීකරණ කටයුතු</td><td>55</td><td>382.0</td></tr>
<tr><td>තාක්ෂණික විද්‍යාගාර ඉදිකිරීම් - ලෝක බැංකු</td><td>39</td><td>225.08</td></tr>
<tr><td>එකතුව</td><td></td><td>8292.46</td></tr>
</table>


## 8.5 ලී බඩු උපකරණ සඳහා ආයෝජනය –2015

| පාසල් ලී බඩු උපකරණ මිල දී ගැනීම් සඳහා ආයෝජනය - 2015 (රු.මි.) | | |
|---|---|---|
| වැඩසටහන | ප්‍රතිලාභ ලත් පාසල් සංඛ්‍යාව | වියදම |
| ජාතික පාසල් සඳහා පරිගණක | පාසල් 09 | 20.00 |
| ජාතික පාසල් උපකරණ අලුත්වැඩියා සඳහා ප්‍රතිපාදන ලබාදීම | පාසල් 350 | 12.40 |
| මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර සඳහා පරිගණක, විද්‍යා, ගණිත උපකරණ, මල්ටිමීඩියා හා ලී බඩු | පාසල් 1,000 | 2,494.20 |
| මහින්දෝදය තාක්ෂණ පීඨ සඳහා උපකරණ | පාසල් 251 | 26.10 |
| පිරිවෙන් සඳහා ලී බඩු හා උපකරණ | පිරිවෙන් 749 | 68.00 |
| ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා ලී බඩු | පාසල් 20 | 5.00 |
| ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා පරිගණක යන්ත්‍ර | පාසල් 25 | 4.60 |
| ජාතික පාසල්වල ප්‍රාථමික අංශ සඳහා විද්‍යා, ගණිත උපකරණ | පාසල් 197 | 1.90 |
| නොවිධිමත් අධ්‍යාපන ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන සඳහා මහන මැෂින්, පරිගණක | මධ්‍යස්ථාන 10 | 1.80 |
| විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙනුවෙන් ඇස් කණ්ණාඩි හා සවන් වහල් | | 4.00 |
| විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ලී බඩු හා උපකරණ | ඒකක 525 | 1.90 |
| **එකතුව** | | **2,639.90** |

# 09. ශිෂ්‍ය සාධනය

## 9.1 පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය


පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ දී ලකුණු 70ට වඩා ලබාගන්නා ශිෂ්‍ය ප්‍රතිශතය 2014 හා 2015 වර්ෂවල දී ඊට පෙර වර්ෂවලට සාපේක්ෂ ව ඉහළ ගොස් ඇත. ඒ අනුව මේ වන විට එම ප්‍රතිශතය 75% ඉක්මවා ඇත.





මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## 9.2 අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

6 – 11 ශ්‍රේණිවල අධ්‍යාපනයෙන් පසු ව ශිෂ්‍යයන් පෙනී සිටින ජාතික විභාගය වන අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී ශිෂ්‍යයින් පෙන්වා ඇති සාධනය පහත වගුවෙන් දැක්වේ. ඒ අනුව ශිෂ්‍යයින්ගෙන් 69.3% ක් අ.පො.ස. (උ.පෙළ) සඳහා සුදුසුකම් ලැබීමට 2015 වර්ෂයේ දී සමත් වූහ.




මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව




## 9.3 අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා 2015 වර්ෂයේ එක් එක් විෂයය ධාරාව සඳහා පෙනී සිටි සංඛ්‍යාව,පසුගිය වර්ෂ කිහිපය තුළ විශ්වවිද්‍යාල ප්‍රවේශ සුදුසුකම් ලැබූ සංඛ්‍යාව හා එහි ප්‍රතිශත මෙහි දැක්වේ.

**ඉදිරිපත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව හා විශ්වවිද්‍යාලයට ඇතුළුවීමට සුදුසුකම් සපුරාලූ සංඛ්‍යාව - 2015 (පාසල් අයදුම්කරුවන්)**

| විෂය ධාරාව | පෙනී සිටි සංඛ්‍යාව | සුදුසුකම් සපුරා ලූ සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| ජීව | 36,280 | 18,738 | 51.65 |
| භෞතික | 26,947 | 12,943 | 48.03 |
| වාණිජ | 53,333 | 37,538 | 70.38 |
| තාක්ෂණ | 12,543 | 6,786 | 55.37 |
| කලා | 79,036 | 54,259 | 68.65 |
| පොදු | 2,201 | 874 | 39.71 |
| එකතුව | 210,340 | 131,137 | 62.35 |




## 9.4 ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග

- පසුගිය විභාගවල ප්‍රතිඵල විශ්ලේෂණ බෙදාහැරීම මගින් ප්‍රතිඵල අඩු පාසල් හා කලාප මට්ටමින් ප්‍රතිකාර්ය වැඩසටහනක් පැවැත්වීමට සියලු පාර්ශ්ව දිරිමත් කිරීම
- විභාග පෙරහුරු පරීක්ෂණ පැවැත්වීම
- පසුගිය ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර සහ සීඩී ලෙස සකස් කර පහසුවෙන් ලබා ගැනීමට සැලැස්වීම
- ශිෂ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම
- මාධ්‍ය ඔස්සේ වැඩසටහන් ප්‍රචාරය කිරීම
- අන්තර්ජාලය තුළින් ඉගෙනුම් සම්පත් සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීම
- විභාග ප්‍රතිඵල අයිතම විශ්ලේෂණය එළිදැක්වීම මගින් දුර්වල විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කර ඉගැන්වීමට පෙළඹවීම

# 10. සංස්කෘතික අංශයට අයත් ආයතන

## 10.1 ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

**ඉදිරි දැක්ම**

සාරධර්ම පිරි සමාජයක් ගොඩනැගීම සඳහා සමාජ වගකීමකින් යුක්ත ව යහපත් කලාවකට ඉඩදෙමින් ප්‍රසිද්ධ රඟදැක්වීම් උචිත අයුරින් තුළනාත්මක ව පාලනය කිරීම.

**මෙහෙවර**

චිත්‍රපට නාට්‍ය හෝ සංදර්ශන සඳහා පරීක්ෂා කිරීම කඩිනමින් නිමකර ඒ සඳහා යෝග්‍යතා සහතික ලබා දීම සහ උක්ත කර්මාන්තයන්හි අභිවෘද්ධිය සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම

**අරමුණ**

යහපත් සදාචාරවත් සමාජයක් ගොඩනැගීම සඳහා කලාව සහ සමාජ වගකීම යන තේමාවට අනුකූල ව මහජන ප්‍රදර්ශනය සඳහා සංදර්ශන හා කලා නිර්මාණ ඉදිරිපත් කිරීමට අනුබල දීම සහ ඒ සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

**ප්‍රධාන කාර්යයන්**

වර්තමානය වන විට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් සීමිත වපසරියකට යටත් ව ඇත. ඒ අනුව ලාංකික සමාජයට බලපාන ප්‍රසිද්ධ රඟ දැක්වීම් සම්බන්ධයෙන් දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියලු ම මහජන සංදර්ශන යන විෂය පථ දක්වා ඇත. එහි දී උක්ත විෂය පථ ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කරනු ඇත. ඒ අනුව ප්‍රසිද්ධ රැගුම් පාලක මණ්ඩලය මඟින් සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂාකර බලා අනුමත කිරීම හා ප්‍රතික්ෂේප කිරීම හෝ වර්ගීකරණයට ලක් කිරීම සහ සංශෝධනය සඳහා නිර්දේශ කිරීම යනාදි කරුණු වත්මන් ප්‍රධාන කාර්යයන් ලෙස දක්වනු ලැබේ.

**2015 වර්ෂයට අදාළ ව**

- දේශීය චිත්‍රපට, නාට්‍ය සහ සියලු ම මහජන සංදර්ශන යන විෂයය පථ, ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල පනත යටතේ මහජන ප්‍රදර්ශනය සඳහා සුදුසු ද යන්න දැක්ම අනුව විමර්ශනය කර සුදුසු පරිදි හා අවශ්‍ය අවස්ථාවල දී පරීක්ෂාකර බලා අනුමත කිරීම හා ප්‍රතික්ෂේප කිරීම හෝ වර්ගීකරණයට ලක් කිරීම සහ සංශෝධන සඳහා නිර්දේශ කිරීම
- ආයතනයට ලබාගත් මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් මඟින්, DVD චිත්‍රපට ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩල පරිශ්‍රයේ කුඩා සිනමා ශාලාවේ සිට නැරඹීම සඳහා අවස්ථාව සලසන ලදි
- සිනමා ශාලා ගාස්තු සහ මුදල් අය කිරීම සම්බන්ධ නව ගැසට් බලපත්‍රය අලුතින් නිකුත් වූ අතර, එයට අනුව බලපත්‍ර ගාස්තු අයකර ගැනීම

## 10.2 ජනකලා කේන්ද්‍රය

ආයතනයේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ ජන කලා පිළිබඳ ව මහජනතාව තුළ වඩාත් හොඳ දැනුමක් ඇති කිරීම පිණිස තරුණ පරපුර වෙත කලා රසිකත්වය හා දැනුම රැගෙන යාම

පාරම්පරික ශිල්ප ක්‍රම හඳුන්වා දීම මගින් යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම පිණිස සහාය ලබා දීම.
ජනකලා හා උරුම සංචාරක ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම.

පාඨමාලා ප්‍රගතිය

| පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | විෂය නිර්දේශ ආවරණය ප්‍රගතිය |
|---|---|---|
| නර්තනය | 31 | 90% |
| සංගීතය | 19 | 95% |
| චිත්‍ර | 22 | 90% |

## 10.3 ශ්‍රී ලංකා කලා මණ්ඩලය

**දැක්ම**

"නිර්මාණාත්මක චින්තනයේ හා කලාත්මක කුසලතා ආනුභාවයෙන් ජනයා ආනන්දයෙන් ප්‍රඥාව කරා මෙහෙයවීම"

**මෙහෙවර ප්‍රකාශය**

"නිර්මාණාත්මක චින්තනයෙන් කලා කුසලතා ඔප්නංවමින් විවිධත්වය තුළ විචිත්‍රත්වයෙන් යුතු ඒකීයතාවයක් ගොඩනැගීම."

1952 අංක 18 දරණ පාර්ලිමේන්තු පනතින් ශ්‍රී ලංකා කලා මණ්ඩලය ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා කලා මණ්ඩලය යටතේ ප්‍රධාන කලා විෂයයන් අරමුණු කර ගනිමින් එකී විෂයයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමණ්ඩල හයක් ක්‍රියාත්මක විය.

1. රාජ්‍ය සාහිත්‍ය අනුමණ්ඩලය
2. රාජ්‍ය නාට්‍ය අනුමණ්ඩලය
3. රාජ්‍ය සංගීත අනුමණ්ඩලය
4. රාජ්‍ය දෘශ්‍ය කලා අනුමණ්ඩලය
5. රාජ්‍ය නර්තන අනුමණ්ඩලය
6. රාජ්‍ය අංගම් ශිල්ප කලා අනුමණ්ඩලය

**ප්‍රධාන කාර්යයන්**

1. කලා කටයුතු ප්‍රවර්ධනය, සංවර්ධනය හා සංරක්ෂණය සඳහා අවශ්‍ය අනුමණ්ඩල පත් කොට ඒවාට නායකත්වය සැපයීම හා මඟ පෙන්වීම.
2. සාහිත්‍ය, නාට්‍ය, සංගීත, දෘශ්‍ය කලා, නර්තන, අංගම් ශිල්ප අනුමණ්ඩල මඟින් දීප ව්‍යාප්තව විෂයානුබද්ධව වැඩසටහන් සංවිධානය කිරීම.
3. ශිල්පීන් ජාතික මට්ටමේ ඇගයීම්වලට ලක් කිරීම හා ඔවුන් ජාත්‍යන්තර තලයට හඳුන්වා දීම මඟින් නියමිත ක්ෂෙත්‍රයන් තුළ ඉහළ පිළිගැනීමක් ඇති කිරීම.
4. ලලිත කලාවන්හි තත්වය වැඩි දියුණු කිරීම.
5. ශ්‍රී ලංකාවට ආවේණික කලා ශිල්ප, කර්මාන්ත නඟා සිටුවීම.
6. කලා කටයුතු සඳහා සම්බන්ධිත වෙනත් දෙපාර්තමේන්තු, ආයතන ස්වේච්ඡා සංවිධාන සමඟ සම්බන්ධවී කටයුතු කිරීම.
7. සාරධර්මවලින් පිරි සමාජයක් බිහි කිරීම සඳහා සුදුසු සංස්කෘතික පරිසරයක් ගොඩනැගීම.

**2015 වසර සඳහා වෙන් වූ ප්‍රතිපාදන හා 2015.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය**

| වියදම | 2015 සඳහා වෙන් වූ ප්‍රතිපාදන රු.මි. | 2015.06.30 දිනට කලා මණ්ඩලයට ලැබුණු ප්‍රතිපාදන රු.මි. |
|---|---|---|
| වියදම (පුනරාවර්තන) | 12.0 | 8.0 |

- කලාකරු සුභසාධන වැඩසටහන්
    - මාතලේ දිස්ත්‍රික් කලාකරු සංචිතය පිහිටුවීම.
- රසවින්දනාත්මක වැඩමුළු පැවැත්වීම
    - නිලාන් මලිගැස්පෙ මහතාගේ කලායතනයේ 21වන සංවත්සරය වෙනුවෙන් රඟ දැක්වෙන නාට්‍ය දර්ශනය සඳහා පරිත්‍යාග මුදලක් ලබා දීම.
    - සංස්කෘතික සායන ආරම්භ කිරීම යටතේ මහනුවර ගුරුදෙණිය සම්පත් මධ්‍යස්ථානයේ ප්‍රථම සංස්කෘතික වැඩසටහන ආරම්භ කිරීම.
    - පොල්පිතිගම, නා උල, හාරිස්පත්තුව, මහව, මාතර කඩවත් සතර යන ප්‍රාදේශීය ලේකම් කාර්යලවල සහ අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යලයේ ප්‍රාදේශීය සාහිත්‍ය උළෙලවල් සාර්ථක කර ගැනීම සඳහා සම්පත්දායකයින් ලබාදීම හා අවශ්‍ය සියලු කටයුතු සඳහා සහය ලබාදීම.
    - ගිටාර්වාදන ශිල්පීන්ගේ උත්සවය සඳහා රු.50,000කින් අනුග්‍රාහකත්වය ලබාදීම.
- නිර්මාණ ශිල්පීන් ඇගයීම හා සම්මානයට පාත්‍ර කිරීම.
    - වාර්ෂිකව පැවැත්වෙන රාජ්‍ය නාට්‍ය උළෙලේ නාට්‍ය කීර්ති සම්මානය සඳහා රු.100,000කමුදල් පරිත්‍යාගයක් ලබා දීම.
- වැඩමුළු හා අධ්‍යාපනික වැඩසටහන්
    - උතුරේ සහ දකුණේ සමස්ත කලාවන්ගේ අභිවර්ධනය මඟින් සමාජ සංහිඳියාව ඇති කිරීම සඳහා යාපනය හා මඩකලපුවේ ඓතිහාසික උරුමයන් වූ කූත්තු නාට්‍ය සංදර්ශනයක් ඒ පිළිබඳ සවිස්තර දේශනයක් සෞන්දර්යය කලා විශ්ව විද්‍යාලය හා සම්බන්ධව පැවැත්වීමට කටයුතු සම්පාදනය කිරීම.
    - කන්ද උඩරට වතුකරයේ ජනතාව සහ ප්‍රධාන ජනවර්ගයන් අතර අන්‍යොන්‍ය අවබෝධයක් ඇති කිරීම උදෙසා ඔවුන්ගේ සංස්කෘතිය නිරූපණය වන ද්‍රවිඩ ජන ගී ප්‍රසංගයක් හා ඒවා ගැන විශ්ලේෂණයක් ඇති කිරීමට කටයුතු සම්පාදනය කිරීම.
    - සෑම දිස්ත්‍රික්කයක් පාසාම කලා නිර්මාණ පර්ෂද පිහිටුවීමෙන් රසඥතාව වර්ධනය කිරීම මෙන්ම අංකුර කලාශිල්පීන්ගේ ප්‍රතිභාව හා නිර්මාණ හැකියාවන් මතුකරලීමට කටයුතු කිරීම.
    - ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා සම්භාව්‍ය හා ජනකලා නිර්මාණ රසාස්වාදය නමින් වැඩසටහන් මාලාවක් සංවිධානය කිරීම.

# ඇමුණුම්

# ඇමුණුම 1

# 2015 වසරේ චක්‍රලේඛ

| දිනය | චක්‍රලේඛ අංකය | විෂය හා යොමුව |
|---|---|---|
| 2015-12-31 | 35/2015 | පාසල් තුළ සෞඛ්‍යාරක්ෂිත ආපනශාලා පවත්වාගෙන යාම |
| 2015-12-29 | 33/2015 | ප්‍රබුද්ධ පාඨක සම්මාන ප්‍රදානය සඳහා නාම යෝජනා කැඳවීම - 2016 – "කියවන්න පොත් දෙන්න - පියඹන්න තටු දෙන්න" |
| 2015-12-29 | 34/2015 | පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම |
| 2015-12-22 | 32/2015 | අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (2015 - 2016) අධ්‍යාපන අමාත්‍යාංශය |
| 2015-11-27 | 28/2015 | සමස්ත ලංකා පාසල් ළමා චිත්‍ර තරගය හා ප්‍රදර්ශනය - 2016 |
| 2015-11-26 | 26/2015 | පාසල් සිසුන් සඳහා පාසල් නිල ඇඳුම් වෙනුවෙන් තිළිණපත් ලබා දීම |
| 2015-11-20 | 27/2015 | සමස්ත ලංකා පාසල් නර්තන තරගය - 2016 |
| 2015-09-17 | 2015/22 | පාසල් වාරසටහන - 2016 |
| 2015-06-30 | 23/2013 (ii) | පාසල්වල පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම |
| 2015-06-09 | 18/2015 | ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ (ජාතික පාසල්) ස්ථාන මාරු පටිපාටිය 2016 |
| 2015-03-26 | 12/2015 | පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්ය මණ්ඩලය නිර්ණය කිරීම |
| 2015-03-23 | 14/2015 | සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය හා ටවර් හෝල් රඟහල පදනම ඒකාබද්ධව මෙහෙයවනු ලබන සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය - 2015 |
| 2015-01-29 | 05/2015 | පාසල්වල අවිධිමත් ලෙස මුදල් අයකිරීම තහනම් කිරීම |

# ඇමුණුම 2 : අධ්‍යාපන අමාත්‍යාංශයේ ශාඛා, ඒකක හා නිලධාරීන් 2015.12.31 දිනට

## සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය

| | |
|---|---|
| අතිරේක ලේකම් | - එස්.යූ. විජේරත්න මයා |
| **ප්‍රතිපත්ති හා සැලසුම් ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ආචාර්ය එම්.එම්. වෙහැල්ල මිය |
| **දත්ත කළමනාකරණ හා පර්යේෂණ ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ආර්.එච්.එන්.නන්දසිරි මයා |
| **සැමට අධ්‍යාපන සහ සහශ්‍ර සංවර්ධන ඉලක්ක ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - බී.පී. විතානගේ මිය |
| **පර්යේෂණ හා සංවර්ධන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - සී.එම්.පී.ජේ. තිලකරත්න මිය |
| **නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ලලනි එන්. විජේසේකර මිය |
| **සංඛ්‍යාලේඛන ශාඛාව** | |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | - වීරවර්ණ මයා |
| **නීති ඒකකය** | |
| නීති නිලධාරී | - සුරංගි පෙරේරා මෙය |
| **අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශන මණ්ඩලය** | |
| ලේකම් | - විජිත වෙලගෙදර මයා |
| **කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එස්.එම්.එල්.කේ. සෙනවිරත්න මිය |
| **පෞද්ගලික පාසල් ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - පී.එම්. සලාහුදීන් මයා |

## පාසල් කටයුතු අංශය

| | |
|---|---|
| අතිරේක ලේකම් | - ඒ.එස්. හේවගේ මයා |
| **මානව සම්පත් සංවර්ධන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - පුෂ්පා විජේසූරිය මිය |
| **විදේශ ආයතන හා විදේශ කටයුතු ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එල්.ටී. ලාල් පද්මසිරි මයා |
| **දෙමළ පාසල් ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එස්. මුරලිදරන් මයා |
| **මුස්ලිම් පාසල් සංවර්ධන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ඉසෙඩ්. තාජුඩීන් මයා |
| **නව ආදර්ශ ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය** | |
| ව්‍යාපාති අධ්‍යක්ෂ | - එල්.ආර්.වී. ගුණරත්න මයා |
| **කෘෂිකර්ම හා පරිසර අධ්‍යයන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - බී.එල්.ඩී. බාලසූරිය මෙය |
| **විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන සහ සාම අධ්‍යාපන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - වයි.ඒ.එන්.ඩී. යාපා මයා |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - ජී.එම්. නීල් ගුණදාස මයා |
| **නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එච්.පී.එන්. ලක්ෂ්මන් මයා |
| **වතු පාසල් සංවර්ධන ශාඛාව** | |
| අධ්‍යාපන අධ්‍යක්ෂ | - එම්. සහාරංජන් මිය |

**ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පී.එම්.ඒ.එස්. පණ්ඩිතසේකර මිය

**සෞඛ්‍ය, ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - වී.උපාලි අමරතුංග මයා

**තාක්ෂණ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.ඩී. නන්දසේන මයා

**ද්විතීයික පාසල් සංවර්ධනය වැඩසටහන**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඒ.එස්.හේවගේ මයා

## අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන අංශය

අතිරේක ලේකම් - එච්.යූ. ප්‍රේමතිලක මයා

ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - එම්. එල්. ඩී. ධර්මසේන මයා

**පිරිවෙන් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පුරප්පාඩුව පැවතිණි.

**අධ්‍යාපන සංවර්ධන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පී.එන්. අයිලප්පෙරුම මයා

**සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.පී.එන්.ටී. ගුණතිලක මයා

**ද්විභාෂා අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රියතා නානායක්කාර මිය

**වාණිජ අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්. කමනි පෙරේරා මිය

**ඉංග්‍රීසි හා විදේශ භාෂා ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.එම්. වීරසූරිය මිය

**ගණිත ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - බී.ඩී.සී. බියන්විල මයා

**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ආර්.එම්.එම්.රත්නායක මයා

**ජාතික පාසල් ශාඛාව හා ගුරු මාරු ඒකකය**
අධ්‍යාපන අධ්‍යක්ෂ - පී. එන්. අයිලප්පෙරුම මයා

**ආගමික හා සාරධර්ම ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එස්.බී.එම්. නිමල් ධර්මසිරි මයා

**විද්‍යා ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.පී. විපුලසේන මයා

**පාසල් කටයුතු ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩබ්.කේ.ඩබ්. විජේතුංග මයා

**ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - එම්.එෆ්.එන් හරීජා මිය

## අධ්‍යාපන සේවා ආයතන අංශය
අතිරේක ලේකම් - අයි.එම්. කේ.බී.ඉලංගසිංහ මයා

**විදුහල්පති, ගුරු අධ්‍යාපන හා අධ්‍යාපන සේවා ආයතන**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - තුෂාරා පතිරණගේ මිය

**ගුරු ආයතන**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - මහේෂිකා කොඩිප්පිලිආරච්චි මෙය

## ප්‍රසම්පාදන ඉදිකිරීම් හා පාසල් සැපයීම් අංශය

අතිරේක ලේකම් - එස්.පී. ජයතුංග මිය

අතිරේක ලේකම් - එල්.ඒ.අසෝක සිරිවර්ධන මයා

**ප්‍රසම්පාදන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - දීප්තිකා ගුණරත්න මිය

**පාසල් ගොඩනැගිලි ශාඛාව**
අධ්‍යක්ෂ - ආචාර්ය වයි. අබේසුන්දර මයා

**පාසල් සැපයීම් ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - අයි.එම්.කේ.බී. ඉලංගසිංහ මයා

**ගොඩනැගිලි කළමනාකරණ ශාඛාව**
ගොඩනැගිලි කළමනාකරු - කමල් අතුකෝරාළ මයා

## පාලන අංශය

අතිරේක ලේකම් - **ජී.එල්.එස්.සේනාධීර මයා**

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවා නොවන, විනය සහ විමර්ශන)**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - එච්.ඒ. හේමා පෙරේරා මිය

**ආයතන හා පරිපාලන (ඒකාබද්ධ සේවය) සහ ඉඩම් ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - ආර්.බී. ගන්කේවල මිය

**පාර්ලිමේන්තු කටයුතු සහ ප්‍රවාහන ශාඛාව**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් - එන්.එස්. අතුකෝරළ මිය

**විශේෂ විමර්ශන ශාඛාව**
අධ්‍යාපන අධ්‍යක්ෂ - ඩී.එස්.එන්. ජයතුංග මිය

## විගණන අංශය

**රජයේ විගණන ශාඛාව**
විගණන අධිකාරි - ඩබ්.එම්. රම්‍යා ලාලනි මිය

**අභ්‍යන්තර විගණන ශාඛාව**
ප්‍රධාන අභ්‍යන්තර විගණක - ඒ.ඒ.ටී.කේ. අධිකාරි මිය

## මුදල් අංශය

## ප්‍රධාන මූල්‍ය නිලධාරී - චිත්‍රානි ප්‍රනාන්දු මිය

ප්‍රධාන ගණකාධිකාරී - එස්.පී.එන්. සමරසිංහ මිය

**මුදල් ශාඛාව**
ගණකාධිකාරී - දුනිල් හෙයියන්තුඩුව මයා

**විවිධ ගිණුම් ශාඛාව**
ගණකාධිකාරී - ජේ.කේ.එස්.එන්. පෙරේරා මයා

**ගෙවීම් ශාඛාව**
ගණකාධිකාරී - එම්.එච්.ඩබ්. නන්දනී ද අල්විස් මිය

**විශ්‍රාම වැටුප් ශාඛාව**
ගණකාධිකාරී - පී.ජී.සී. කුමාරි මිය

**සැපයීම් ශාඛාව**
ගණකාධිකාරී - පී.ජී.සී. කුමාරි මිය

**ජාතික මෙහෙයුම් මැදිරිය**
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - ප්‍රසාද් වීරසිරි මයා

## විදේශාධාර සම්බන්ධීකරණය

**අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP)**
වැඩසටහන් ප්‍රධානී - ආර් කරුණාසිරි මයා

**ජර්මන් සහයෝගීතා සංවර්ධන ව්‍යාපෘතිය (GIZ)**
ජාතික සම්බන්ධීකාරක - එස්. මුරලිදරන් මයා

**යුනෙස්කෝ ජාතික කොමිසම**
ලේකම් ජනරාල් - ධම්මිකා විජයසිංහ මෙවි